අයවැය 2021: මූල්‍ය, මුදල් හා ආර්ථික උපකල්පනයන් තක්සේරුව සහ රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන් සමග දිශාගත වීම පිළිබඳ විශ්ලේෂණය

i. හැඳින්වීම

යෝජිත අයවැය ශ්‍රී ලංකා රජයේ (GOSL) ජාතික **ප්‍ර**තිපත්ති රාමුව සමග දිශාගතව තිබෙදැයි තක්සේරු කොට වාර්තාවක් ඉදිරිපත් කිරීමේ කාර්යය රජයේ මුදල් පිළිබඳ කාරක සභාව (COPF) වෙත පැවරී තිබේ. මෙම වාර්තාව රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ එම ප්‍රයත්නයට දායක වෙයි. මෙම තක්සේරුව (අ) 2020 ඔක්තෝබර් 20 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද 2020 හා 2021 මුදල් වර්ෂ සඳහා වූ විසර්ජන පනත් කෙටුම්පත, (ආ) 2021 නොවැම්බර් 17 වැනි දින පාර්ලිමේන්තුව ඉදිරිපත් කරන ලද අයවැය කථාව, (ඇ) මූල්‍ය කළමනාකරණ වාර්තාව (FMR) 2020-2021, (ඈ) අයවැය 2021 විශේෂ අංග (ඉ) මුදල් අමාත්‍යාංශය (MOF) විසින් රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලද 2021 අයවැයෙහි ආදායම් පිළිබඳ ඇස්තමේන්තු, සහ (ඊ) මුදල් අමාත්‍යාංශය හා රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරිත්ව හා ආර්ථික වර්ගීකරණය මගින් සමාහාර කරන ලද දත්ත යන මේවා තුළ දී ඇති 2021 වර්ෂය සඳහා වූ අයවැය යෝජනා මත පදනම් වී ඇත.

මෙම කණ්ඩායම ඉහත කාර්යය කිරීමේදී අභියෝග කිහිපයකටම මුහුණ දුන් අතර ඒවාට: (අ) විශ්ලේෂණයේ පහසුව සඳහා මෘදු පිටපතකින් තොරතුරු නොතිබීම, (ආ) ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්ති එකිනෙක ප්‍රමුඛතාවයන් සඳහා ප්‍රතිපාදනය කෙරෙන ආකාරය පිළිබඳ විස්තර නොමැති වීම, (ඇ) පාර්ලිමේන්තුව වෙත සපයන ලද කෙටුම්පත් අයවැය ඇස්තමේන්තු හා අයවැය කථාව තුළ දී ඇති අයවැය ඇස්තමේන්තු අතර නොසීහුම්, (ඈ) සම්මත ආංශික වර්ගීකරණ භාවිතා කෙරෙන අයවැය ඇස්තමේන්තු නොමැතිකම හා එමගින් කාලය ඔස්සේ ප්‍රවණතා විශ්ලේෂණය කිරීම දුෂ්කර වීම සහ (ඉ) අමාත්‍යාංශ විෂය පථ අනුව අයවැය ඇස්තමේන්තු සම්පාදනය කර තිබීම ඇතුළත් ය. අමාත්‍යාංශ නිති වෙනස් කිරීම හේතුවෙන් වර්ෂ හරහා සන්සන්දනය කිරීම හා දළ දේශීය නිෂ්පාදිතයේ කොටසක් වශයෙන් හඳුනා ගැනීම වඩාත් අභියෝගාත්මක දෙයක් බවට පත් වුණි.

මෙම විශ්ලේෂණයේ පදනම සඳහා අයවැය සාරාංශ ඇස්තමේන්තු මත පදනම්ව වෙළඳපල මිල ගණන් අනුව 2021 සඳහා වූ දළ දේශීය නිෂ්පාදිතය (GDP) රුපියල් බිලියන 17,643 ක්ද, 2020 සඳහා එය රුපියල් බිලියන 15,960 ක් වශයෙන්ද උපකල්පනය කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන් ඔස්සේ සමස්ත වැය යෝජනා බෙදී ගොස් ඇති ආකාරය

අයවැය කථාව තුළ හා විසර්ජන පනත් කෙටුම්පතෙහි අයවැය ප්‍රතිපාදන තුළ දක්වා ඇති වැය යෝජනා විවිධ ප්‍රතිපත්ති සිසාරා බෙදී ගොස් ඇති ආකාරය පහත වගුවලින් දැක්වේ. i.1 රූපයෙන් සාරාංශ දසුනක් ඉදිරිපත් කෙරේ.

i.1 වගුව: ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන් ඔස්සේ සමස්ත වැය යෝජනා බෙදී ගොස් ඇති ආකාරය

ජාතික ප්‍රතිපත්ති රාමුව	රුපියල් මිලියන	බෙදී යාමේ ප්‍රතිශතය (%)
1. ජාතික ආරක්ෂාව කෙරෙහි ප්‍රමුඛත්වය	23,250	12.75
2. මිත්‍රශීලී, නොබැඳි විදේශ ප්‍රතිපත්තිය	750	0.41
3. දූෂණයෙන් තොර පරිපාලනය	20,000	10.97
4. ජනතා පැතුම් ඉටු කරන නව ව්‍යවස්ථාව	0	0.00
5. ඵලවත් පුරවැසියෝ සහ ජවසම්පන්න මානව සම්පත	59,500	32.63
6. ජනතා- කේන්ද්‍රික ආර්ථික සංවර්ධනය	9,350	5.13
7. තාක්ෂණය-පාදක සමාජය	18,000	9.87
8. භෞතික සම්පත් සංවර්ධනය	41,950	23.01
9. තිරසාර පරිසර කළමනාකරණය	9,500	5.21
10. විනය-ගරුක, නීති-ගරුක හා සාරධර්ම සපිරි සමාජය	50	0.03
එකතුව	182,350	100.0

මූලාශ්‍රය: ප්‍ර.අ.ආ. ගණනය කිරීම් අයවැය කථාවේ (3 ඇමුණුම) වැය යෝජනා මත පදනම් වී ඇත.
සටහන: 1 ඇමුණුමෙන් විවිධ ප්‍රතිපත්ති ප්‍රමුඛත්වයන් සඳහා වැය යෝජනා වෙන් කිරීමේදී කෙරුණු උපකල්පනයන් දැක්වේ.

i.2 වගුව: විසර්ජන පනත තුළ ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන් ඔස්සේ ප්‍රතිපාදන බෙදී යාම

	රුපියල් බිලියන	බෙදී යාමේ ප්‍රතිශතය (%)	2021 දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස (%)
1. ජාතික ආරක්ෂාව කෙරෙහි ප්‍රමුඛත්වය	507.63	18.5	2.9
2. මිත්‍රශීලී, නොබැඳි විදේශ ප්‍රතිපත්තිය	13.01	0.5	0.1
3. දූෂණයෙන් තොර පරිපාලනය	855.51	31.2	4.8
4. ජනතා පැතුම් ඉටු කරන නව ව්‍යවස්ථාව			0.0
5. ඵලවත් පුරවැසියෝ සහ ජවසම්පන්න මානව සම්පත	498.02	18.2	2.8
6. ජනතා- කේන්ද්‍රික ආර්ථික සංවර්ධනය	189.29	6.9	1.1
7. තාක්ෂණය-පාදක සමාජය			0.0
8. භෞතික සම්පත් සංවර්ධනය	623.51	22.8	3.5
9. තිරසාර පරිසර කළමනාකරණය	9.35	0.3	0.1
10. විනය-ගරුක, නීති-ගරුක හා සාරධර්ම සපිරි සමාජය	42.88	1.6	0.2
එකතුව	2,739.20	100.0	15.5

මූලාශ්‍රය: ප්‍ර.අ.ආ. ගණනය කිරීම් 2021 මුදල් වර්ෂය සඳහා වූ විසර්ජන පනත්කෙටුම්පතෙහි ප්‍රතිපාදන මත පදනම් වී ඇත.
සටහන:- 2 ඇමුණුමෙන් විවිධ ප්‍රතිපත්ති ප්‍රමුඛත්වයන් සඳහා වැය යෝජනා වෙන් කිරීමේදී කෙරුණු උපකල්පනයන් දැක්වේ. 2021 අයවැය කථාව පදනම් කර ගෙන 2021 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතය (GDP) රුපියල් බිලියන 17,643 ක් ලෙස අනුමාන කර ඇත.

ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන් ඔස්සේ වැය යෝජනා බෙදී ගොස් ඇත්තේ අසම ලෙස ය. 2021 දැඩි අවපාතයෙන් යථා තත්ත්වයට පත් වෙමින් තිබෙන තත්ත්වයක් තුළ, සාමාජීය ක්ෂේත්‍රය හා රාජ්‍ය ආයෝජන කෙරෙහි අවධාරණය කිරීම යහපත් යැයි කිව හැක්කේ විශේෂයෙන්ම භෞතික සම්පත් සංවර්ධනය කිරීම සඳහා වූ රාජ්‍ය ආයෝජනයන් රැකියා ඇති කිරීම කෙරෙහි යොමු වූ වැයක් වන්නේ නම් ය. ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛත්වයන් සිසාරා සමස්ත අයවැය ප්‍රතිපාදනය පිළිබඳ නිරීක්ෂණ 3 වගුවෙහි විස්තර කර ඇත. තාක්ෂණය පදනම් වූ සමාජයක් සංවර්ධනය කිරීම ශ්‍රී ලංකා රජයේ මූලික ප්‍රතිපත්ති ප්‍රමුඛතාවක් වුවත්, මෙම අයවැය මාර්ගය සඳහා විසර්ජන පනත් කෙටුම්පත තුළ කිසිදු ප්‍රතිපාදනයක් දී නොමැත.[1]

i.1 රූපසටහන: - ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා අනුව අයවැය බෙදී යාම



[1] 2020 නොවැම්බර් 20 වන දින නිකුත් කරන ලද ගැසට් නිවේදනය මගින් නව තාක්ෂණවේද අමාත්‍යාංශයක් ඇති කිරීමත් සමගම මෙය නිවැරදි වීමට ඉඩ තිබේ.

Priority to national security = ජාතික ආරක්ෂාව කෙරෙහි ප්‍රමුඛතාව * Friendly, non-aligned, foreign policy = මිත්‍රශීලී, නොබැඳි විදේශ ප්‍රතිපත්තිය * An administration free from corruption = දූෂණයෙන් තොර පරිපාලනය * New Constitution that fulfills the people's wishes = ජනතා පැතුම් ඉටු කරන නව ව්‍යවස්ථාව * Productive citizenry and a vibrant human resource = ඵලවත් පුරවැසියෝ සහ ජවසම්පන්න මානව සම්පත * People centric economic development = ජනතා- කේන්ද්‍රික ආර්ථික සංවර්ධනය * Technology based society = තාක්ෂණය-පාදක සමාජය * Development of physical resources = භෞතික සම්පත් සංවර්ධනය * Sustainable environmental management = තිරසාර පරිසර කළමනාකරණය * Disciplined, law abiding and values-based society = විනය-ගරුක, නීති-ගරුක හා සාරධර්ම සහිත සමාජය
මූලාශ්‍රය:- 2021 අයවැය කථාව හා 2021 වර්ෂය සඳහා වූ විසර්ජන පනත්කෙටුම්පත පදනම් කර ගත් ප්‍ර.අ.ආ. සංහිතාව

1. 2021 අයවැයෙහි මූල්‍ය, මුදල් හා ආර්ථික උපකල්පනයන් පිළිබඳ තක්සේරුව

කොවිඩ්-19 වසංගතය විසින් ඇති කරන ලද අසාමාන්‍ය අවිනිශ්චිත තත්ත්වයන් යටතේ 2021 අයවැය පිළියෙළ කර ඇත. කොවිඩ්-19 අබණ්ඩව ජීවිතවලට හා ජීවනෝපායන්ට සැලකිය යුතු තර්ජනයක්ව පවතින බව හා ආර්ථිකය කෙරෙහි එහි විනාශකාරී බලපෑම් මගින් අන් ඒවාද අතර ආර්ථික ප්‍රතිදානය, ආදායම් එකතු කර ගැනීම, රාජ්‍ය වැය, පුද්ගල ආදායම් හා රැකියා නියුක්තිය යන මේවා මත විශාල ඵලවිපාක ඇති කරනු ඇති බව පැහැදිලිවම පෙනෙන්නට තිබේ.

1.1 සාර්ව-ආර්ථික උපකල්පන

අයවැය පිළියෙළ කිරීමෙහිලා යොදා ගනු ලැබූ මුඛ්‍ය සාර්ව-ආර්ථික උපකල්පනයන් 1.1 වගුවෙහි දක්වා ඇත.

1.1 වගුව:- 2021 අයවැය ආශ්‍රිත මුඛ්‍ය සාර්ව-ආර්ථික දර්ශක පිළිබඳ උපකල්පන			
	2020	**2021**	**2022**
මූර්ත දළ දේශීය නිෂ්පාදිතය (GDP) වර්ධනය (%)	1.5 ප්‍රතිශෝධිතව 0.0	5.0	5.5
විනිමය අනුපාතිකය (ඇ. ඩොලරයට ශ්‍රී ලංකා රුපියල්)	184	185	187
උද්ධමන අනුපාතිකය (%)	5.0	5.0	5.0
දේශීය ණය මත සාමාන්‍ය පොළී අනුපාතික	-	-	-
විදේශීය ණය මත සාමාන්‍ය පොළී අනුපාතික	-	-	-
මූලාශ්‍රය:- ආදායම පිළිබඳව මුදල් අමාත්‍යාංශය විසින් රාජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලද 2021 වර්ෂයේ යාවත්කාලීන අයවැය ඇස්තමේන්තු			

2021 අයවැය ඇස්තමේන්තුව තුළ වූ 5% ක දළ දේශීය නිෂ්පාදිත උපකල්පනය අයවැය පිළියෙළ කළ අවස්ථාව වන විට සාධාරණ එකක්ව පැවති බව සැලකිය හැකිය. (1.2 වගුව) එය බහුපාර්ශ්වීය මූල්‍ය සංවිධාන (MFIs) අතර වූ පුළුල් එකඟත්වය සමග මෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) මතය සමග ද සමපාත වේ. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාව 2020 ඔක්තෝබර් මුල වන විට කොවිඩ්-19 දෙවන රැල්ලේ ආසාදන සමග සටනක යෙදෙන බැවින්, එම ඇස්තමේන්තු අවාසි සහගත අවදානමක පවතින බව සටහන් කළ යුතුය. එම නිසා 2021 සිව්වැනි කාර්තුව තුළ ආර්ථික ක්‍රියාකාරකම් කඩාකප්පල් වීමේ සාධකය සලකන විට මෙම වර්ධන ඇස්තමේන්තුවලට වඩා තථ්‍ය අගයන් පහළ යා හැකි බව පෙනේ.

1.2 වගුව:- දළ දේශීය නිෂ්පාදිත පුරෝකථනයන්හි යම් සන්සන්දනය කළ හැකි මූලාශ්‍ර			
	2020	**2021**	
ආසියානු සංවර්ධන බැංකුව	-5.5%	4.1%	2020 සැප්තැම්බර්
ශ්‍රී ලංකා මහ බැංකුව	-1.7%	5.0%	2020 ඔක්තෝබර්
ලෝක බැංකුව	-6.7%	3.3%	2020 ඔක්තෝබර්
ජාත්‍යන්තර මූල්‍ය අරමුදල	-4.6%	5.3%	2020 ඔක්තෝබර්
මූලාශ්‍ර:- අ) ආසියානු සංවර්ධන බැංකුව, ආසියානු සංවර්ධන දසුන 2020; ආ) ශ්‍රී ලංකා මහ බැංකුව, මෑත කාලීන ආර්ථික ප්‍රවණතා; ඇ) ලෝක බැංකුව, දකුණු ආසියාව පිළිබඳ සංක්ෂිප්තය; ඈ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක ආර්ථික දසුන			

2021 අයවැයෙහි තනි අංකයේ උද්ධමන අනුපාතිකය පිළිගත හැකි එකකි. ආර්ථිකයේ අතිරික්ත ද්‍රවශීලීත්වය නොතකා, සමීප කාලීන අවධමන නැඹුරුවක් යොදවමින්, මැඩුණු ඉල්ලුම්-පාර්ශ්වීය බලපෑම් ශක්තිමත් වෙතැයි අපේක්ෂා කෙරේ. ආරම්භක ප්‍රකෘතිකරණ අදියරෙහි උද්ධමන පීඩනයන් බොහෝ කොටම සැපයුම් බිඳ වැටීම්, ආනයන සීමා ආදිය හේතුවෙන් වන ආහාර මිල වැඩිවීම්වලින් පැනනගිනු ඇත. කෙසේ වුවද, ආර්ථික නැගිටීමක් ඇති වන අතරේ ඉල්ලුම් මගින් ඇති කරනු ලබන උද්ධමන පීඩනයන් කාල විරාමයකට පසුව මතු වෙතැයි අපේක්ෂා කළ හැකිය. මෙය බොහෝ දුරට 2021 දෙවන අර්ධය තුළ හා ඉන් ඔබ්බෙහි ඇති වනු ඇත.

නාමික දළ දේශීය නිෂ්පාදිත හා උද්ධමන අපේක්ෂණයන් තථ්‍ය දළ දේශීය නිෂ්පාදිත උපකල්පනයන් හා දිශාගතව ඇත. 2021 අයවැය ඇස්තමේන්තු මගින් නාමික දළ දේශීය නිෂ්පාදිතය රුපියල් බිලියන 15,960 ක සිට රුපියල් බිලියන 17,643 දක්වා ඉහළ නංවමින් 10% ක නාමික වර්ධනයක් ඇති වෙතැයි අපේක්ෂා කෙරෙන බවක් යෝජනා කෙරේ. 5% ක අපේක්ෂිත උද්ධමන අනුපාතිකයක් සමගින් 2021 වර්ෂය සඳහා 5% ක්වූ තථ්‍ය වර්ධන වේගය වලංගු ලෙස සැලකිය හැකිය.

දේශීය හා විදේශීය ණය මත වූ පොළී පිරිවැය ඇස්තමේන්තු කිරීම සඳහා උපකල්පිත පොළී අනුපාතික පිළිබඳ නිරවුල් අදහසක් 2021 අයවැය ඇස්තමේන්තු මගින් ලබා නොදේ. 2021 ආදායම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය හා රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් ඉදිරිපත් කරන යාවත්කාලීන අයවැය ඇස්තමේන්තු මගින් පැවසෙන්නේ දේශීය හා විදේශීය ණය මත පොළී අනුපාතිකයන් පදනම්ව ඇත්තේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රක්ෂේපණයන් මත බවයි. මේවා සපයා නොමැත.

2021 අයවැය තුළ ශ්‍රී ලංකා රුපියලෙහි ඇමෙරිකන් ඩොලරයට රුපියල් 185 ක් වන විනිමය අනුපාතික අගය අධි-අපේක්ෂා සහගතය. 2020 ඔක්තෝබර් මාසයේ අග වන විට පැවති නිල සංචිත ප්‍රමාණය ඇමෙරිකන් ඩොලර් 5,858 ක්ව පැවතීම, 2021 වර්ෂය සඳහා ගෙවිය යුතු විදේශීය ණය හා පොළිය ඇමෙරිකන් ඩොලර් බිලියන 4 ක් වීම, අපනයන, සංචාරක කර්මාන්තය, සංක්‍රාම හා විදේශීය සෘජු ආයෝජන වෙතින් ඇතුළතට ප්‍රවාහයන් සාමාන්‍ය අගයට වඩා පහළ පැවතීම සහ ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළඳපල තුළ වඩාත් දුෂ්කර තත්ත්වයන් පැවතීම හමුවේ, 2020 ඔක්තෝබර් මාසයේ අයවැය පිළියෙළ කරන අවස්ථාවේදී පැවති අගය වන ඇමෙරිකන් ඩොලරයට ශ්‍රී ලංකා රුපියල 185 ක ස්ථාවර විනිමය අනුපාතිකයක් 2021 වර්ෂය සඳහා උපකල්පනය කිරීම ප්‍රශ්න සහගත වේ. මෙම තත්ත්වයන් යටතේ, ස්ථාවර විනිමය අනුපාතිකයක් පවත්වා ගනු පිණිස සුවිශේෂී ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයක් වශයෙන් විදේශීය විනිමය වෙළඳපල තුළ ඉලක්කගත මැදිහත් වීම් සිදු නොකළ හොත්, විනිමය අනුපාතිකය අවප්‍රමාණ වෙතැයි අපේක්ෂා කළ හැකිය.

2021 අයවැයෙහි රුපියල් බිලියන 507 ක විදේශ ණය ආපසු ගෙවීමේ ඇස්තමේන්තුව නිවැරදි ය. මුදල් අමාත්‍යාංශය හා රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් ආදායම පිළිබඳව ඉදිරිපත් කරන ලද 2021 යාවත්කාලීන අයවැය ඇස්තමේන්තු තුළින් ණයහිමියන් වෙත ණය සේවා ගෙවීම් පිළිබඳව විස්තරාත්මක දත්ත සැපයේ. රුපියල් 185 ක උපකල්පිත විනිමය අනුපාතිකයකදී ඇමෙරිකන් ඩොලර් මිලියන 2,644 ක් වූ ආපසු ගෙවිය යුතු මුල් ණය මුදල ශ්‍රී ලංකාවේ රුපියල්වලින් බිලියන 490 ක් වේ.

සාර්ව මට්ටමේ ඇස්තමේන්තු තුළ යම් අනනුකූලතාවන් නිරීක්ෂණය වේ (1.3 වගුව). වඩාත් වැදගත් ඒවා පහත වගුවෙහි සටහන් කර ඇත. එයට අමතරව, අයවැය කථාවෙහි 5.5% ක දළ දේශීය නිෂ්පාදිත වර්ධන අනුපාතිකයක් පිළිබඳව සඳහන් කෙරුණු අතරම, මුදල් අමාත්‍යාංශය හා රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් ඉදිරිපත් කරන ලද යාවත්කාලීන 2021 අයවැය ඇස්තමේන්තුවලින් යෝජනා කෙරෙනුයේ 5% ක වර්ධන වේගයක් නිරතුරුවම භාවිත කරනු ලැබූ බවයි.

1.3 වගුව:- සාර්ව මට්ටමේ ඇස්තමේන්තු තුළ නිරීක්ෂණය වූ අනනුකූලතාවයන් සමහරක් (දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස) %

	2021 අයවැය කථාව		**2020–2021** මූල්‍ය කළමනාකරණ වාර්තාව	
	2020	2021	2020	2021
මුළු ආදායම	9.9	11.4	9.5	10.6
බදු ආදායම	8.5	9.8	8.5	9.4
මුළු වැය	17.8	20.5	17.5	19.5
පුනරාවර්තන වියදම	15.3	14.4	14.9	14.2
රාජ්‍ය ආයෝජන	2.6	6.1	2.6	5.4

1.2 රජයේ ආදායම

1.2.1 බදු ආදායම් ඇස්තමේන්තු

2021 වර්ෂය සඳහා වූ අයවැය මගින් බදු ආදායම ලෙස රුපියල් බිලියන 1,724 ක් ඇස්තමේන්තු කෙරෙන අතර, එය 2020 වර්ෂය සඳහා අපේක්ෂිත බදු ආදායම වූ රුපියල් බිලියන 1,358 අභිභවා 27% ක වර්ධනයකි (1.4 වගුව). දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගත් කළ, 2020 පැවති 8.5% ක වර්ධනයට සාපේක්ෂව 2021වර්ෂය තුළ බදු ආදායම් 9.8% කින් වැඩි වනු ඇතැයි අපේක්ෂා කර ඇත.

1.4 වගුව:- 2021 ආදායම් ඇස්තමේන්තු						
	රුපියල් බිලියන				**ප්‍රතිශත වෙනස**	
	2019	2020	2020	2021	2019-	2020-
	(තථ්‍ය)	(ජනවාරි–අගෝස්තු)	(ඇස්තමේන්තුගත)	(ඇස්තමේන්තුගත)	2020	2021
බදු ආදායම	1,735	801	1,358	1,724	-21.7	27.0
බදු නොවන ආදායම්	156	105	162	227	3.9	40.1
මුළු ආදායම	1,891	906	1,520	1,951	-19.6	28.4
මූලාශ්‍රය:- මුදල් අමාත්‍යාංශය හා රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරිත්ව හා ආර්ථික වර්ගීකරණය මගින් සමූහනය කරන ලද දත්ත.						

බදු ආදායමෙහි සමස්ථ වර්ධනය සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කෙරෙනුයේ සුරාබදු හා ආනයන තීරුබදු වැනි ප්‍රධාන බදු ප්‍රභේදයන් වෙතින් වඩා ඉහළ එකතු කර ගැනීමක් හරහා ය. ඇස්තමේන්තු පමණට වඩා සුභවාදී බවක් පෙනෙනුයේ 2020 සඳහා වූ සමස්ත ආදායම් අපේක්ෂණයන්ට වඩා අඩු වන බවක් 2020 ජනවාරි–අගෝස්තු සඳහා ඇති දත්ත මගින් යෝජනා කෙරෙන බැවිනි (1.1 රූපය). උපයන විට ගෙවීමේ බදු හා එකතු කළ අගය මත බදු ප්‍රතිශෝධන වැනි 2020 වර්ෂයේ සිට ක්‍රියාත්මක වූ බදු සංශෝධනයන්ද 2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂය තුළ බදු එකතු කර ගැනීම කෙරෙහි බලපෑම් ඇති කරමින් තිබේ.

1.1 රූපසටහන:- 2010–2021 මුළු බදු ආදායම



Taxes on Domestic Goods and Services = දේශීය භාණ්ඩ හා සේවා මත බදු * Taxes on International Trade = ජාත්‍යන්තර වෙළඳාම මත බදු * Total Income Tax = මුළු අය බදු * Licence Taxes and Other = බලපත්‍ර හා වෙනත් බදු * Tax Revenue = බදු ආදායම * Tax Revenue (Estimate) = බදු ආදායම (ඇස්තමේන්තුගත) * Jan-Aug = ජනවාරි–අගෝස්තු

මූලාශ්‍රය:- 2010–2020 අයවැය ඇස්තමේන්තු සහ මුදල් අමාත්‍යාංශය හා රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරිත්ව හා ආර්ථික වර්ගීකරණය මගින් සමූහනය කරන ලද දත්ත.

2021 අයවැය ඉදිරිපත් කළ තැන් පටන් ඇති වූ කොවිඩ්-19 දෙවන රැල්ල හේතුවෙන් 2021 වර්ෂය තුළ අපේක්ෂා කරන ලද 5% ආර්ථික වර්ධනයට වඩා අඩු අගයක් ඇති විය හැකි අතර එමගින් සමස්ත ආදායම් එකතු කර ගැනීම්වලට තවදුරටත් බලපෑම් ඇති විය හැකිය. එක් එක් බදු ප්‍රභේදය පිළිබඳ විස්තරාත්මක තක්සේරු පහත සාකච්ඡා කෙරේ.

1.2.2 ආදායම් හා ලාභ මත බදු

<u>අය බදු ආදායම් ඇස්තමේන්තු:</u>- 2020 වර්ෂයේ අය බදු ආදායම රුපියල් බිලියන 324 ක් වනු ඇතැයි යන අපේක්ෂණය පදනම් කර ගෙන රජය 2021 වර්ෂය තුළ 14.5% ක අයබදු ආදායම් වර්ධනයක් අපේක්ෂා කරයි (1.5 වගුව). මෙය අයබදු ආදායමට 90% ක දායකත්වයක් ලබා දෙන සංස්ථාගත බද්දෙන් වඩා ඉහළ ආදායමක් රැස් කර ගැනීම මගින් සාක්ෂාත් කර ගැනීමට නියමිත ය. 'ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය' ක්‍රියාත්මක කිරීමත් සමග ශක්තිමත් වූ බදු පරිපාලනය මගින් ආදායම් හා ලාභ මත වූ බදුවලින් ලැබෙන ආදායමෙහි ධනාත්මක ප්‍රතිඵලයක් ඇති කෙරෙතැයි අපේක්ෂා කෙරේ.

කෙසේ වුවද, ඉහත කාරණය අනුසීමනයට යටත් වේ. 'ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය' ක්‍රියාත්මක කිරීම මගින් අපේක්ෂිත ධනාත්මක ප්‍රතිඵල ක්ෂණිකව ඇති නොවනු ඇත. එයට අමතරව, 'අඩු අයබදු අනුපාතික' හා 'වර්ධිත බදු අය කළ හැකි අවතීර්ණ සීමාව' වැනි යම් උපකල්පනයන් 2020 ජනවාරි වන විටත් ක්‍රියාත්මක කර තිබුණි. ඒ අනුව ඒවායින් 2021 ආදායම් ඇස්තමේන්තුවලට විශාල බලපෑමක් ඇති වෙතැයි සිතිය නොහැකිය. අවසන් වශයෙන්, 2020 ජනවාරියේ ක්‍රියාත්මක කරන ලද බදු ප්‍රතිශෝධනයන්හි ප්‍රතිඵලයක් ලෙස ආදායම් හා ලාභ වෙතින් වූ බදු ආදායම (1.5 වගුවෙහි දක්වා ඇති පරිදි, 2019 රුපියල් බිලියන 428 සිට 2020 රුපියල් බිලියන 324 දක්වා) පහළ යනු ඇතැයි අපේක්ෂා කෙරුණි. මෙම බදු ප්‍රතිශෝධනයන්ට උපයන විට ගෙවීමේ බදු පිවිසුම් සීමාව ඉහළ දැමීම, සංස්ථායික බදු අනුපාතික අඩු කිරීම හා ආර්ථික සේවා ගාස්තුව අහෝසි කිරීම ඇතුළත්ය.

1.5 වගුව:- 2021 අයබදු ඇස්තමේන්තු

	රුපියල් බිලියන				ප්‍රතිශත වෙනස %	
	2019	2020	2020	2021	2019-	2020-
	(තථ්‍ය)	(ජනවාරි–අගෝස්තු)	(ඇස්තමේන්තුගත)	(ඇස්තමේන්තුගත)	2020	2021
සංස්ථායික හා සංස්ථායික නොවන බද්ද	273	136	280	335	2.7	19.6
උපයන විට ගෙවීමේ බදු (PAYE)	49	10	15	20	-69.7	33.3
ආර්ථික සේවා ගාස්තුව (ESC)	55	14	16	-	-71.1	-
පොළී ආදායම මත බද්ද	50	7	13	16	-74.2	23.1
මුළු අයබද්ද	428	167	324	371	-24.2	14.5

මූලාශ්‍රය:- මුදල් අමාත්‍යාංශය හා රාජ්‍ය මුදල් පිළිබඳ කාරක සභාව විසින් ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරිත්ව හා ආර්ථික වර්ගීකරණය මගින් සමූහනය කරන ලද දත්ත

අයබදු සම්බන්ධයෙන් යම් නොපැහීම් හා ඇස්තමේන්තු අස්ථානගත වීම් තිබේ. උපකල්පනයන්හි හා අයවැය යෝජනාවන්හි නොපැහීම් හේතුවෙන් ආදායම් හා ලාභ වෙතින් අපේක්ෂිත ආදායම් අඩු වීමට ඉඩ තිබේ. නිදසුනක් ලෙස, අයවැය ප්‍රතිපාදනයන් රජයේ නිලධාරීන්ගේ මූලික වැටුප වැඩි කිරීම උපකල්පනය කරන නමුත්, අයවැය යෝජනාවන්හි රාජ්‍ය අංශ වැටුප්වල වැඩිවීමක් සඳහන් නොකරයි.

1.2 රූපසටහන:- අයබදු ආදායම — 2010–2020



Corporate Tax = සංස්ථායික බද්ද * Non-Corporate Tax = සංස්ථායික නොවන බද්ද * Withholding Tax = රඳවා ගැනීමේ බද්ද
Economic Service Charge = ආර්ථික සේවා ගාස්තුව * Total Income Tax = මුළු අය බද්ද *
Total Income Tax (Estimate) = මුළු අය බද්ද (ඇස්තමේන්තුව)

මූලාශ්‍රය:- 2010–2020 අයවැය ඇස්තමේන්තු සහ මුදල් අමාත්‍යාංශය හා රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරිත්ව හා ආර්ථික වර්ගීකරණය මගින් සමූහනය කරන ලද දත්ත.

1.2.3 දේශීය භාණ්ඩ හා සේවා මත බදු

<u>දේශීය භාණ්ඩ හා සේවා බදු ආදායම් ඇස්තමේන්තු</u>:- 2021 වර්ෂය තුළ දේශීය භාණ්ඩ හා සේවා බදු ආදායමෙහි 30.4%ක වර්ධනයක් සහ 2020 වර්ෂය සඳහා එකතුව රුපියල් බිලියන 631 ක් රජය අපේක්ෂා කරයි (1.6 වගුව). සුරාබදු (58%) හා එකතු කළ අගය මත බදු (38%) වෙතින් වඩා ඉහළ ආදායම් රැස්කිරීමෙන් එකී වර්ධනය සාක්ෂාත් කර ගත යුතුව ඇත.

1.6 වගුව: දේශීය භාණ්ඩ සහ සේවා බදු ඇස්තමේන්තු 2021

	රු. බිලියන				වෙනස %	
	2019 (තථ්‍ය)	2020 (ජන-අගෝ)	2020 (ඇස්තමේන්තු)	2021 (ඇස්තමේන්තු)	2019-2020	2020-2021
එකතු කළ අගය මත බදු (වැට්)	444	138	241	310	-45.7	28.6
නිෂ්පාදන බදු	399	215	355	475	-11.1	33.8
ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT)	71	2	3	-	-95.8	
විදුලි සන්දේශ බදු	18	9	15	20	-17.9	33.3
බලපත්‍ර ගාස්තු සහ වෙනත්	43	39	17	18	-60.7	5.9
මුළු දේශීය භාණ්ඩ බදු	976	403	631	823	-35.3	30.4

මූලාශ්‍රය : මුදල් අමාත්‍යාංශය විසින් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට ලබා දුන් මෙහෙයුම් සහ ආර්ථික වර්ගීකරණ දත්ත සමූහය තුළින්

දේශීය භාණ්ඩ සම්බන්ධයෙන් ගත් විට ඇස්තමේන්තුවල නොගැලපීම් සහ අස්ථානගතවූ ඇස්තමේන්තු දැකිය හැකිය. උපකල්පන වල සාධාරණත්වය තක්සේරු කිරීමට නිෂ්පාදන (විශේෂ විධි විධාන) බදු වලට කරන ලද ගාස්තු සංශෝධනය සම්බන්ධයෙන් ප්‍රමාණවත් තොරතුරු නොතිබුණි. 2021 සඳහා වූ දේශීය භාණ්ඩ සහ සේවා මත බදු මත වූ අදායම් ඇස්තමේන්තු අයවැයෙහි විශේෂයෙන් සඳහන් කර නොතිබූ උපකල්පන මත පදනම් විය. උදාහරණයක් වශයෙන් මත්පැන්, සිගරට් සහ පැණි බීම මත පනවන ලද ඉහළ බදු නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු වලින් ලැබෙන අදායම වැඩි කරනු ඇතැයි 2021 අයවැය තුළින් උපකල්පනය කෙරුණි. අයවැය යෝජනා වල මත්පැන්, සිගරට් සහ පැණි බීම සම්බන්ධයෙන් බදු එකතු කිරීමේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහන් කිරීම හැරුණ විට වෙනත් කිසිදු විශේෂිත සංශෝධනයක් දක්වා නොතිබුණි. තවදුරටත්, දේශීය භාණ්ඩ සහ සේවා මත බදුවල අනෙකුත් උපාංග වල ඇස්තමේන්තු පිළිබඳ උපකල්පන දක්වා නොතිබුණි.

1.3 රූප සටහන : දේශීය භාණ්ඩ සහ සේවා බදු: 2010-2021



*මූලාශ්‍රය : 2010-2020 – අයවැය ඇස්තමේන්තු සහ **මුදල් අමාත්‍යාංශය විසින් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට ලබා දුන් මෙහෙයුම් සහ ආර්ථික වර්ගීකරණ දත්ත සමූහය තුළින්***

අවධානයට ගත යුතු කාරණය වන්නේ කොවිඩ් - 19 දෙවන රැල්ල නිසා පෙර අපේක්ෂා කළ ආකාරයට වඩා සෙමින් ආර්ථිකය ප්‍රකෘතියට පත්වීම තුළ එකතු කළ අගය මත බදු වලින් ලැබෙන ආදායම ඇස්තමේන්තුවට වඩා අඩු වනු ඇති බවය. විශේෂයෙන් ම නව එකතු කළ අගය මත බදු සීමාව වර්ෂයකට රු. මිලියන 12 සිට රු. මිලියන 300 දක්වා වැඩිකිරීම තුළ ආර්ථිකය මන්දගාමී වීම නිසා ආදායමට වැඩි වශයෙන් බලපෑම් සිදු කරයි.

1.2.4 ජාත්‍යන්තර වෙළෙඳාම මත බදු

ජාත්‍යන්තර වෙළෙඳ බදු ආදායම් ඇස්තමේන්තු : ආනයන ආදේශන දේශීය වශයෙන් නිෂ්පාදනය කිරීම ධෛර්යමත් කිරීම සඳහා ආනයන සීමා පැනවීම සම්බන්ධයෙන් 2021 අයවැය කථාව තුළ කිහිප අවස්ථාවක සඳහන් කෙරිණි. කෙසේ වෙතත් රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් ලබා දෙන ලද තොරතුරු සටහනෙහි " 2020 දී පනවන ලද ආනයන සීමා ලිහිල් කිරීම නිසා ආනයනික භාණ්ඩ සම්බන්ධයෙන් දේශීය ඉල්ලුමෙහි වැඩිවීමක්' පිළිබඳව සඳහන් වේ. එසේම 2021 ආනයන තීරු බදු වල 17.9% ක වර්ධනයක් අපේක්ෂා කිරීමේ පදනම පැහැදිළි නොමැති අතර එහි නිරවද්‍යතාව තක්සේරු කිරීම ද ගාස්තු වැඩි කිරීම සම්බන්ධ නිශ්චිත දත්ත ලබා දී නොමැති නිසා අපහසුය.

සෙස් බදු වලින් ඉහළ එකතුවක් ලබා ගැනීමේ හැකියාව තිබුණ ද ගාස්තු පිළිබඳ සහ හඳුනාගත් නිෂ්පාදන කාණ්ඩ වලට එය යොදාගැනීම සම්බන්ධයෙන් පැහැදිළිබවක් නොමැති වීම නිසා තථ්‍ය ඇස්තමේන්තුවක් හඳුනාගත නොහැකිය. "තෝරාගත් කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා දේශීය නිෂ්පාදන වල ඉල්ලුම සහ සැපයුම තුලනය කිරීම සඳහා විශේෂ භාණ්ඩ බද්දක් පැනවීම" සම්බන්ධයෙන් පමණක් 2021 අයවැය සඳහන් කර තිබුණි. අයවැය තුළ විශේෂ භාණ්ඩ බදු සංශෝධන සඳහා අදාළ නිෂ්පාදන කේත විශේෂයෙන් සඳහන් කර තිබුණ ද, එයම සෙස් බද්ද සම්බන්ධයෙන් ප්‍රකාශ කළ නොහැකිය.

1.7 වගුව : වෙළෙඳ ආදායම් බදු ඇස්තමේන්තු සහ අපේක්ෂිත වර්ධනය

	රු. බිලියන				වෙනස %	
	2019 (තථ්‍ය)	2020 (ජන - අගෝ)	2020 (ඇස්තමේන්තු)	2021 (ඇස්තමේන්තු)	2019-2020	2020-2021
ජාත්‍යන්තර වෙළෙඳාම මත බදු	333	n.a.	455	496	36.6	9.0
ආනයන බදු	98	73	140	165	42.9	17.9
සෙස් බදු	51	31	50	60	-2.0	20.0
වරාය සහ ගුවන් සේවා බදු	112	72	115	160	2.7	39.1
විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු	70	55	98	110	40	12.2

මූලාශ්‍රය : 2020 අයවැය ඇස්තමේන්තු සහ FMR 2020-21

2021 යටපත් වූ වෙළෙඳ ක්‍රියාකාරකම් ද වරාය සහ ගුවන් සේවා බදු එකතුවේ අපේක්ෂිත වර්ධනය කෙරෙහි බලපෑම් ඇති කළ හැකිය. 2020 අගෝස්තු දක්වා වූ එකතුව ව රු. බිලියන 72, 2020 වර්ෂය සඳහා වූ අපේක්ෂිත එකතුවට වඩා ඉතා අඩු අගයකි. එසේම දේශීය සහ ගෝලීය ආර්ථික තත්ත්වයන් තර්ජනයකට මුහුණ දී ඇති අවස්ථාවක 2021 දී රු. බිලියන 160 ක ඉලක්කයක් ළඟා කර ගැනීම අභියෝගයක් වනු ඇත.

සමස්ථයක් වශයෙන් පැරණි දත්ත මත පිළිබිඹු වන ආකාරයට තථ්‍ය දත්ත සහ අයවැය ඇස්තමේන්තු අතර වැඩිවන වර්ධනයක් පෙන්නුම් කෙරෙන තත්ත්වයක් තුළ විශේෂයෙන්ම ආනයන තීරු බදු සහ විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු (රූප සටහන 1.4) සම්බන්ධයෙන් 2021 සඳහා වූ වෙළෙඳ බදු ආදායමෙහි ඇස්තමේන්තු වඩාත් සුභවාදී වේ. 2020 තථ්‍ය දත්ත වල පහත වැටීමක් දක්නට ලැබෙන්නේ දත්ත ජනවාරි සිට අගෝස්තු දක්වා පමණක් වීම නිසාය.

1.4 රූපසටහන : වෙළෙඳ බදු ආදායම : 2010-2021



මූලාශ්‍රය : 2020 අයවැය ඇස්තමේන්තු සහ FMR 2020-21

ජාත්‍යන්තර වෙළෙඳ බදු සම්බන්ධයෙන් ඇස්තමේන්තු නොගැලපීම් සහ අස්ථානගතවූ ඇස්තමේන්තු දක්නට ලැබුණි. අයවැය කථාවේ ඇමුණුම් සහ නවතම අයවැය ඇස්තමේන්තු වාර්තා (වගුව 1.8) අතර වාර්තාකරන විෂමතාවන් ද දක්නට ලැබුණි. කෙසේ වෙතත් 2021 ප්‍රක්ෂේපණය අයවැය ඇස්තමේන්තු තුළ යටිකුරු ලෙස ජාත්‍යන්තර වශයෙන් සංශෝධනය වුවහොත් මෙය සාධාරණ සංශෝධනයකි.

1.8 වගුව - අයවැය ලේඛන හරහා වෙළෙඳ බදු ඇස්තමේන්තු වල විෂමතාවන්- රු. බිලියන			
	අයවැය කථා ඇමුණුම්	**අයවැය ඇස්තමේන්තු**	**අයවැය ඇස්තමේන්තු- තනි බදු මත පදනම් වූ මුළු එකතුව**
2020 ඇස්තමේන්තුව	403	455	405
2021 ප්‍රක්ෂේපණය	530	496	505
මූලාශ්‍රය : 2020 අයවැය ඇස්තමේන්තුව සහ 2021 අයවැය කථාව			

අයවැය ඇස්තමේන්තු ලේඛන වල ජාත්‍යන්තර වෙළෙඳ බදු ආදායම් සංඛ්‍යා වල වැරදි හඳුනාගත හැකිය. 2020 සහ 2021 සඳහා වූ මෙම ලේඛනයේ සඳහන් 1.8 වගුව තුළ සඳහන් ඇස්තමේන්තු වල රු. බිලියන 455 සහ රු. බිලියන 496 ක් ලෙස පිළිවෙලින් සටහන් විය. කෙසේ වෙතත්, එම ලේඛනයේ ම ලබා දී තිබෙන තනි වෙළෙඳ බදු අයිතම එකතු කළ විට එම සංඛ්‍යාව රු. බිලියන 405 සහ රු. බිලියන 505 ක් ලෙස පිළිවෙලින් සටහන් විය. එසේම 2020 සඳහා වූ පහළ ඇස්තමේන්තුවක් සහ 2021 සඳහා වූ ඉහළ ඇස්තමේන්තුවක් 2020 -2021 අතර 25% ක වර්ධනයක් පෙන්නුම් කළත්, එය 1.7 වගුවේ එම කාල සීමාව ම සඳහා ගණනය කරන ලද 9% ක අගයට ඉහළ අගයකි. මෙය තවදුරටත් පෙර කොටස් වල මතුකොට දක්වන ලද හේතු නිසා වෙළෙඳ බදු ආදායමේ වර්ධනය සම්බන්ධයෙන් වන ශුභවාදී අපේක්ෂාවන් වර්ධනය කරයි.

1.2.5 බදු නොවන ආදායම

බදු නොවන ආදායම 2021 වර්ෂය සඳහා 37% ක වර්ධනයක් අපේක්ෂා කරයි. කෙසේ වෙතත්, මෙම ඇස්තමේන්තු සඳහා වන උපකල්පන තක්සේරු කිරීම උගහට වන්නේ අයවැය තුළ මෙම බදු නොවන ආදායම් සංරචක පිළිබඳව කිසිවක් සඳහන් නොවීම නිසාය. මෙම වර්ධනය සාධාරණීකරණය කිරීමට කිසිදු ප්‍රතිපත්තිමය වෙනස්කමක් සඳහන් කොට නොමැති අතර තොරතුරු අස්ථානගතවීමේ ගැටළුවක් මෙහි දී මතුවී තිබේ.

1.9 වගුව: බදු නොවන ආදායම් ඇස්තමේන්තු සහ අපේක්ෂිත වර්ධනය - රු. මිලියන					
විස්තරය	**2019 තාවකාලික**	**2020 ඇස්තමේන්තු**	**2021 ප්‍රක්ෂේපණය**	**2019-2020 % වෙනස**	**2020-2021 % වෙනස**
බදු නොවන ආදායම	196,528	189,200	259,400	-3.7	37.1
දෙපාර්තමේන්තු ව්‍යාපාර වලින් ආදායම	16,475	12,200	18,200	-26.0	49.2
ආණ්ඩුවේ වත්කම් වලින් ලැබීම්	46,404	40,000	69,000	-13.8	72.5
අලෙවි කටයුතු සහ ගාස්තු	77,266	61,800	98,200	-20.0	58.9
සමාජ ආරක්ෂක දායකත්වය	28,985	33,000	35,000	13.9	6.1
ජංගම මාරුකිරීම්	3,141	27,000	23,600	759.5	-12.6
ප්‍රාග්ධන ආදායම	24,256	15,200	15,400	-37.3	1.3
මූලාශ්‍රය : 2020 අයවැය ඇස්තමේන්තු					

අයවැය ලේඛන තුළ බදු නොවන ආදායම් ඇස්තමේන්තු වල විෂමතාවන් දක්නට ලැබේ. 1.10 වගුවේ දක්වා ඇති ආකාරයට අයවැය ඇස්තමේන්තු ලේඛන වල දක්වා තිබෙන සංඛ්‍යා අයවැය කථාවේ ඇමුණුම් වල දක්වා තිබෙන සංඛ්‍යා සහ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවෙන් ලබාගත් දත්ත වලට වඩා ඉහළ අගයක් ගනියි.

1:10 වගුව අයවැය ලේඛන තුළ බදු නොවන ආදායම් ඇස්තමේන්තු වල විෂමතාවන් - රු. බිලියන			
	අයවැය කථාවේ ඇමුණුම්	**ර.මු.කා. සභාව හරහා ලබා ගත් මුදල් අමාත්‍යාංශ දත්ත**	**අයවැය ඇස්තමේන්තු**
2020 ඇස්තමේන්තු	162	162	189
2021 ප්‍රක්ෂේපණ	227	227	259
මූලාශ්‍රය : 2020 අයවැය ඇස්තමේන්තු, 2021 අයවැය කථාව, මුදල් අමාත්‍යාංශය විසින් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට ලබා දෙන ලද මෙහෙයුම් සහ ආර්ථික කාණ්ඩ දත්ත			

2. ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා වලට අනුව පෙළගැසීම පිළිබඳ විශ්ලේෂණය

ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රමුඛතාවන් විශ්ලේෂණය කිරීමේ දී ඵලදායී පුරවැසියෙක්, තෘප්තිමත් පවුලක්, විනයගරුක සහ සාධාරණ සමාජයක් සහ සමෘද්ධිමත් දේශයක් යන සිව් වැදෑරුම් ප්‍රතිඵල අපේක්ෂිතව "සෞභාග්‍යයේ දැක්ම" යන්නට ඇතුළත් කරන ලද ප්‍රධාන ප්‍රතිපත්ති 10 සහිත ආණ්ඩුවේ ජාතික ප්‍රතිපත්ති රාමුව නැවත සළකා බැලීම වැදගත් ය. මෙම ප්‍රධාන ප්‍රතිපත්ති දහය තුළ සමාජ, ආර්ථික, පාරිසරික සහ දේශපාලන පැතිකඩ වලට නිසි අවධානය ලබා දෙමින් ජාතික ආරක්ෂාව, විදේශ ප්‍රතිපත්තිය සහ දූෂණයෙන් තොර පරිපාලනයක් සම්බන්ධ අතිශය වැදගත් ස්ථම්භ තුනක් දක්නට ලැබේ. එම ස්ථම්භ තුන වන්නේ:

2.1. ජාතික ආරක්ෂාවට ප්‍රමුඛතාව
2.2. මිත්‍රශීලී, නොබැඳුණු විදේශ ප්‍රතිපත්තිය
2.3. දූෂණයෙන් තොර පරිපාලනයක්

2.1 ජාතික ආරක්ෂාවට ප්‍රමුඛතාව

2.1.1 ප්‍රතිපත්ති ප්‍රමුඛතා සහ සාරාංශය

ශ්‍රී ලංකා රජයේ ආරක්ෂක වියදම ආරක්ෂක අමාත්‍යාංශය, අභ්‍යන්තර ආරක්ෂාව, ස්වදේශ කටයුතු සහ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මගින් දරනු ලැබේ. මෙම අමාත්‍යාංශ දෙක සඳහා 2021 අයවැයෙන් වෙන් කරන ලද මුදල පහත වගුවේ දැක්වේ. ඒ අනුව ජාතික ආරක්ෂාවට වෙන් කරන ලද මුළු මුදල (රු.507,624.3) 2021 දළ දේශීය නිෂ්පාදිතයෙන් 2.9% ක් වේ.

2.1.1.1. වගුව - ජාතික ආරක්ෂාව සඳහා අමාත්‍යාංශ මට්ටමින් වෙන් කර ඇති අයවැය ප්‍රතිපාදන (රු. මිලියන)

අමාත්‍යාංශය/ රාජ්‍ය අමාත්‍යාංශය	වර්තන	ප්‍රාග්ධන	එකතුව
ආරක්ෂක අමාත්‍යාංශය	316,806.3	38,353.0	355,159.3
අභ්‍යන්තර ආරක්ෂාව, ස්වදේශ කටයුතු සහ ආපදා කළමනාකරන රාජ්‍ය අමාත්‍යාංශය	130,818	21647.04	152,465.0
එකතුව	447,624.3	60,000.0	507,624.3
2021 (%) සඳහා විසර්ජන වල ප්‍රතිශතයක් ලෙස			18.87
අපේක්ෂිත ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස			2.96
මූලාශ්‍රය : 2021 මූල්‍ය වර්ෂය සඳහා විසර්ජන පනත් කෙටුම්පත			

2021 මූල්‍ය වර්ෂය සඳහා වන විසර්ජන පනත් කෙටුම්පතෙහි සඳහන් වන පරිදි ජාතික ආරක්ෂාව සඳහා මධ්‍යම රජයේ සෘජු මුදල් වෙන් කිරීම් රු. බිලියන 507.6 වන අතර මුළු අයවැය වෙන් කිරීම් වලින් 18.9 ක ප්‍රතිශතයක් ලෙස එය විශාලතම වැය ශීර්ෂයන්ගේ එකක් ලෙස සඳහන් කළ හැකිය. මෙය ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් වන සැළකිය යුතු වර්ධනයක් වන අතර මෙයට සාපේක්ෂව 2019 වසරේ මේ සඳහා වෙන් කරන ලද්දේ රු. බිලියන 400 කි.[2]

2.1.1.1. රූප සටහන ජාතික ආරක්ෂාව සඳහා වෙන්කිරීම් (2017-2021)



මූලාශ්‍රය : 2019 අනුමත අයවැය පදනම් කරගත් කොළඹ විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයන අංශයේ සැකැස්ම සහ 2020 සහ 2021 සඳහා විසර්ජන පනත් කෙටුම්පත.

[2] කෙසේ වෙතත් අරමුදල් බෙදා හැරීම 2019 වර්ෂය තුළ ආරක්ෂක අමාත්‍යාංශය විසින් සිදු කළ අතර 2021 දී රාජ්‍ය අමාත්‍යාංශයක් එක් කර තිබේ.

මෑත වර්ෂවල කරන ලද මුදල් වෙන්කිරීම් සමඟ සන්සන්දනය කිරීමේ දී 2021 වර්ෂය සඳහා ජාතික ආරක්ෂාව සඳහා වෙන් කරන ලද වර්තන සහ ප්‍රාග්ධන වියදම් සැළකිය යුතු වර්ධනයක් දක්වා තිබෙන බව ප්‍රස්ථාරයෙන් පැහැදිළි වේ.

2.1.1.2 වගුව ජාතික ආරක්ෂාව සඳහා වන අයවැය වෙන්කිරීම් (රු. මිලියන)

	රු. මිලියන	වෙන්කිරීම (සමස්ථයේ %)
ආරක්ෂක යටිතල පහසුකම්	**11,300**	**15.4**
ආරක්ෂක මූලස්ථානයේ ඉදිකිරීම් කටයුතු නිම කිරීම	10,000	
යුධ හමුදා රෝහල ඉදිකිරීම	500	
ත්‍රිකුණාමලය නැව් තටාකාංගණයේ වරාය වේදිකාව ඉදිකිරීම	800	
පරිපාලන යටිතල පහසුකම්	**7,387**	**10.1**
නව විද්‍යුත් ජාතික හැඳුනුම්පතක් නිකුත් කිරීම සඳහා වන වැඩසටහන	2,996	
ආගමන සහ විගමන පරිපාලනය නවීකරණය කිරීම	1,012	
පරිපාලන සංකීර්ණ 06 ක් ඉදිකිරීම	1,418	
ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඉදිකිරීම	1,961	
ආපදා කළමනාකරණය	**2,160**	**2.9**
ආහාර සහ නියං සහනාධාර ලබා දීම	265	
ආපදා තත්ත්වයන් නිසා අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ පුනරුත්ථාපනය සහ දේපළ ප්‍රතිසංස්කරණය කිරීම.	1,345	
ජාතික ආපදා සිදුවිය හැකි ප්‍රදේශ වල ආපදා ප්‍රථාස්ත නිවාස ඉදිකිරීම	500	
නායයාම් අවදානම අඩුකිරීම සඳහා වැසි නිසා ඇතිවන නායයාම් සම්බන්ධ පූර්ව අනතුරු ඇඟවීම් තාක්ෂණ ව්‍යාපෘතිය.	50	
හමුදා ශූභසාධනය	**41,374**	**56.4**
ත්‍රිවිධ හමුදා සාමාජිකයන්ට ප්‍රතිලාභ	39,000	
රණවිරු මාපිය රැකවරණ දීමනා	2,374	
මත්කුඩු වලින් තොර රටක් නිර්මාණය කිරීම	**367**	**0.5**
පුරාවිද්‍යා ස්ථාන ආරක්ෂා කිරීම සහ පවත්වාගෙන යාම	**208**	**0.3**
තොරතුරු සන්නිවේදන තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම සඳහා ඊ - ග්‍රාම නිලධාරි ව්‍යාපෘතිය	**665**	**0.9**
බහුකාර්ය සංවර්ධන කාර්ය බලකා දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීම	**9,961**	**13.6**
මූලාශ්‍රය : 2021 මූල්‍ය වර්ෂය සඳහා විසර්ජන පනත් කෙටුම්පත		

2.1.2. වගුව අයවැයේ ප්‍රධාන කාරණා දක්වන අතර ආණ්ඩුවේ ප්‍රතිපත්තිමය ප්‍රමුඛතා අනුව හඳුනාගත් පරිදි සැළකිය යුතු ප්‍රමාණයක් (56.4%) ක් හමුදා ශූභසාධනයට වෙන් කර තිබෙන අතර, ඉන් විශාල ප්‍රමාණයක් ත්‍රිවිධ හමුදා සාමාජිකයන්ගේ විශ්‍රාම ප්‍රතිලාභ සඳහා වෙන් කර තිබේ. මුළු මුදල් වෙන් කිරීම් වලින් 15.4% ක් ජාතික ආරක්ෂක යටිතල පහසුකම් සඳහා වෙන් කර ඇති අතර ආපදා කළමනාකරණ සහ පරිපාලන කටයුතු වලට 13% ක් වෙන් කර තිබේ. මත්කුඩු සහ අදාළ අපරාධ සම්බන්ධව කටයුතු කිරීමත් එක් ප්‍රතිපත්ති ප්‍රමුඛතාවක් වන අතර මුළු වෙන්කිරීම් වලින් 0.5% ක් ඒ සඳහා වෙන් කර තිබේ.

2.1.2 ජාතික ආරක්ෂාවේ ප්‍රමුඛතා

වර්තමාන රජයේ එක් මැතිරවණ සටන් පාඨයක් වූයේ රටේ ජාතික ආරක්ෂාව තහවුරු කිරීමයි. ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් වන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ජාතික ආරක්ෂාව රටේ සංවර්ධනයට සහ දේශීය සහ විදේශීය ආයෝජකයන් අතර විශ්වසනීයත්වය ඇති කිරීම සම්බන්ධයෙන් අතිශය වැදගත්කමක් දරන බව හඳුනාගෙන තිබේ. තවදුරටත්, එය ආර්ථික ස්ථාවරභාවය, වර්ධනය සහ ප්‍රජාතාන්ත්‍රික ආයතන වල මනා ක්‍රියාකාරිත්වයටත් වැදගත් වන බව අවධාරණය කර තිබේ.

මේ සම්බන්ධයෙන් ජනතාව සඳහා තිබෙන ප්‍රජාතන්ත්‍රීය අවකාශය කැප නොකර, නව ක්‍රම යොදා ගනිමින්, ජාතික ආරක්ෂාව තහවුරු කිරීමට ජාතික ප්‍රතිපත්ති රාමුව ප්‍රමුඛතාව ලබා දී තිබේ. ඒ අනුව මෙහි අරමුණ වන්නේ, ත්‍රිවිධ හමුදාවට නව තාක්ෂණික පහසුකම් ලබා දෙමින්, බුද්ධි අංශ ශක්තිමත් කරමින්, විදේශ බුද්ධි අංශ සමඟ සමීප සහයෝගිතාව තහවුරු කර ගනිමින්, ත්‍රිවිධ හමුදාවේ සිටින හටයන්ගේ වෘත්තීමය හැකියාවන් ප්‍රවර්ධනය කිරීමයි. ත්‍රිවිධ හමුදාවේ නාවික පෙරමුණ තවදුරටත් ශක්තිමත් කිරීමට ප්‍රමුඛතාව ලබා දීම ද මෙයින් බලාපොරොත්තු වේ.

අනෙක් අතට, මත් උවදුර මර්දනය කිරීමට සහ රට ජාත්‍යන්තර නීතිවිරෝධී මත් කුඩු ජාවාරම්කරුවන්ගේ කේන්ද්‍රස්ථානයක් වීම වැළැක්වීම සම්බන්ධයෙන් විවිධ ක්‍රියාමාර්ග යෝජනා කර තිබෙන අතර, රේගුවට නවතම තාක්ෂණය හඳුන්වා දීම, පොලිසිය සහ ත්‍රිවිධ හමුදාව බල ගැන්වීම සහ මතට ඇබ්බැහිවූවන් සඳහා පුනරුත්ථාපන වැඩසටහන් ආදිය ඒ අතර වේ.

තවදුරටත්, ශ්‍රී ලංකා හමුදාවට සහ ගුවන් හමුදාවට ඔවුන් විසින් සිදුකරන ආපදා කළමනාකරණය ඇතුළු බහුවිධ කාර්යයන් තුළ උපකරණ සහ යටිතල පහසුකම් සම්බන්ධ කෙටි කාලීන අවශ්‍යතා ද එමගින් සළකා බලා තිබේ. එසේම මෙම ප්‍රතිපත්ති ලේඛනය ත්‍රිවිධ හමුදාවේ විශ්‍රාමික සාමාජිකයන් ගේ ශුභසාධන අවශ්‍යතා සපුරාලීම සඳහා වන යෝජනා වලින් ද සමන්විත වේ.

රූපසටහන 2.1.2.1: ජාතික ආරක්ෂාව ප්‍රමුඛතාවල සාරාංශය



මූලාශ්‍රය: ජාතික ප්‍රතිපත්ති රාමුව: සෞභාග්‍යයේ දැක්ම

2.1.3 ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන් අයවැය සමඟ ගැලපීම

යෝජිත අයවැය, "සෞභාග්‍යයේ දැක්ම" සමඟ ගැලපීම සහ පරස්පර වීම යන දෙකම 2021 අයවැය ප්‍රතිපාදන විසින් නිරූපනය කරයි. විශ්‍රාමික හෝ ආබාධිත කරුණු සාමාජිකයන් හෝ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සඳහා වූ ඉහත සඳහන් කරන ලද සුබසාධන මධ්‍යස්ථාන සඳහා 2021 අයවැය තුළ සැලකිය යුතු ප්‍රතිපාදන වෙන් කොට ඇති අතර, රණවිරු මාපිය රැකවරණ දීමනාව සහ හමුදා සාමාජිකයන් සඳහා විශ්‍රාම ප්‍රතිලාභ ආදී වියදම් සඳහා ඉන් 56% ක කොටසක් ලබා දී ඇත. එසේම ආරක්ෂක මූලස්ථානය ඉදිකිරීම් සම්පූර්ණ කිරීම සහ යුධ හමුදා රෝහල ඇතුළු හමුදාවල

යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා වියදම් වලින් සැලකිය යුතු කොටසක් වෙන් කොට ඇත. හමුදාවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා වූ මුළු ප්‍රතිපාදන ප්‍රමාණය මුළු වියදමින් 15.4% කි. රටේ බුද්ධි සේවාව සංවර්ධනය කිරීම සහ ශක්තිමත් කිරීම බෙහෙවින් වැදගත් වුවත්, ඒ සඳහා වන ප්‍රතිපාදන අයවැය ඇස්තමේන්තු තුළ දක්වා නොමැත.

අභ්‍යන්තර ආරක්ෂාව, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය ආපදා මෙහෙයුම් සහ කළමනාකරණය පිළිබඳ වගකීම දරන හෙයින්, ආපදා කළමනාකරණය සඳහා වූ ප්‍රතිපාදන වියදම් කාණ්ඩය තුළට ගෙන ඇති අතර ඒ සඳහා රුපියල් මිලියන 2,150 ක මුළු මුදල් ප්‍රමාණයක් එනම්, මුළු ආරක්ෂක වියදම් වලින් 2.9%ක් වෙන් කොට ඇත. රටේ දරුවන් ඇතුළු සමාජයේ සියළු කොටස් වලට විශාල බලපෑමක් එල්ල කොට ඇති මත්ද්‍රව්‍ය උවදුර මැඩලීම සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ ඇති මූලික අංගයක් වුවත්, රට පුරා පැතිර පවතින මත්ද්‍රව්‍ය උවදුරේ ස්වභාවය සලකා බැලූ විට ඒ සඳහා වෙන් කොට ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් ද නැද්ද යන්න ප්‍රශ්නකාරී ය.

2.1.4 නිරීක්ෂණ සහ නිගමන

සෞභාග්‍යයේ දැක්ම විසින් නිවැරැදිව සපයා දී ඇති පරිදි ජාතික ආරක්ෂාව වෙනුවෙන් කරනු ලබන මුදල් වෙන් කිරීම අතිශය වැදගත්ය. හමුදා යටිතල පහසුකම් සංවර්ධනය සහ හමුදා පවුල් වල සමාජිකයන්ගේ සුභසාධනය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම තහවුරු කරන අතරම, ශ්‍රී ලංකා හමුදාව සඳහා දිගුකාලීන මූලෝපාය සංවර්ධනය වෙනුවෙන් ආයෝජනය සිදු කිරීම 2021 මුදල් වර්ෂය සඳහා යෝජිත අයවැය වෙන් කිරීම තුළ දක්නට නොමැත. යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ විශාල කොටසක් ස්ථාවර යටිතල පහසුකම් ඉදිකිරීම සහ වත්මන් හා අතීත හමුදා සාමාජිකයන් හා ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන්ගේ සුභ සාධනය තහවුරු කිරීම සඳහා වෙන් කොට ඇති අතර, රට පුරා පැතිරුණු වෛද්‍ය උපදෙස් සහ අපරාධ මැඩලීම වෙනුවෙන් වෙන් කොට ඇති මුදල් ප්‍රමාණය සාපේක්ෂ වශයෙන් කුඩා ය.

කෙසේ වෙතත්, බුද්ධි සේවාවන් ශක්තිමත් කිරීම සඳහා සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ ප්‍රමුඛතාව ලබාදී තිබුණද, රටේ සමස්ත ආරක්ෂාව තහවුරු කිරීම සම්බන්ධයෙන් එහි වැදගත්කම හමුවේත් එවන් කාර්යයක් සඳහා මුදල් නිසි ලෙස සම්බන්ධ කළ නොහැකිය.

සමස්තයක් ලෙස ගත් කල, ප්‍රතිපාදන මගින් පෙන්නුම් කරනු ලබන එක් කරුණක් වන්නේ, ජාතික ආරක්ෂාව සඳහා වූ භෞතික ප්‍රාග්ධනය වෙනුවෙන් අවධානය යොමු කොට ඇති බවත්, ජාතික ආරක්ෂාවේ ගුණාත්මකභාවය සහ අනාගත ආදී පැති කඩන් ආමන්ත්‍රණය කිරීම තවදුරටත් සිදුවිය යුතු බවත්ය.

1.1 උපලේඛණ

2.1.1 ජාතික ආරක්ෂාව සඳහා වූ ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන්

ආංශික ප්‍රතිපත්ති සහ ප්‍රතිපත්ති සංඝටකය	මූලෝපායයන්	ක්‍රියාකාරකම්
ජාතික ආරක්ෂාව සඳහා ඉහළ මූල්‍යකරණය	සන්නද්ධ හමුදාවල සහ පොලිසියේ බුද්ධි සේවාවන් ශක්තිමත් කිරීම	✓ දක්ෂ නිලධාරීන් බඳවා ගැනීම ✓ සියළු ආයතන සම්බන්ධීකරණය කිරීම සඳහා ප්‍රමාණවත් බලතල සහිත ජාතික බුද්ධි ප්‍රධානී තනතුරක් ඇති කිරීම
	ජාත්‍යන්තර බුද්ධි ආයතන සමඟ සම්බන්ධ කිරීම	✓ නවීන තාක්ෂණය පිළිබඳ දේශීය හා විදේශීය පුහුණු සපයාදීම. ✓ නවීන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කිරීම පිළිබඳව බුද්ධි නිලධාරීන් පුහුණු කිරීම.
	හමුදාවල චිත්ත ධෛර්යය නැවත ගොඩගැනීම	✓ ස්වකීය රාජකාරිය නොබියව සෞඛ්‍ය ආරක්ෂක ලෙස සහ දේශපාලන මැදිහත්වීම් වලින් තොරව සිදු කිරීමට හැකිවන පරිදි නෛතික ආරක්ෂාව තහවුරු කිරීම.
	සියළු පුරවැසියන්, විශේෂයෙන් කාන්තාවන් සහ ළමුන් සඳහා රට ආරක්ෂාකාරී සහ සුරක්ෂිත බවට පත් කිරීම.	✓ රට ජාත්‍යන්තර තර්ජනවලින්, මත්ද්‍රව්‍ය ජාවාරම් වලින්, මුදල් විශුද්ධිකරණයෙන් සහ අනෙකුත් වසංගත වලින් හා සයිබර් ප්‍රහාරයන්ගෙන් ආරක්ෂා කිරීම

	ආයෝජකයන් සඳහා නිදහස් පරිසරයක් නිර්මාණය කිරීම	✓ සියළු අන්දමේ අල්ලස්, දූෂණය සහ බියවැද්දීම් වැළැක්වීම
	ත්‍රස්තවාදය සහ අන්තවාදය පෝෂණය කරනු ලබන සියළු ව්‍යූහයන් විනාශ කර දැමීම	✓ අප්‍රේල් 21 ප්‍රහාරය විමර්ශනය කිරීම සඳහා ස්වාධීන කොමිෂන් සභාවක් පත් කිරීම, අපරාධකරුවන් අනාවරණය කිරීම සහ නීතියට අනුව කඩිනමින් වරද කරුවන් හට දඩුවම් ලබාදීම. ✓ අප්‍රේල් 21 ප්‍රහාරයේ තුවාල කරුවන් හට ප්‍රතිකාර කිරීම සඳහා (විදේශීය ප්‍රතිකාර ද ඇතුළුව), රජය විසින් පූර්ණ සහයෝගය ලබා දීම. ✓ ස්ථීර ලෙස ආබාධිත බවට පත් වූ පුද්ගලයන් සඳහා දිගුකාලීන ප්‍රතිකාර පද්ධතියක් ක්‍රියාවට නැංවීම. ✓ එම ප්‍රහාරය හේතුවෙන් අනාථ බවට පත් වූ ළමුන් සඳහා මාසික මූල්‍ය සහාය ලබාදීම. ✓ අප්‍රේල් 21 ප්‍රහාරයෙන් පීඩාවට පත් වූ පවුල් සඳහා වන්දි ලබා දීම.
මත්ද්‍රව්‍ය වලින් බොර රටක්	රට තුළට මත්ද්‍රව්‍ය ගලා ඒම නැවැත්වීම.	✓ රේගුව සහ අනෙකුත් දේශ සීමා අධිකාරිය සඳහා හරිත තාක්ෂණය සපයාදීම. ✓ මත්ද්‍රව්‍ය ජාවාරම් කිරීම වැළැක්වීම සඳහා පොලිසිය සහ ත්‍රිවිධ හමුදාව බලාත්මක කිරීම. ✓ රටින් මත්ද්‍රව්‍ය තුරන් කිරීම සඳහා මහජන සහභාගීත්වය ලබා ගැනීම.
	හානිකර මත්ද්‍රව්‍ය වෙතින් පාසල් ළමුන් ආරක්ෂා කිරීම.	✓ මත්ද්‍රව්‍ය වල ගොදුරක් බවට පත්ව ඇති දරුවන් පුනරුත්ථාපනය කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම. ✓ ළමුන් පහසුවෙන් මත්ද්‍රව්‍ය වෙත ආකර්ෂණය කර ගැනීමට ඇති සියළු ස්ථාන සඳහා නිති සුපරීක්ෂණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.
	මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වී ඇති සියළු පුද්ගලයන් පුනරුත්ථාපනය කිරීම තහවුරු කිරීම.	✓ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වීම මැඩපැවැත්වීම සඳහා වෛද්‍ය සහාය සපයාදීම ✓ නවීන ප්‍රතිකාර පහසුකම් සහිත පුනරුත්ථාපන මධ්‍යස්ථාන හතරක් දිවයින පුරා ස්ථාපිත කිරීම
ආරක්ෂිත සේවා -සුරක්ෂිත සේවා පරිසරයක්	සන්නද්ධ හමුදා සාමාජිකයන්ගේ, පොලිසියේ සහ සිවිල් ආරක්ෂක බලකායේ අභිමානය ප්‍රතිෂ්ඨාපනය කිරීම	✓ ව්‍යාජ චෝදනා මත සිරගත කරනු ලැබ ඇති පුද්ගලයන් කඩිනමින් නිදහස් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම. ✓ වැටුප්, දීමනා සහ උසස්වීම් වල පවතින විෂමතාවයන් ඉවත් කිරීම ✓ බැරැක්ක සහ නවාතැන් පහසුකම් සපයාදීම සඳහා අවශ්‍ය පියවර ගැනීම. ✓ විශ්‍රාමික හමුදා සාමාජිකයින් ඇතුළු සියළු සන්නද්ධ හමුදා සාමාජිකයන් සඳහා වෛද්‍ය පහසුකම් සපයාදීම සහ ඒවා වැඩි දියුණු කිරීම. ✓ එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදාවල සේවය කිරීමේ අතිරේක ඉඩප්‍රස්ථාව සපයාදීම. ✓ සේවයේ යෙදී සිටින හා ආබාධිත බවට පත්ව ඇති හමුදා සාමාජිකයින් සහ මියගිය හමුදා සාමාජිකයින්ගේ කලත්රයන් හෝ දරුවන් සඳහා සහනදායී නිවාස ණය සපයාදීම. ✓ දැනට පවතින ණය යෝජනා ක්‍රම සමාලෝචනය කිරීම සහ ප්‍රමාදයන් ඉවත් කිරීම. ✓ අත්හිටුවනු ලැබ ඇති විදේශීය පුහුණු ඉඩප්‍රස්ථා සපයාදීම.
ජනතාවට මිත්‍ර පොලිස් සේවයක්	පොලිස් නිලධාරීන්ගේ දැනුම හා කුසලතා ඉහළ දැමීම	✓ පොලිස් විශ්ව විද්‍යාලයක් ස්ථාපිත කිරීම
	වඩා ශක්තිමත් සුබසාධන පහසුකම් තහවුරු කිරීම	✓ රාජකාරිය ඉටු කිරීම සඳහා අවශ්‍ය සියළු පහසුකම් සපයාදීම.

		✓ පොලිස් ස්ථානවල ස්ථාන භාර නිලධාරීන් පත් කිරීම සඳහා වඩාත් විනිවිද පෙනෙන සුළු ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම. ✓ කාර්ය සාධන සමාලෝචන සහ දක්ෂතාවය මත පමණක් පදනම්ව උසස්වීම් ලබාදීමේ ක්‍රමවේදයක් ආරම්භ කිරීම. ✓ කිසිදු පොලිස් නිලධාරියෙකු පැය 8 කට වැඩි කාලයක් සේවයේ නොයෙදෙන බව තහවුරු කිරීම සඳහා බදවාගැනීම් තුළ පවතින සියළු හිඩැස් පිරවීම. ✓ තමන්ගේම නිවසේ සිටින රාජකාරි වෙත ගමන් කළ හැකි වන පරිදි ප්‍රමාණවත් නිවාස පහසුකම් ඉදි කිරීම. ✓ සන්නද්ධ හමුදා වලට සපයා දෙනු ලබන අයුරින් ආහාර දීමනා සහ අනෙකුත් දීමනා ඉහළ දැමීම. ✓ ක්ෂේත්‍ර විමර්ශන සිදුකරනු ලබන පොලිස් නිලධාරීන් සඳහා යතුරු පැදි සපයා දීම. ✓ දැනට පවතින සුබසාධන පහසුකම් තුළ සුදුසු ගැළපීම් සිදුකිරීම. ✓ පොලිස් ක්‍රීඩා සංගම් සහ සංගීත කණ්ඩායම් සඳහා අවශ්‍ය සහාය සපයා දීම.
සිවිල් ආරක්ෂණ බලකාය		✓ දිගු කාලසීමාවක් සඳහා සිය පදිංචි දිස්ත්‍රික්කයෙන් බැහැරව ස්ථාන මාරු කිරීම් සිවිල් ආරක්ෂක බලකා සාමාජිකයින් හට තහවුරු කිරීම
සන්නද්ධ හමුදාවල සේවකයන් සිටුගැනීම	සන්නද්ධ හමුදාවල සුබසාධන පහසුකම් තහවුරු කිරීම	✓ ආබාධිත සෙබළුන් ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම සහ ගෙවීමට ඇති හිඟ වැටුප් ගෙවීම. ✓ ස්ථිර ලෙස ආබාධිත තත්ත්වයට පත්ව ඇති සෙබලුන් හට සිය ජීවිත කාලය තුළදීත්, ඔවුන්ගේ මරණයෙන් පසු යැපෙන්නන් හටත් වැටුප ලබා ගැනීමට ඇති හිමිකම තහවුරු කිරීම. ✓ ආබාධිත සෙබළුන්ගේ වැටුපින් අඩු කරගනු ලබන සියළු කපා ගැනීම ඉවත් කිරීම. ✓ අභි මණ්ඩල ආදී පුනරුත්ථාපන මධ්‍යස්ථාන ඉදිකිරීම. ✓ යුද්ධයේදී අත්පා හිමි වූ පුද්ගලයින් හට රජයේ වියදමින් කෘතිම අත් පා ලබා ගැනීම සඳහා වූ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.

2.4 ජනතා පැතුම් ඉටු කරන නව ව්‍යවස්ථාව - (ප්‍රතිපාදන වෙන් කර නොමැත)

2.5 ඵලදායී පුරවැසියන් සහ ශක්තිමත් මානව සම්පතක්

2.5.1 සෞඛ්‍ය වියදම් සාරාංශය

ශ්‍රී ලංකා රජයේ සෞඛ්‍ය ක්ෂේත්‍රයෙහි වියදම් සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහ: 1) දේශීය වෛද්‍ය ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය සහ, 2) ඖෂධ නිෂ්පාදන සැපයුම් හා නියාමන යන රාජ්‍ය අමාත්‍යාංශ දෙකෙහි වියදම් වලින් සමන්විත වේ. ක්ෂේත්‍ර අතර අය වැය වෙන් කිරීම් වල විස්තරාත්මක සංඛ්‍යාලේඛණ 2.5.1 වගුවේ දක්වා ඇත. සෞඛ්‍යය වෙනුවෙන් වෙන් කොට ඇති මුළු මුදල (රුපියල් මිලියන 223,285) 2021 දළ දේශීය නිෂ්පාදිතයෙන් 1.27%ක් වේ. මෙය 2019 [3] වර්ෂයේදී රජය විසින් සෞඛ්‍ය ක්ෂේත්‍රය වෙනුවෙන් වෙන් කරන ලද මුදලට (ද. දේ.නි. 1.5%) වඩා අඩු ප්‍රමාණයකි.

[3] 2019 වර්ෂයේ මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව පදනම්ව අගය ගණනය කෙරේ. 2019 සංඛ්‍යා රජයේ වියදම් වල ක්‍රියාකාරී වර්ගීකරණය මත පදනම් වන හෙයින් හා 2024 සංඛ්‍යා අමාත්‍යාංශ වෙත කෙරෙන ප්‍රතිපාදන මත පදනම් වන හෙයින් සැසඳීම තත්ය නොවිය හැක.

2.5.1 වගුව : අමාත්‍යාංශ අතර සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අය වැය වෙන් කිරීම (රු. මිලියන)			
අමාත්‍යාංශය / රාජ්‍ය අමාත්‍යාංශය (රා.අ.)	**පුනරාවර්තන**	**ප්‍රාග්ධන**	**එකතුව**
සෞඛ්‍ය අමාත්‍යාංශය	128,481	30,995	159,476
ඖෂධ නිෂ්පාදන, සැපයුම් හා නියාමන යන රාජ්‍ය අමාත්‍යාංශය	60,660	500	61,160
දේශීය වෛද්‍ය ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය	2,144	505	2,649
එකතුව	191,285	32,000	223,285
2021 විසර්ජන පනතේ ප්‍රතිශතයක් ලෙස (%)			8.3
අපේක්ෂිත ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස (%)			1.3
මූලාශ්‍රය: 2021 මුදල් වර්ෂය සඳහා විසර්ජන පනත් කෙටුම්පත			

2021 මුදල් වර්ෂය සඳහා වූ විසර්ජන පනත් කෙටුම්පත තුළ දක්වා ඇති පරිදි සෞඛ්‍ය ක්ෂේත්‍ර සඳහා මධ්‍යම රජයේ සෘජු ප්‍රතිපාදන රුපියල් බිලියන 223 ක් වන අතර එය අයවැයෙන් 8.3% කි. [4] මෙය මීන් පෙර වසරේ 5.5% - 6.0%ක් සමග සැසඳීමේදී සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අය වැය වෙන් කිරීම සැලකිය යුතු ඉහළ යාමකි. කෙසේ වෙතත්, 2020 සහ 2021 වසර වල සෞඛ්‍ය ක්ෂේත්‍රය සඳහා ප්‍රාග්ධන වෙන්කිරීම් රුපියල් බිලියන 35 ක් පමණය. මෙය 2018 සහ 2019 වසරවල වෙන් කිරීම් වලට වඩා අඩු ප්‍රමාණයකි. (2.5.1 වගුව බලන්න).

2.5.1 රූප සටහන: සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අය වැය වෙන් කිරීම - 2017 – 2021



මූලාශ්‍රය : 2019 අනුමත අයවැය ඇස්තමේන්තු සහ 2020 සහ 2021 මුදල් වර්ෂ සඳහා වූ විසර්ජන පනත් කෙටුම්පත මත පදනම් වූ IPS සම්පාදනය

රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන් ට අනුකූල වන ලෙස ප්‍රතිසංවිධානය කරන ලද 2021 අයවැයේ විශේෂ වැදගත්කමක් සහිත කරුණු 2.5.2 වගුව තුළ දක්වා ඇත. එහි දක්වා ඇති පරිදි අයවැයේ විශාල කොටසක් (72%) වෙන් වී ඇත්තේ සියළු රෝහල් වෙත නොමිලේ ඖෂධ ලබාදීම සඳහාය. අයවැයෙන් 12% ක් පමණ වැඩිහිටියන් සඳහා මූල්‍යාධාර සපයා දීම සඳහාය. එසේම සෞඛ්‍ය යටිතල පහසුකම් (10%) රෝග වැළැක්වීම වෙනුවෙන් (7%) සාපේක්ෂ වශයෙන් කුඩා කොටස් වෙන්ව ඇත.

[4] 2019 වර්ෂයේ මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව පදනම්ව අගය ගණනය කෙරේ. 2019 සංඛ්‍යා රජයේ ව්‍යදම් වල ක්‍රියාකාරී වර්ගීකරණය මත පදනම් වන හෙයින් හා 2024 සංඛ්‍යා අමාත්‍යාංශ වෙත කෙරෙන ප්‍රතිපාදන මත පදනම් වන හෙයින් සැසඳීම නත්ය නොවිය හැක.

2.5.2 වගුව : සෞඛ්‍ය ක්ෂේත්‍ර සඳහා 2021 අයවැයේ විශේෂ අවස්ථා		
	රු. මිලියන	**බෙදාදීම (මුළු මුදලෙන් %)**
සෞඛ්‍ය යටිතල පහසුකම්	8,124	9.65
ළමා හා මාතෘ රැකවරණ රෝහල වැඩිදියුණු කිරීම	1,690	
පිළිකා ප්‍රතිකාර රෝහල් 10 ක් ඉදිකිරීම	660	
වකුගඩු කාන්දු පෙරීම් මධ්‍යස්ථාන 12ක් ඉදිකිරීම	1,010	
ශ්‍රී ලංකා ජාතික රෝහල ජාත්‍යන්තර ප්‍රමිතීන් දක්වා උස් ශ්‍රේණිගත කිරීම	510	
සෑම දිස්ත්‍රික්කයකම එක රෝහලක් උත්ශ්‍රේණිගත කිරීම	4,115	
ICTA හරහා රජයේ රෝහල වල විද්‍යුත් වෛද්‍ය වාර්තා	100	
ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය කිරීම සඳහා ඖෂධ පැළැටි ප්‍රවර්ධනය කිරීම	39	
සෞඛ්‍ය වැළැක්වීම	5,541	6.58
ත්‍රිපෝෂ වැඩසටහන	2,700	
බෝ නොවන රෝග නිවාරණය සහ පාලනය	665	
කොවිඩ් – 19 සේවා සහ බෝවන රෝග වැළැක්වීම	2,176	
ගුණාත්මක ඖෂධ සියළු රෝහල් වෙත නොමිලේ සැපයීම	60,500	71.88
වයස අවුරුදු 70ට වැඩි වැඩිහිටියට සඳහා මූල්‍යාධාර	10,000	11.88
එකතුව	84,165	100.00
මූලාශ්‍රය : 2021 මුල්වර්ෂය සඳහා අයවැය විශේෂ අවස්ථා		

2.5.2 සෞඛ්‍ය අයවැය උපකල්පනයන්

අයවැය ඇස්තමේන්තු සකස් කරන විටදී උපකල්පනයක් පිළිබඳව ඇත්තේ සීමාසහිත තොරතුරුය. ආදායම පැත්තෙන් බැලූ කළ, 2021 වසර තුළ දී මත්පැන් දුම්වැටි සහ සීනි බදු ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේවෙතත්, බදු අනුපාතයන්ගේ සංශෝධන පිළිබඳව තොරතුරු ලබා නොදෙන බැවින්, නව ආදායම් ඇස්තමේන්තු වල උපකල්පනයන් ගේ සාධාරණ භාවය පිළිබඳව අදහස් දැක්විය හැකි නොවේ. අයවැය කතාවේ වියදම් සාරාංශය තුළ මහජන සෞඛ්‍යය සඳහා රුපියල් මිලියන 18,000ක් වෙන් කරනු ලබන බව සඳහන් වේ. එය අයවැය කථාව තුළ සඳහන්ව නොමැත.

2.5.3 සෞඛ්‍ය ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන්

සෞභාග්‍යයේ දැක්ම රජයේ ප්‍රතිපත්ති රාමුව විසින් සෞඛ්‍යය, මානව සංවර්ධන කුළුණක් ලෙස පිළිගන්නා අතර, රට පුරා සෞඛ්‍ය රැකවරණය (බටහිර, දේශීය හා ආයුර්වේද) ඉහළ නැංවීමේ අවශ්‍යතාවය අවධාරණය කරයි. ප්‍රතිකාර වලට පමණක් නොව රෝග නිවාරණයට ද අවධානය යොමු කරන අතර, ආහාර වල ගුණාත්මක භාවය ඉහල දැමීම, ආහාර ගැනීමේ චර්යාවන් වර්ධනය කිරීම, වාතය, ජලය සහ භූමිය දූෂණය වීම වැළැක්වීම මෙන්ම දුම්කොළ, මධ්‍යසාර සහ සීනි අධික ආහාර පරිභෝජනය අවම කිරීම ද, ඒ තුළ අවධාරණයට ලක් කරනු ලබයි. සියළු පුරවැසියන් හට සිය නිවෙස් වලට ආසන්නයේ ඇති සෞඛ්‍ය රැකවරණ මධ්‍යස්ථාන වෙතින් නොමිලේ සේවාවන් ලබා ගැනීම පිණිස රට තුළ සෞඛ්‍ය යටිතල පහසුකම් ඉහළ දැමීම කෙරෙහි ද සෞභාග්‍යයේ දැක්ම තුළ අවධානය යොමු කොට ඇත.

2021 අයවැය කථාවට අනුව, කොවිඩ්-19 වසංගතයෙන් මෙන්ම, බෝ නොවන රෝගවලින් ජනතාව ආරක්ෂා කර ගැනීම ඵලදායී ලෙස සිදු කළ හැකි වන පරිදි සෞඛ්‍ය සේවාවන් පුළුල් කිරීම රජයේ සමාජ සංවර්ධන වැඩසටහන තුළ ඇති එක් මූලික අරමුණකි.

2.5.4 අයවැය, ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන් සමඟ ඒකාබද්ධ කිරීම

වියදම් වලින් 72%ක් පමණ වෙන් වන්නේ රජයේ රෝහල් සඳහා නොමිලේ ඖෂධ ලබාදීමටයි. (2.5.2 වගුව බලන්න) සෞභාග්‍යයේ දැක්ම හා සමගාමීව යමින් 2021 අයවැය යෝජනා විසින් සෞඛ්‍ය සේවාවන් වැඩිදියුණු කිරීමේ හා කොවිඩ්-19 ආදී වසංගත වලින් මෙන්ම බෝවන රෝග හා බෝ නොවන රෝග වලින් ඵලදායී ලෙස ජනතාව ආරක්ෂා කරගැනීමේ වැදගත්කම පිළිගෙන ඇත. කෙසේ වෙතත්, කොවිඩ්-19 මැඩපැවැත්වීමේ ප්‍රයත්නයන් ඇතුළු නිවාරණ පියවරයන් වෙනුවෙන් වෙන් කොට ඇත්තේ අයවැයෙන් 7% කට අඩු ප්‍රමාණයකි. ආයුර්වේදය ප්‍රවර්ධනය කිරීමේ වැදගත්කම අය-වැය තුළින් සඳහන් වුවද මෙම ක්ෂේත්‍රය සඳහා වෙන් කොට ඇත්තේ ඉතා සුළු මුදල් ප්‍රමාණයකි. (අයවැය විශේෂ අවස්ථාවල අයවැයෙන් 0.5% කට අඩු).

රටේ සෞඛ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය සෞභාග්‍යයේ දැක්ම විසින් අවධාරණය කරයි. ජාතික රෝහල ජාත්‍යන්තර මට්ටම දක්වා උත්ශ්‍රේණිගත කිරීමේ සහ සෑම දිස්ත්‍රික්කයකම එක් රෝහලක් උත්ශ්‍රේණිගත කිරීමේ මෙන්ම, බෝ නොවන රෝග සඳහා වන ප්‍රතිකාර සේවාවන් ලබා දීමේ අපේක්ෂා සහගත සැලසුම් හමුවේ වෙන් කොට ඇති රුපියල් මිලියන 8,124ක මුදල ප්‍රමාණවත් විය හැකිය. 2021 අයවැය කථාව තුළ හඳුනාගෙන ඇති වියදම් විෂයයන් සමඟ තථ්‍ය ලෙසට සිතියම් ගත කළ නොහැකිය. සෞඛ්‍යය සේවාවන් ඉහළ දැමීම අරමුණු කොටගත් නව වැඩසටහන් ගණනාවක් ශ්‍රී ලංකා රජය විසින් සිය අයවැය කථාව තුළ යෝජනා කොට ඇත. (පහත 2.5.3 බලන්න). මින් එකක් වන්නේ, ග්‍රාමීය සෞඛ්‍ය සේවාව ඉහළ දැමීමයි. විවිධ ප්‍රදේශ තුළ පිහිටා ඇති ග්‍රාමීය රෝහල් විශාල සංඛ්‍යාවක් වැඩි දියුණු කිරීම සඳහා වෙන් කොට ඇති රුපියල් මිලියන 5,000ක මුදල ප්‍රමාණවත් නොවිය හැක. (උදා: බෙහෙත්ශාලා, මාතෘ සායන ආදී).

2.5.3 වගුව : රජයේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අයවැය වෙන් කිරීම - අයවැය කථාව 2021	
සෞඛ්‍ය රැකවරණ මධ්‍යස්ථාන සංවර්ධනය කිරීමේ වැඩසටහන	ජනතා කේන්ද්‍රීය සෞඛ්‍ය සේවය - රු. මිලියන 10,000 සෞඛ්‍ය රැකවරණ මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම - රු. මිලියන 18,000
	ග්‍රාමීය රෝහල්, බෙහෙත් ශාලා සහ මාතෘ සායන වැඩිදියුණු කිරීම - රු. මිලියන 5,000
ළමා පෝෂණය ඉහළ දැමීම	ළදරුවන්ගේ සහ ගර්භනී මවුවරුන්ගේ පෝෂණය සංවර්ධනය කිරීම - ත්‍රිපෝෂ නිෂ්පාදනය - රු. මිලියන 1,500
මූලාශ්‍රය : 2021 අයවැය කථාව	

2.5.5 සෞඛ්‍යය පිළිබඳ නිරීක්ෂණ සහ නිගමන

සෞඛ්‍ය ක්ෂේත්‍රය වැඩි දියුණු කිරීම සහ පුළුල් කිරීම සඳහා ඉදිරිපත් කොට ඇති අපේක්ෂා සහගත සැලසුම් හමුවේ එම ක්ෂේත්‍රය සඳහා වෙන් කොට ඇති අයවැය ප්‍රතිපාදන සීමාසහිතය. ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස මෙන්ම (3.4.2 වගුව බලන්න) මුදල් වෙන් කිරීම යන දෙයාකාරයෙන්ම 2020 වසරට සාපේක්ෂව 2021 වසර තුළ සෞඛ්‍ය ක්ෂේත්‍රය සඳහා වන මුළු මුදල් වෙන් කිරීම පහළ ගොස් ඇත.

2.5.2 රූප සටහන: සෞඛ්‍ය අංශයට අයවැය මුදල් වෙන්කිරීම – 2017-2021



මූලාශ්‍ර: 2019 මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව සහ 2020 සහ 2021 මුදල් වර්ෂය වෙනුවෙන් විසර්ජන පනත් කෙටුම්පත මත පදනම්වූ ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන සම්පාදනය.

අයවැයෙන් විශාල පංගුවක් (72%) රෝහල් වලට ඖෂධ සැපයීම සඳහා වෙන් කරනු ලැබේ. එහි ප්‍රතිඵලයක් ලෙස, සෞඛ්‍යයට අදාල වැළැක්වීමේ ක්‍රියාමාර්ග සහ සෞඛ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය සම්බන්ධයෙන් සෞභාග්‍යයේ දැක්ම දැක්මෙහි අනෙකුත් ඉලක්ක සපුරා ගැනීම වෙනුවෙන් තිබෙන අරමුදල් සීමිතව ඇත. 2021 අයවැය කථාව, දේශීය වශයෙන් ඖෂධ නිෂ්පාදනය කිරීම අවධාරණය කරයි. ඖෂධ නිෂ්පාදන, සැපයුම් සහ නියාමන රාජ්‍ය අමාත්‍යාංශය අඩක් මෙම අරමුණ ඇතිව ස්ථාපනය කරනු ලැබ ඇත. සෞඛ්‍ය අයවැයෙන් සැලකිය යුතු කොටසක් (29%) මෙම අමාත්‍යාංශයට වෙන් කෙරේ. දේශීයව නිෂ්පාදනය කිරීමෙන්, රෝහල් වලට ඖෂධ සැපයීම සඳහා අවශ්‍ය වියදම් අඩුකිරීමේ හැකියාව ඇත.

ආයුර්වේද සහ දේශීය වෛද්‍ය ක්‍රම සංවර්ධනය වෙනුවෙන් ප්‍රමාණවත් මුදල් වෙන් කිරීම් සිදු නොවේ. සෞඛ්‍ය අංශය වෙනුවෙන් වන මුළු අයවැයෙන් 70% ට වැඩි ප්‍රමාණයක් සහ සංවර්ධන ක්‍රියාකාරකම් වෙනුවෙන් මුදල් වෙන් කිරීම් වලින් 93% ක්ම සෞඛ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් වෙන් කරනු ලැබේ. දේශීය සහ ආයුර්වේද වෛද්‍ය ක්‍රම වල වැඩි දියුණු කිරීම් අයවැය කථාව පැහැදිලිව ප්‍රකාශ කළද, දේශීය වෛද්‍ය ප්‍රවර්ධන, ග්‍රාමීය සහ ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශයට වෙන් කරනු ලබන්නේ වියදමින් 1% ට අඩු ප්‍රමාණයකි.

2021 අයවැය කථාවෙහි වියදම් අයිතම අයවැයෙහි විශේෂ කරුණු සමඟ තත්ත්වාකාරයෙන් ගැලපීමට හැකියාවක් නොමැත (2.5.2 සහ 2.5.3 වගු බලන්න). තවද, සෞඛ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා අයවැය සාරාංශයෙහි දක්වා තිබෙන රු.මිලියන 18,000 අයවැය කථාවෙහි සඳහන්ව නොමැත.

ලෝක සෞඛ්‍ය සංවිධානයට අනුව, දුම්කොළ සහ සීනි යොදා පැනිරස කරන ලද පාන වර්ග වලට බදු පැනවීම බෝ නොවන රෝග වැළැක්වීමේ සඵලදායක ක්‍රමයකි. බෝ නොවන රෝග වැළැක්වීම ප්‍රමුඛතාවක් ලෙස අයවැයෙහි සඳහන්ව තිබුණ ද, මෙම අරමුණ ඉටු කර ගැනීමේ පිරිවැය ඵලදායක ක්‍රම විමසා බැලීම සිදු නොවේ.

2.5.6 අධ්‍යාපන වියදම් සාරාංශය (මුදල් වෙන් කිරීම් සහ වසරින් වසර වෙනස් වීම) 2018 සිට 2021 දක්වා

ශ්‍රී ලංකා රජය අධ්‍යාපන අංශය වෙනුවෙන් වෙන් කරන මුදල් අධ්‍යාපන අමාත්‍යාංශය සහ තවත් රාජ්‍ය අමාත්‍යාංශ හතරක්, එනම්: 1) කාන්තා සහ ළමා සංවර්ධන, පෙර පාසල් සහ ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා; 2) කුසලතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නවෝත්පාදන; 3) දහම් පාසල්, පිරිවෙන් සහ භික්ෂු අධ්‍යාපන; 4) අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්ව විද්‍යාල සහ දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන වෙනුවෙන් වෙන්ව පවතී. අමාත්‍යාංශ අතර අයවැය මුදල් වෙන්කිරීම පිළිබඳ විස්තරාත්මක සංඛ්‍යාලේඛන 2.5.4 වගුවෙහි දක්වා ඇත. 2021 වර්ෂයෙහි අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කරන ලද මුළු මුදල (රු. මිලියන 176,830) දළ දේශීය නිෂ්පාදිතයෙන් 1% ක් වනු ඇත. මෙය 2019 වර්ෂයේදී අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි රජයේ වියදම්වලට වඩා (ද.දේ.නි. 1.8%) වඩා අඩු ප්‍රමාණයකි. [5]

2.5.4 වගුව: අධ්‍යාපන අංශය වෙනුවෙන් අයවැය වෙන් කිරීම්, අමාත්‍යාංශය අනුව (රු. මිලියන)

අමාත්‍යාංශය/රාජ්‍ය අමාත්‍යාංශය	පුනරාවර්තන	ප්‍රාග්ධන	එකතුව
අධ්‍යාපන අමාත්‍යාංශය	102,670	23,870	126,540
කාන්තා සහ ළමා සංවර්ධන, පෙර පාසල් සහ ප්‍රාථමික අධ්‍යාපන,පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය	24,754	5,696	30,450
කුසලතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය	9,254	3,800	13,054
දහම් පාසල්, පිරිවෙන් සහ භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය	4,490	230	4,720
අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්ව විද්‍යාල සහ දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	661	1,404	2,065
එකතුව	141,830	35,000	176,830
2021 වෙනුවෙන් විසර්ජනයෙහි ප්‍රතිශතයක් ලෙස (%)			6.6%
අපේක්ෂිත ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස (%)[1]			1.0%
මූලාශ්‍රය: 2021 මුදල් වර්ෂය වෙනුවෙන් විසර්ජන පනත් කෙටුම්පත.			

2021 මුදල් වර්ෂය වෙනුවෙන් විසර්ජන පනත් කෙටුම්පතෙහි දක්වා ඇති පරිදි, අධ්‍යාපන අංශය වෙත මධ්‍යම රජයේ සෘජු මුදල් වෙන් කිරීම් රු.බිලියන 177 කි. මෙය 2018 සහ 2019 වර්ෂ වල වෙන් කරන ලද මුදලට වඩා මඳක් අඩු වුවද, අයවැයෙන් 6.6% කට ආසන්න වන අතර 2.5.3 රූප සටහනේ දැක්වෙන ආකාරයට පෙර වර්ෂයේ අයවැයෙන් පංගුවම (එනම් 2018-2019 දී 6.0 % පමණ) වේ .

[5] මුදල් අමාතයාංශයේ 2019 වාර්ෂික වාර්තාව මත පදනම්ව අගය ගණනය කරනු ලැබේ. 2019 වෙනුවෙන් සංඛ්‍යාව රජයේ වියදම් වල කෘත්‍යාත්මක වර්ගීකරණය මත පදනම් වන අතර 2021 වෙනුවෙන් සංඛ්‍යාව අමාත්‍යාංශ වෙත මුදල් වෙන් කිරීම මත පදනම්ව ඇති බැවින් සංසන්දයන් තත්ත්වාකාර නොවීමට ඉඩ ඇත.

2.5.3 රූප සටහන: අධ්‍යාපන අංශයට අයවැය මුදල් වෙන් කිරීම – 2017-2021



මූලාශ්‍ර: 2020 සහ 2021 මුදල් වර්ෂ වෙනුවෙන් අනුමත අයවැය ඇස්තමේන්තු (2019) සහ විසර්ජන පනත් කෙටුම්පත් මත පදනම් වූ ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන සම්පාදනය.

2.5.5 වගුව 2021 අයවැයෙහි විශේෂ කරුණු අනුව, රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතාවන්ට ගලපා අයවැය මුදල් වෙන් කිරීම් ඉදිරිපත් කරයි. මෙහි දක්වා ඇති ලෙස අයවැයෙන් 58% ක් සුබසාධනය හා බැඳුණු මූලාරම්භයන් සැපයීම පිණිස වේ. අධ්‍යාපනයෙහි ගුණාත්මක බව වැඩි දියුණු කිරීම සහ පාසල් යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම යන දෙකටම අයවැයෙන් 20% ට ආසන්න ප්‍රමාණයක් ලැබී ඇත.වියදමෙන් 1%ට අඩු ප්‍රමාණයක් පාසල් විෂය මාලාව සංවර්ධනය කිරීම සඳහා වෙන් කරනු ලැබ ඇත. 2021 අයවැයෙහි විශේෂ කරුණු විශ්ව විද්‍යාල සහ වෘත්තීය අධ්‍යාපන අංශය සංවර්ධනය කිරීම සඳහා කවර හෝ අරමුදලක් නිශ්චිතව නොදක්වයි.

2.5.5 වගුව: අධ්‍යාපන අංශය වෙනුවෙන් 2021 අයවැය විශේෂ කරුණු (රු. මිලියන)

ප්‍රතිපත්ති ප්‍රමුඛතාව	රු .මිලියන	) මුළු මුදලෙන්(%
ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමය ප්‍රවර්ධනය කිරීම පිණිස පාසල් විෂය මාලා	110	0.3
ගුණාත්මක අධ්‍යාපන ක්‍රමයක් ස්ථාපනය කිරීම	7911	19.7
අධ්‍යාපනික වෘත්තිකයන් වෙනුවෙන් උසස් අධ්‍යාපන අවස්ථා	914	2.3
පාසල් යටිතල පහසුකම්	7,732	19.3
ලේකම් කොට්ඨාශ 123 තුළ ජාතික පාසල් පිහිටුවීම	4,822	12.0
සියළු පාසල් වලට ජල පහසුකම් සැපයීම	756	1.9
සියළු පාසල් වලට සනීපාරක්ෂක පහසුකම් සැපයීම	1,294	3.2
එක් එක් ග්‍රාම නිලධාරී කොට්ඨාශයෙහි අවම වශයෙන් එක සම්මත තත්ත්වයේ පෙර පාසලක්	500	1.2
දිවා සුරැකුම් සහ ප්‍රජා මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම	19.5	0.0
ආබාධිකත්ව සහිත ළමුන් වෙනුවෙන් ළමා සුරැකුම් මධ්‍යස්ථාන හතරක් පිහිටුවීම	200	0.5
විදුහල්පති සහ ගුරු නිල නිවාස සහ විවේකාගාර අළුත්වැඩියා කිරීම	140	0.3
සුබසාධනය	23,401	58.4
නොමිලේ පාසල් පෙළපොත් පිලියෙළ කිරීම	4,579	11.4
නොමිලේ පාසල් නිල ඇඳුම් පිලියෙළ කිරීම	3,300	8.2
දුෂ්කර සහ අති දුෂ්කර පාසල් වල සිසුන් 700,000 ට පාවහන් සැපයීම	900	2.2
5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව ධාරීන් 125,000 ශිෂ්‍යත්ව ලබා දීම	938	2.3
ගැබිණි මව්වරුන්, පෙර පාසල් සහ ප්‍රාථමික පාසල් ළමුන් වෙනුවෙන් පෝෂණය	11,299	28.2
සියළු පාසල් වල සෞඛ්‍ය ප්‍රවර්ධන සහ කොවිඩ් -19 වැළැක්වීමේ ක්‍රියාමාර්ග	385	1.0
සියළු පාසල් ළමුන් ආවරණය කරමින් සෞඛ්‍ය රක්ෂණ ක්‍රමයක් සැපයීම	2,000	5.0
එකතුව	**40,068**	**100.0**
මූලාශ්‍රය: 2021 අයවැයෙහි විශේෂ කරුණු		

2.5.7 අධ්‍යාපන ප්‍රතිපත්ති ප්‍රමුඛතා

දැනුම මගින් මෙහෙයවනු ලබන සමාජයක් නිර්මාණය කිරීම සඳහා අධ්‍යාපන සහ කුසලතා සංවර්ධනයෙහි වැදගත් කම සෞභාග්‍යයේ දැක්ම හඳුනා ගනී. සාමාන්‍ය අධ්‍යාපන අංශය තුළ සංවර්ධනයන් 'නිදහස් අධ්‍යාපනයක්'යටතේ මාන තුනක් අනුව සිදු කිරීමට නියමිතය. එනම්, විෂයමාලා සංවර්ධනය, ගුරු පුහුණුව සහ යටිතල සංවර්ධනය ලෙසිනි.ග්‍රාමීය පාසල්වල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ ග්‍රාමීය පාසල්වල සේවය කිරීම සඳහා ගුරුවරුන්ට දිරි දීමනා ලබාදීම විශේෂයෙන් අවධාරණය කෙරේ. එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ අවම වශයෙන් පාසල් තුනක් ජාතික පාසල් මට්ටමට උත්ශ්‍රේණිගත කර ජාතික පාසල් සංඛ්‍යාව 1000 තෙක් වැඩි කිරීම සෞභාග්‍යයේ දැක්ම අරමුණු කරයි. මෙහි අභිප්‍රාය වන්නේ ජාතික පාසල්වල ඇති පහසුකම් වලින් කොට්ඨාශයේ අනෙකුත් පාසල් වල ළමුන්ට ද ප්‍රතිලාභ ලැබිය හැකි පොකුරු පාසල් ක්‍රමයක් නිර්මාණය කිරීමයි. එක් එක් දිස්ත්‍රික්කයේ අවම වශයෙන් එක් ජාතික පාසලක් ත්‍රෛභාෂා පාසලක් වනු ඇත. ගුරුවරුන්ගේ සහ විදුහල්පති වරුන්ගේ කුසලතා සංවර්ධනය සහ ඔවුන්ගේ රැකියා මංපෙත් මනාව සංවිධානය කිරීමද සෞභාග්‍යයේ දැක්ම බලාපොරොත්තු වෙයි. අධ්‍යාපන ක්‍රමය වඩාත් ශිෂ්‍ය කේන්ද්‍රීය කර අධ්‍යාපනයේ මං සළකුණු ජාත්‍යන්තර සම්මතයන්ට අනුව පෙළ ගැස්වීමට සැලසුම් සකස් කර ඇත.

ශාස්ත්‍රීය හෝ වෘත්තීය ධාරාවන්ගෙන් උසස් අධ්‍යාපනය ලැබීමට සියළු සිසුන්ට හැකියාව ලබා දෙනු පිණිස තෘතීය අධ්‍යාපන අංශය පුළුල් කර උත්ශ්‍රේණිගත කිරීමටද සැලසුම් පිළියෙල කර තිබේ. යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සහ පුහුණු කරුවන්ගේ ධාරිතාව වැඩි දියුණු කිරීම මගින් වෘත්තීය අධ්‍යාපන ආයතන වල ගුණාත්මක බව වර්ධනය කිරීම විශේෂයෙන් අවධාරණය කරනු ලැබ ඇත. වෘත්තීය ධාරාවෙන් උසස් අධ්‍යාපනය ලබන සිසුන්ට මූල්‍ය ආධාර සැපයීමටද සැලසුම් සකස් කර ඇත.

2.5.8 අධ්‍යාපන අංශ අයවැය ප්‍රතිපත්ති ප්‍රමුඛතා සමඟ පෙළ ගැස්වීම

අයවැය කථාවේ මුදල් වෙන් කිරීම් විවිධ අයවැය රේඛා යොදා ගනිමින් ඉදිරිපත් කර ඇති බැවින් ඒවා අයවැයෙහි විශේෂ කරුණු සමඟ ගැලපිය නොහැකිය.

නිදහස් අධ්‍යාපනය වෙත ප්‍රවේශය ලබා දීමේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රමුඛතාව සමඟ අනුකූල වෙමින්, අධ්‍යාපන අංශ මුදල් වෙන්කිරීම් වලින් (2021 අයවැය විශේෂ කරුණු වල දක්වා ඇති) බහුතරය (58%) පාසල් දරුවන් වෙනුවෙන් සුඛසාධක ක්‍රියාමාර්ග සහ පාසල් පාදක සෞඛ්‍ය ආරක්ෂණ මූලපිරීම් සැපයීම සඳහා වේ. ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයක් සංවර්ධන කිරීම අවධාරණය කරනු ලැබ ඇති නමුත්, මේ වෙනුවෙන් අයවැයෙන් වෙන් කර ඇත්තේ 0.3% පමණි. අධ්‍යාපනයෙහි ගුණාත්මක බව වැඩි දියුණු කිරීම සහ ගුරු සංවර්ධනය වෙනුවෙන් අයවැයෙන් සෑහෙන කොටසක් (22%) වෙන් කෙරේ. ඒ හා සමාන කොටසක් (19.3%) යටිතල පහසුකම් සංවර්ධනය පිණිස වෙන් කර තිබේ. සෞභාග්‍යයේ දැක්ම තෘතීය සහ වෘත්තීය අධ්‍යාපන අංශ පුළුල් කිරීම අරමුණු කරන අතර 2021 අයවැය විශේෂ කරුණු තුළ මේ වෙනුවෙන් කිසිදු මුදලක් වෙන් කර නොමැති වුවත් විශ්වවිද්‍යාල යටිතල පහසුකම් පුළුල් කිරීම වෙනුවෙන් රු.මිලියන 1,000 ක් වෙන් කෙරෙන බව 2021 අයවැය කථාවේ සඳහන් වෙයි. තවද, 2021 අයවැය විශේෂ කරුණු තුළ නිශ්චිතව සඳහන්ව නොමැති වුවද, ඊ තක්සලාව ඉගෙනුම් පෝටලය උත්ශ්‍රේණිගත කිරීම සහ තොරතුරු තාක්ෂණ අධ්‍යාපන අංශය උත්ශ්‍රේණිගත කිරීම වෙනුවෙන් රු.මිලියන 3000 ක මුදල් වෙන් කිරීමක් 2021 අයවැය කථාවේ සඳහන් වෙයි (2.5.6 වගුව). තවත් රු.මිලියන 3,000 ක මුදලක් අධ්‍යාපන යටිතල පහසුකම් නවීකරණය වෙනුවෙන් සපයනු ලැබ ඇත. මේවා දැනට පවතින කොවිඩ්-19 ගෝලීය වසංගතය හේතුවෙන් දුරස්ථ අධ්‍යාපනයට අතිරේක වැදගත්කමක් ලබා දීම සමඟ වන නව අරමුණු වේ.

2.5.6 වගුව: රජයේ අධ්‍යාපන අංශ මුදල් වෙන් කිරීම් 2021 අයවැය කථාව,

ප්‍රතිපත්ති ප්‍රමුඛතාව	නව යෝජනා වෙනුවෙන් මුදල් වෙන් කිරීම
පාසල් අධ්‍යාපනය යළි පිබිදවීම	ග්‍රාමීය පාසල් සංවර්ධනය-- රු. මිලියන 3,000
	පළාත් තොරතුරු තාක්ෂණ අධ්‍යාපන මධ්‍යස්ථාන ශක්තිමත් කිරීම හා සමඟම ඊ තක්සලාව ඉගෙනුම් පෝටලය යාවත්කාලීන කිරීම සඳහා-- රු. මිලියන 3,000
ක්‍රියාශීලී, සෞඛ්‍ය සම්පන්න සහ විනය ගරුක ජාතියක් නිර්මාණය කිරීම	ග්‍රාමීය පාසල් ක්‍රීඩා පිටි සහ ග්‍රාමීය ක්‍රීඩා සමාජ සංවර්ධනය කිරීම සඳහා -- රු. මිලියන 5,000
කුසලතා පූර්ණ සමාජයක් කරා	ධාරිතා වර්ධනය සඳහා-- උපදේශකයන් පුහුණු කිරීම, තාක්ෂණික උපකරණ සැපයීම සහ ගොඩනැගිලි නවීකරණය කිරීම -- රු. මිලියන 3,000
සුදුසුකම් ලබන සියළු සිසුන් උපාධිය තෙක් ඔවුන්ගේ උසස් අධ්‍යාපනය අඛණ්ඩව සිදු කිරීම	අධ්‍යාපනික අවස්ථා පුළුල් කරගැනීම සඳහා විශ්ව විද්‍යාල යටිතල පහසුකම් පුළුල් කිරීම-- රු. මිලියන1,000
මූලාශ්‍රය: 2021 *අයවැය.*	

2021 වර්ෂය වෙනුවෙන් අයවැය යෝජනා, විෂයමාලා සංවර්ධනය, ගුරු සංවර්ධනය සහ තෘතීය අධ්‍යාපන සංවර්ධනය යන ක්ෂේත්‍ර වල හැරුණුකොට, බොහෝසෙයින් සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රමුඛතා සමඟ අනුකූලව තිබේ. 'මානව සම්පත් සංවර්ධනය තුළින් දැනුම පාදක කරගත් ආර්ථිකයක්' යන අරමුණ ඉටු කර ගැනීම සඳහා තෘතීය සහ වෘත්තීය අධ්‍යාපන අංශ සංවර්ධනයට අයවැය වැඩි ප්‍රමුඛතාවක් දිය යුතුය. වෙන් කර ඇති මුදල් පවා වැඩිවශයෙන් යොමුව ඇත්තේ ගුණාත්මකබව වර්ධනය කිරීමට වඩා එම අංශය පුළුල් කිරීමටය.තවද,ජාතික පාසල් කරා ප්‍රවේශය වැඩි දියුණු කිරීම තුළින් සැමට ගුණාත්මක අධ්‍යාපනය කරා ප්‍රවේශය වැඩි කිරීමේ අරමුණ ඉටු කර ගත හැක්කේ ගුරුවරුන්ගේ ගුණාත්මක බව වැඩිදියුණු කිරීම තුළින් පමණි. මේ සම්බන්ධයෙන් අයවැය තුළ ප්‍රමාණවත් අවධානය යොමු කර නොමැත.

2.5.9 අධ්‍යාපනය පිළිබඳ නිරීක්ෂණ සහ නිගමන

අධ්‍යාපන අංශය සංවර්ධනය කිරීම සඳහා සෞභාග්‍යයේ දැක්ම තුළ ඇති විශාල අපේක්ෂා සහිත සැලසුම් අනුව ගත් කළ, ඒ වෙනුවෙන් වෙන් කර ඇති මුදල් ප්‍රමාණය සීමිතය. පෙර වර්ෂ තුන හා සැසඳූ කළ අධ්‍යාපන අංශයට මුදල් වෙන්කිරීම ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස අඩු වී ඇත (2.5.4. රූපසටහන බලන්න). අයවැය විශේෂ කරුණු යටතේ දක්වා ඇති අරමුදල් වලින් 50%ට වැඩි ප්‍රමාණයක් තිබෙන්නේ අධ්‍යාපනය හා සබැඳි සුබසාධන අයිතම හෝ සෞඛ්‍ය ප්‍රවර්ධන ක්‍රියාකාරකම් වෙනුවෙනි. තවද, ඇතැම් මුදල් වෙන් කිරීම් අධ්‍යාපනයට ඍජුවම සම්බන්ධ නැත. උදාහරණයක් ලෙස, නව අමාත්‍යාංශ වර්ගීකරණය අනුව, කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයද අධ්‍යාපන අංශය යටතට පැමිණේ. වාර්ෂිකව රු.බිලියන 6 ක් පමණ වැය වන ගැබිණි මවුවරුන් වෙනුවෙන් ආහාර දීමනාව වැනි සුබසාධක වැඩසටහන් මෙම අමාත්‍යාංශයට අයත් වේ.

2.5.4 රූප සටහන: අධ්‍යාපන අංශයට අයවැය මුදල් වෙන් කිරීම් – 2017-2021



මූලාශ්‍ර: 2020 සහ 2021 මුදල් වර්ෂ වෙනුවෙන් අනුමත අයවැය ඇස්තමේන්තු (2019) සහ විසර්ජන පනත් කෙටුම්පත් මත පදනම් වූ ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන සම්පාදනය.

අධ්‍යාපන අංශය තුළ මුදල් වෙන්කිරීම් සිසුන් වෙනුවෙන් සුබසාධක ක්‍රියාමාර්ග සහ යටිතල පහසුකම් සංවර්ධනය කෙරෙහි නැඹුරුවද පවතී. ගුරු සංවර්ධනය සහ විෂයමාලා සංවර්ධනය වෙනුවෙන් වෙන් කර ඇති මුදල් ප්‍රමාණවත් නැත. තවද, විශ්ව විද්‍යාල සහ වෘත්තීය පුහුණු අංශය සංවර්ධනය සහ පුළුල් කිරීම වෙනුවෙන් අරමුදල් සීමිතය. මුදල් වෙන් කිරීම්, සුදුසුකම් ලබන සියල්ලන්ම වෙනුවෙන් තෘතීය අධ්‍යාපනය සංවර්ධනය කිරීමේ සිත් ගන්නා සැලසුම් පිළිබිඹු නොකරයි.

දුරස්ථ අධ්‍යාපනයට දී ඇති වැඩි අවධාරණය අනුව ගත් කළ, දුරස්ථ ඉගෙනුම් අධ්‍යාපනය සංවර්ධනය කිරීමට අවධානය යොමු කිරීම ප්‍රශංසනීය වේ.

2.5.10 සමාජ සුබසාධනය පිළිබඳ විශ්ලේෂණ සාරාංශය: වෙනස් හැකියාවන් සහිත සහ අඩු ආදායම් කුටුම්බ/සමෘද්ධි

මෙම අනු අංශය මූලික වශයෙන්ම (i) ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා සහ ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍ය වරයාගේ සහ (ii) සමෘද්ධි දෙපාර්තමේන්තුවේ අයවැය අයත් වන සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා සහ ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයෙහි (මින් ඉදිරියට සමෘද්ධි රාජ්‍ය අමාත්‍යාංශය ලෙස සඳහන් වන) විශ්ලේෂණය කරයි. මෙම රාජ්‍ය අමාත්‍යාංශයෙහි අයවැයෙහි විශාලතම කොටස සමෘද්ධි දෙපාර්තමේන්තුවට වෙන් වේ.

2.5.7 වගුව: වියදම් සාරාංශය (වෙන් කිරීම් සහ වසරින් වසර වෙනස්වීම) 2018 සිට 2021					
අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	රජයේ වෙන්කිරීම / වියදම (රු.මිලියන)				වසරින් වසර වෙනස්වීම (2020-2021) වර්ධන අනුපාතිකය (%)
	2018	2019 (සංශෝධිත)	2020 (ඇස්තමේන්තුව)	2021 (ඇස්තමේන්තුව)	
සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා සහ ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය [6]	53,333	64,984	113,757	84,718	-25.53
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව	53,333	64,984	106,361	71,554	-32.73
රජයේ අයවැයෙහි කොටසක් ලෙස (%)					
සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා සහ ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ	1.95	1.91	3.05	2.32	-0.73
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව	1.95	1.91	2.85	1.96	-0.89
දළ දේ.නි.හි කොටසක් ලෙස (%)					
සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා සහ ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ	0.37	0.43	0.71	0.48	-0.23
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව	0.37	0.43	0.67	0.41	-0.26
මූලාශ්‍රය: 2020 අයවැය ඇස්තමේන්තු සහ 2020 සහ 2021 විසර්ජන පනත් කෙටුම්පත.					

2.5.11 අයවැය උපකල්පන

- 2021 අයවැයට අනුව, සමෘද්ධි පවුල් 200,000 කේන්ද්‍ර කරගත් කුටුම්බ ආර්ථිකයන් උත්ශ්‍රේණිගත කර එතුළින් ඔවුන්ගේ ගම් සවිබල ගැන්වීම සඳහා රු.මිලියන 10,000 ක් වෙන් කෙරෙනු ඇත. පවුලකට රු.50,000 ක සාමාන්‍යයක් ඇති මෙය සැලකිය යුතු ලෙස ප්‍රමාණවත් වෙන් කිරීමකි. එසේ වුවද, මෙම වෙන් කිරීම සම්පූර්ණයෙන්ම සමෘද්ධි රාජ්‍ය අමාත්‍යාංශයට ලැබෙන්නේද යන්න අමාත්‍යාංශයේ අයවැය මුදල් වෙන් කිරීම් වලින් පැහැදිලි නොවේ. 2021 වෙනුවෙන් 2020 අයවැය ඇස්තමේන්තු ප්‍රක්ෂේපණ පෙන්නුම් කරන්නේ රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රාග්ධන අයවැය යටතේ ජාතික ගම්මාන සවිබල ගැන්වීමේ වැඩසටහන වෙනුවෙන් රු.මිලියන 5,300 ක ඇස්තමේන්තුගත මුළු වියදමක් පමණි.

- 2021 අයවැය සමෘද්ධි පවුල් වලින් තෝරා ගත් ව්‍යවසායිකාවන් 25,000 ක් ඉලක්ක කරමින්, එක් ග්‍රාම නිලධාරි කොට්ඨාශයකට එක් වෙළඳසැලක් බැගින් සමෘද්ධි කාන්තාවන්ගේ වෙළඳසැල් ජාලයක් පිහිටුවීමට ද යෝජනා කරයි. රජයේ දායකත්වයක් ලෙස රු.මිලියන 1,000 ක මුළු මුදලක් මෙය වෙනුවෙන් වෙන් කිරීමට යෝජනා කරනු ලැබේ. මෙය එක් වෙළඳසැලකට රු.40,000 ක මුදල් වෙන් කිරීමක් හඟවන අතර, විශේෂයෙන්ම මෙම ව්‍යාපාර සඳහා පහසුකම් සැලසීම පිණිස සමෘද්ධි බැංකු සහ අනෙකුත් රාජ්‍ය බැංකු හරහා ණය පහසුකම් සැපයීමටද අයවැය යෝජනා කිරීම අනුව ගත් කළ මෙය යම්තාක් දුරට සාධාරණය.

- 2021 අයවැය විශේෂ කරුණු, සමෘද්ධි, ආබාධිකත්ව සහිත තැනැත්තන්ට සහ වකුගඩු රෝගීන්ට ආධාර වැනි මාසික මුදල් ලබා දීමේ වැඩසටහන් වෙනුවෙන් මුදල් වෙන් කිරීම් ඉදිරිපත් කරයි. සමෘද්ධි සහ ආබාධිකත්ව සහිත තැනැත්තන් වෙනුවෙන් මේවා වර්තමාන ප්‍රතිලාභියා සහ ප්‍රතිලාභ මුදල මත පදනම් වේ. කෙසේවෙතත්, අයවැය විශේෂ කරුණු වල දැක්වෙන වකුගඩු රෝගීන් වෙනුවෙන් (39,150) රු. 2,349 ක යෝජිත මුදල් වෙන් කිරීම එහි වර්තමාන ප්‍රතිලාභීන් සංඛ්‍යාවේ සිට 2021 දී ප්‍රතිලාභීන් ආවරණයෙහි පුළුල් කිරීමක් පෙන්නුම් කරයි.

[6] සමෘද්ධි රාජ්‍ය අමාත්‍යාංශය පිහිටුවන ලද්දේ 2020 වර්ෂයේදී වන බැවින් එම අමාත්‍යාංශයේ අයවැය වසරින් වසරට ස්ථීර ලෙස සැසඳිය නොහැකි වන අතර මෙම අමාත්‍යාංශය යටතේ 2019 සහ 2018 අයවැයට ඇතුළත්ව ඇත්තේ සමෘද්ධි දෙපාර්තමේන්තුවේ මුළු අයවැය වේ.

2.5.12 සමාජ සුබසාධනය පිලිබඳ ප්‍රතිපත්ති ප්‍රමුඛතා

1) වෙනස් හැකියාවන් ඇති පිරිස් වල ආර්ථික සහ සමාජයීය හිමිකම් තහවුරු කිරීම:
   - අධ්‍යාපනය කරා ප්‍රවේශ වීමේදී ආබාධිකත්ව සහිත තැනැත්තන් විසින් මුහුණ දෙනු ලබන දුෂ්කරතාවන්ට විසඳුම් සැපයීම සඳහා පහසුකම් හඳුන්වා දීම.
   - ආබාධිත තත්ව සහිත තැනැත්තන්ට විශේෂ කුසලතා/ වෘත්තීය පුහුණු වැඩසටහන් සැපයීම
   - වෙනස් හැකියාවන් ඇති තැනැත්තන්ට සහාය වීම සඳහා ඇමතුම් මධ්‍යස්ථාන පිහිටුවීම.

2) අඩු ආදායම් උපයන්නන් ඉහළ ආදායම් උපයන්නන් බවට පත් කිරීමේ රාමුවක් ස්ථාපනය කිරීම: [7]
   - දිවිනැගුම වැඩසටහන් නැවත ආරම්භ කර නැවත ශක්තිමත් කිරීම. අඩු ආදායම් ලාභී පවුල් 100,000 තෝරාගෙන පුහුණුව, යටිතල පහසුකම්, උපකරණ සහ වෙළඳපොළ සැපයෙනු ඇත.
   - සමෘද්ධි පවුල්වල තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණු අවස්ථා ලබා දීම.
   - අඩු ආදායම් ලාභී පවුල් වෙනුවෙන් සැපයෙන දැනට පවතින සියළු සමෘද්ධි ප්‍රතිලාභ වැඩි කිරීම
   - නවීන තාක්ෂණය යොදා ගනිමින් සියළු සමෘද්ධි බැංකු ප්‍රතිව්‍යුහගත කිරීම

2.5.13 සමාජ සුභසාධනය පිළිබඳ විශ්ලේෂණය

- 2021 වර්ෂයේ දී සමෘද්ධි රාජ්‍ය අමාත්‍යාංශය වෙත වෙන් කරන ලද වියදම රුපියල් මිලියන 84,718ක් වූ අතර, මෙයින් 84.5% (රුපියල් මිලියන 71,554) සමෘද්ධි දෙපාර්තමේන්තුව වෙත වෙන් කරනු ලැබේ.
- රාජ්‍ය අමාත්‍යාංශයෙහි අයවැයෙන් රුපියල් බිලියන 13ක් පමණ ප්‍රමාණයක් ගෘහස්ථ කෘෂිකර්මය, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා සහ ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයෙහි කටයුතු සඳහා වෙන් කරනු ලැබේ. විශේෂයෙන්ම, රුපියල් බිලියන 6.6 ක් පමණ (රාජ්‍ය අමාත්‍යාංශයෙහි පුනරාවර්තන වියදමෙන් විශාල ප්‍රමාණය) අඩු ආදායම්ලාභීන්ගේ සිට ආබාධිත තැනැත්තන් හා වකුගඩු රෝගීන් දක්වා වන තැනැත්තන්ට සහාය වීම සඳහා වන සුභසාධන වැඩසටහන සඳහා භාවිතා කිරීමට අපේක්ෂා කරනු ලැබේ.
- 2021 වර්ෂයේ රාජ්‍ය අමාත්‍යාංශයෙහි මෙන්ම සමෘද්ධි දෙපාර්තමේන්තුවෙහි ද සම්පූර්ණ අයවැය 2020 වර්ෂයේ දී අදාල මට්ටම් වලට වඩා සැලකිය යුතු අඩුවීමක් පෙන්නුම් කරනු ලැබ ඇත. (පිළිවෙලින් 25.5% සහ 32.7%) කොවිඩ් 19 ආශ්‍රිත ආධාර ලබා දීම හේතුවෙන් 2020 වර්ෂයේ දී සමෘද්ධි දෙපාර්තමේන්තුවෙහි අයවැය ඇස්තමේන්තුව සැලකිය යුතු ලෙස ඉහළ යෑම මීට හේතුවයි.
- කෙසේ වුවද, රාජ්‍ය අමාත්‍යාංශයෙහි ප්‍රාග්ධන අයවැය 2020 වර්ෂයට හා සාපේක්ෂව 2021 වර්ෂයෙහි ඉහළ අගයක් ගනී. ජාතික ගම්මාන සවිබල ගැන්වීමේ වැඩසටහන සඳහා වූ ඇස්තමේන්තුගත වියදම හේතුවෙන් මෙම වැඩි වීම සිදු විය. (එසේ වුවද 2021 අයවැය යෝජනා යටතේ යෝජිත මිලියන 10,000ට වඩා එය අඩු අගයක් ගනියි)

[7] සෞභාග්‍යයේ දැක්ම රජයේ ප්‍රතිපත්ති ලේඛනය තුළ එය "ධර්මිෂ්ට, විනයගරුක සහ නීති ගරුක සමාජය" පරිච්ඡේදය තුළ ආවාරණය කෙරෙන නමුත්, මෙම අයවැය විශ්ලේෂණය වෙනුවෙන් එය මෙහි සාකච්ඡා කරනු ලබන්නේ සමෘද්ධි වැඩසටහන සහ ආබාධිකත්ව සහිත තැනැත්තන්ට ආධාර යන දෙකම සමෘද්ධි රාජ්‍ය අමාත්‍යාංශය යටතේ නිබෙන බැවිනි.

2.5.5 රූපසටහන: සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා සහ ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයෙහි පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම



සටහන්: මෙම රාජ්‍ය අමාත්‍යාංශය 2020 වර්ෂයේ දී නිර්මාණය කරන ලද අතර එසේ හෙයින් මෙහි 2019 සහ 2018 අයවැය තුළ අන්තර්ගත වන්නේ සමෘද්ධි දෙපාර්තමේන්තුවෙහි සම්පූර්ණ අයවැය පමණි.

මූලාශ්‍රය: 2020 අයවැය ඇස්තමේන්තු සහ 2021 විසර්ජන පනත් කෙටුම්පත

2.5.14 සමාජ සුබසාධනය පිළිබඳ නිරීක්ෂණ හා නිගමනයන්

2021 වර්ෂයේ දී රාජ්‍ය අමාත්‍යාංශය සහ සමෘද්ධි දෙපාර්තමේන්තුව වෙත අය වැය ප්‍රතිපාදන වෙන් කර ඇත්තේ විශාල වශයෙන්ම අඩු ආදායම් ලාභී පවුල් (සමෘද්ධි) ආබාධිතතාවයන් සහිත පුද්ගලයන් සහ වකුගඩු රෝගීන් ඉලක්ක කරගනිමින් දැනට ක්‍රියාත්මක වෙමින් පවතින සුබසාධන වැඩසටහන් ආවරණය කිරීම සඳහා ය. සමහර අය වැය යෝජනා රාජ්‍ය අමාත්‍යාංශයේ අයවැය තුළ පූර්ණ වශයෙන් නිරූපණය වන්නේ නැත. (උදා: මිලියන 10,000ක ප්‍රතිපාදනයක් ලබාදී සමෘධි පවුල් ලක්ෂ දෙකක් තුලින් ගම්මාන සවිබල ගැන්වීම) සමෘද්ධි රාජ්‍ය අමාත්‍යාංශය නිර්මාණය කරන ලද්දේ 2020 වර්ෂයේ දී වීම හේතුවෙන් එහි අයවැය අවුරුදු ගණනාවක් තිස්සේ සියුම් ලෙස සංසන්දනය කිරීමක් කළ නොහැකි වේ.

2.5.15 කාන්තාවන් සහ ළමයින් සඳහා වියදම් සාරාංශය

2.5.8 වගුව: 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වියදම් සාරාංශය (ප්‍රතිපාදන සහ වසරින් වසර සිදුවන වෙනස්කම්)

අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	රජයේ ප්‍රතිපාදන/ වියදම (රු. මිලියන)				වසරින් වසර සිදුවන වෙනස්කම් (2020-2021)
	2018	2019 (ප්‍රතිශෝධිත)	2020 (වාර්ෂික අයවැය අනුව)	2021 (ඇස්තමේන්තුව)	
කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය	343	378	33,033	30,450	-2,583 (-7.82%)
පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව	343	378	361	406	45 (12.47%)

මූලාශ්‍රය: 2020 අයවැය ඇස්තමේන්තු සහ 2020 සහ 2021 විසර්ජන පනත් කෙටුම්පත

2.5.16 කාන්තා හා ළමා කටයුතු සම්බන්ධයෙන් අයවැය උපකල්පන

ත්‍රිපෝෂ නිෂ්පාදනය වැඩි කිරීමට අයවැය කතාව මගින් අයවැය යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබ ඇති අතර මෙම කාර්යය සඳහා රුපියල් මිලියන 1,500 ක ප්‍රතිපාදන ලබා දී ඇත. මේ සම්බන්ධයෙන් අයවැය ප්‍රධාන යෝජනා මගින් සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ රුපියල් මිලියන 2,700 ක ප්‍රතිපාදනයක් පෙන්නුම් කරනු ලැබේ. සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම වර්තමානයේ දී කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පවතී. මේ අනුව මෙකී යෝජනාව සහ ඊට අදාළ ප්‍රතිපාදනයන් පැහැදිලි නැත.

අයවැය ප්‍රධාන යෝජනා අනුව සංකීර්ණ ගර්භනීතාවයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා විශේෂිත මධ්‍යස්ථාන, මාතෘ හා ළමා රෝහල්, ප්‍රජනන ප්‍රතිකාරක ඒකකයක්, ළමයින් සඳහා හෘද රෝග මධ්‍යස්ථානයක් සහිත ළමා සත්කාරක සංකීර්ණයක් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 1,690ක ප්‍රතිපාදනයක් වෙන් කරනු ලැබේ. මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු ඉදිරිපත් නොකරන ලද අතර, අයවැය කතාව තුළ ඒ පිළබඳ යෝජනාවක් ඇතුලත් කිරීම ද සිදු නොකරන ලදි.

2.5.17 කාන්තාවන් හා ළමයින් සම්බන්ධ ප්‍රතිපත්තිමය ප්‍රමුඛතාවයන්

ආර්ථික කටයුතු සඳහා කාන්තාවන්ගේ සහභාගිත්වය වැඩි දියුණු කිරීම සඳහා මෙම අංශය තුළ දැඩි අවධානයක් යොමු කරනු ලැබේ. විශේෂයෙන්ම ශ්‍රී ලංකා රජයෙහි සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනය මගින් ශ්‍රම බලකාය වෙත කාන්තා සහභාගිත්වයෙහි අනුපාතය වැඩිදියුණු කිරීමට සහ කාන්තා ව්‍යවසායකයන් දිරිමත් කිරීමට ඇති අවශ්‍යතාවය හඳුනා ගනු ලැබේ. තවද, ශ්‍රම වෙළෙඳපොළ තුළ කාන්තා ක්‍රියාකාරකම් සඳහා සහාය ලබාදීම පිණිස කාන්තාවන් පුහුණු කිරීමේ, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීමේ, කාන්තාවන්ගේ සහ ළමයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග ඉහළ නැංවීමේ සහ ගුණාත්මකභාවයෙන් යුතු ළමා සත්කාරක සේවා ආයතන වෙත ප්‍රවේශ වීමට ඇති හැකියාව වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගනු ලැබේ.

ළමයින් සම්බන්ධයෙන් පහත සඳහන් අවශ්‍යතාවයන් ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්ති කාර්ය රාමුව මගින් හඳුනාගනු ලැබේ. ළමයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම; ළමා ශ්‍රමය සූරාකෑම, ළමයින් අවභාවිතා කිරීම සහ ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ එවැනි දෑ වළක්වාලීම සඳහා වැඩසටහන් හඳුන්වා දීම; ජාතික මට්ටමේ කැපකරු පවුල් වැඩසටහනක් හඳුන්වාදීම සහ දැනට පවතින ළමයින් කුලවැද්දීමේ ක්‍රියාවලිය සරල කිරීම සහ මන්දපෝෂණය දුරලීම සඳහා පෝෂණ වැඩසටහන් හඳුන්වා දීම.

2.5.18 කාන්තාවන් සහ ළමයින් පිළිබඳ විශ්ලේෂණය

ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වළක්වාලීම සහ ජාතික මට්ටමේ කැපකරු සත්කාරක වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන් මගින් අවධාරණය කරනු ලැබුවද ඒ සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදු කර නොමැත.

ශ්‍රම බලකාය තුල කාන්තා සහභාගිත්ව අනුපාතය ඉහළ නැංවීම සහ ඉහළ තරගකාරිත්වයක් සහිත රැකියා සඳහා ඉලක්ක කිරීම සඳහා කාන්තාවන් වෙනුවෙන් පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා පහසුකම් සැපයීම රජය මඟින් අවධාරණය කරනු ලබයි. මෙම අංශය යටතේ මෙම කාර්යය සඳහා යෝජනාවන් කිසිවක් ඉදිරිපත් කර නොමැත. කෙසේ වුවද, සමෘද්ධි පවුල් වලින් තෝරාගත් කාන්තා ව්‍යවසායිකාවන් විසිපන්දාහක් ඉලක්ක කරමින් සමෘද්ධි කාන්තා සාජ්පු වැනි යම් යම් වැඩපිළිවෙලවල් සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා සහ ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ යෝජනා කරනු ලැබ ඇත.

2020 සහ 2021 වර්ෂවලදී කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනය දෙපාර්තමේන්තු සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනයන්ට වඩා දස ගුණයක් වැඩි වේ. ප්‍රතිපාදනයෙන් විශාල කොටසක් අමාත්‍යාංශය සඳහා වෙන් කිරීම මීට හේතුව ලෙස උපකල්පනය කරනු ලැබේ. මීට කලින් වෙනත් ආයතනයක් විසින් සිදු කරන ලද සුබසාධන හා වෙනත් වැඩසටහන් (ශිෂ්‍යත්ව වැඩසටහන, පාසල් නිල ඇඳුම් හා පෙළ පොත් වැඩ සටහන, පෝෂණ වැඩසටහන ආදී) අමාත්‍යාංශය විසින් සිදු කිරීම මීට හේතුවයි.

2020 වර්ෂය වන තුරු රාජ්‍ය අමාත්‍යාංශය නොමැතිවීම හේතුවෙන් 2018 - 2019 කාලයට සාපේක්ෂව 2020 - 2021 කාලය තුළදී පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් යන වියදම් වර්ග දෙකම ඉතා ඉහළ අගයක් ගනී. එසේහෙයින් 2018 සහ 2019 යන වර්ෂය සඳහා එකම වර්ගීකරනයන් යටතේ ප්‍රතිපාදන ලබා දීමක් සිදු කර නොමැත.

2.5.6 රූපසටහන: කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය



මූලාශ්‍රය: 2020 අයවැය ඇස්තමේන්තු සහ 2021 විසර්ජන පනත් කෙටුම්පත

කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය 2020 වර්ෂය වන තුරු දක්නට ලැබුණේ නැත. මීට පෙර කාන්තාවන් සහ ළමයින් පිළිබඳ සියළු වැඩසටහන් කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය විසින් සිදු කරන ලදි. එසේ හෙයින්, මෙම කරුණ ගැලපනු ලැබුවහොත් 2018 සහ 2019 වර්ෂ සඳහා වාර්තා වුණු අමාත්‍යාංශ වියදම දෙපාර්තමේන්තු වියදමට සමාන බවට උපකල්පනය කරනු ලැබේ. (රාජ්‍ය අමාත්‍යාංශය නොමැතිවීම හේතුව ලෙස දැක්විය හැකිය.)

රාජ්‍ය අමාත්‍යාංශය වෙත 2020 සහ 2021 වර්ෂවලදී ලබා දෙන ලද ප්‍රතිපාදන ප්‍රමාණය අඩු වී ඇති අතර පරිවාස දෙපාර්තමේන්තුව වෙත ඉකුත් වර්ෂයට වඩා 2021 වර්ෂයේදී වැඩිපුර ප්‍රතිපාදන වෙන් කරනු ලැබ ඇත. මේ සම්බන්ධයෙන් නිශ්චිත යෝජනාවක් දක්නට නොලැබෙන හෙයින් 2021 වර්ෂයෙහි වැඩි කරන ලද 12% ක ප්‍රතිපාදන ප්‍රමාණය (2020 ට සාපේක්ෂව) කවර කාර්යයක් සඳහා යොදාගනු ලැබේ ද යන්න පැහැදිලි නැත.

2.5.19 සමාජ ආරක්ෂණය

අයවැයෙහි ප්‍රධාන යෝජනා අනුව රාජ්‍ය අංශයෙහි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා රුපියල් මිලියන 298,000ක ප්‍රතිපාදනයක් (රජයේ විශ්‍රාම වැටුප්, වැන්දඹු හා වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප්, විශ්‍රාමිකයන් සඳහා පාරිතෝෂික සහ රණවිරුවන්ගේ සඳහා කටයුතු සඳහා කරනු ලබන ගෙවීම්) සහ ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා රුපියල් මිලියන 4,000ක ප්‍රතිපාදන දක්නට ලැබේ. එක්ව ගත්විට මෙම ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 302,000ක් හෝ 2021 විසර්ජන පනත් කෙටුම්පතෙහි ප්‍රතිපාදන වලින් 11% ක් හෝ 2021 දල දේශීය නිෂ්පාදිතයෙන් 1.7%ක් වේ. රජයේ වියදම් වල ආර්ථික වර්ගීකරණය අනුව විශ්‍රාම වැටුප් සඳහා ලබා දෙනු ලබන ප්‍රතිපාදන 2.5.9 වගුවෙහි දැක්වේ. මෙම දත්තවලට අනුව, 2021 වර්ෂයෙහි විශ්‍රාම වැටුප් සඳහා වියදම 2021 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතයෙන් 1.42%ක් වේ. මෙකී ප්‍රතිපාදන ප්‍රමාණයන් සෞඛ්‍ය සඳහා වෙන් කරනු ලබන ප්‍රතිපාදන ප්‍රමාණයට (දළ දේශීය නිෂ්පාදිතයෙන් 1.27%) සහ අධ්‍යාපනය සඳහා වෙන් කරනු ලබන ප්‍රතිපාදන (දළ දේශීය නිෂ්පාදිතයෙන් 1%) ප්‍රමාණයට වඩා වැඩිය. මෙම කාර්යය සඳහා රාජ්‍ය මුදල් යෙදවීමෙන් වැය බර අඩු කිරීම සඳහා රජයේ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීමේ අවශ්‍යතාවය මෙමගින් අවධාරණය කරනු ලැබේ. රජයේ විශ්‍රාම වැටුප්වල විශාලතම කොටස භුක්ති විඳිනු ලබන්නේ දුප්පත් නොවන තැනැත්තන් විසින් බව ද අවධානයට ගත යුතුය.

ස්වයං රැකියාවල නියුතු තැනැත්තන් සහ විදේශ රටවල සේවයේ නියුතු සේවකයින් සඳහා වන සමාජ ආරක්ෂණ වැඩසටහන් (විශ්‍රාම වැටුප්) පිළිබඳව ද අයවැය මගින් කතාව තුළ සඳහන් කරනු ලැබේ. මේවා යෝජනා කරනු ලබන්නේ දායකත්ව යෝජනා ක්‍රම වශයෙනි. අයවැය වියදම් සාරාංශය මගින් හෝ අයවැයෙහි ප්‍රධාන යෝජනා මගින් මෙම වැඩසටහන සඳහා වෙනම ප්‍රතිපාදන ලබා දීමක් සිදු කරනු නොලැබේ. අඩු ආදායම්ලාභී කණ්ඩායම් ඉලක්ක කරමින් ලබා දෙනු ලබන එකම සමාජ ආරක්ෂණ ප්‍රතිපාදනය වන්නේ ඉහත සඳහන් කරන ලද ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයයි.

2.5.9 වගුව කුටුම්භයන් වෙත සහනාධාර සහ මාරු කර යැවීම (දළ දේශීය නිශ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස)			
	2019	**2020**	**2021**
කුටුම්භයන්	3.04	3.04	2.86
වැන්දඹු හා අනත් දරු විශ්‍රාම වැටුප්	1.52	1.58	1.42
සමෘද්ධිය	0.30	0.43	0.29
මූලාශ්‍රය: මුදල් අමාත්‍යාංශයෙහි දත්ත පදනම් කරගත් ප්‍රතිපත්ති අධ්‍යයන කේන්ද්‍රයේ ගණනයන්			

2.6 ජනතා කේන්ද්‍රීය ආර්ථික සංවර්ධනය

2.6.1 කෘෂිකර්මය

මධ්‍යම රජයට අයත් කෘෂිකාර්මික කටයුතු වර්තමානයේ දී අමාත්‍යාංශ තුනක් සහ රාජ්‍ය අමාත්‍යාංශ හතක් මගින් මෙහෙයවනු ලැබේ. මෙම අමාත්‍යාංශ තුන වන්නේ කෘෂිකර්ම අමාත්‍යාංශය; වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය හා වාරිමාර්ග අමාත්‍යාංශයයි. කෘෂිකර්මය සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන රාජ්‍ය අමාත්‍යාංශ දෙකක් කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පවතී. (i) වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවලු, පලතුරු, මිරිස්, ලූනු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන සහ උසස් තාක්ෂණික කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය සහ (ii) පොහොර නිෂ්පාදන හා සැපයුම්, රසායනික පොහොර හා කෘමිනාශක භාවිත නියාමන රාජ්‍ය අමාත්‍යාංශය.

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ රාජ්‍ය අමාත්‍යාංශ තුනක් පවතී. (i) සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත බෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය (ii) පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය සහ (iii) උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබු නැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි බෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ තවත් අමාත්‍යාංශ දෙකක් ක්‍රියාත්මක වේ.(i) මහවැලි කලාප ආශ්‍රිත ඇල වේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය සහ (ii) ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ සහ වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය.

2.6.2 කෘෂිකාර්මික වියදම් සාරාංශය

පසුගිය අයවැය තුනක් තුලදී වියදම් බෙදාහරින ලද ආකාරය පිළිබඳ විස්තරාත්මක සංඛ්‍යා ලේඛන සහ අයවැය යෝජනා 2. 6.1 වගුව තුළ දැක්වේ.

2.6.1 වගුව: 2018 සිට 2021 දක්වා වියදම් සාරාංශය (ප්‍රතිපාදන සහ වසරින් වසර වෙනස් වීම)					
අමාත්‍යාංශය /රාජ්‍ය අමාත්‍යාංශය	**මුළු වියදම (රු. මිලියන)**				
	2018 තථ්‍ය	**2019** සංශෝධිත	**2020** ඇස්තමේන්තුව	**2021** අයවැය	**වසරින් වසර වෙනස් වීම 2020-2021 (%)**
කෘෂිකර්ම අමාත්‍යාංශය	41,159	90,694	16,368	24,091	47
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය	6,105	7,907	1,422	1,290	-9
වාරිමාර්ග අමාත්‍යාංශය	18,933	16,448	50,404	46,588	-8
සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත බෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය කිරීම හා තේ සහ රබර් අපනයන ප්‍රවර්ධනය රාජ්‍ය අමාත්‍යාංශය	959	1,217	5,439	5,870	8
වී හා ධාන්‍ය,කාබනික ආහාර, එළවලු, පලතුරු, මිරිස්,ලූනු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන සහ උසස් තාක්ෂණික කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය	7,986	11,288	13,505	18,670	38
පොහොර නිෂ්පාදන හා සැපයුම්, රසායනික පොහොර හා කෘෂි කෘමිනාශක භාවිත නියාමන රාජ්‍ය අමාත්‍යාංශය.	0	0	35,119	35,746	2

මහවැලි කලාප ආශ්‍රිත ඇල වේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	0	0	3,543	7,254	105
ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ සහ වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය.	0	0	117	3,114	2,564
පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය	0	0	2,152	2,536	18
උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබු නැටි, බුලත් ඇතුළු කුඩා වවිලි බෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	1,110	1,343	3,723	4,308	16
කෘෂිකාර්මික අංශය (මුළු එකතුව)	76,251	128,897	131,791	149,466	13
රජයේ අයවැයෙහි කොටසක් ලෙස	2.79	3.79	3.53	4.10	0.56
දළ දේශීය නිශ්පාදිතයෙහි කොටසක් ලෙස	0.53	0.86	0.83	0.85	0.02
මූලාශ්‍රය: 2020 අයවැය ඇස්තමේන්තු සහ 2020 සහ 2021 විසර්ජන පනත් කෙටුම්පත්					

2.6.3 අයවැය උපකල්පන

2021 අයවැයෙහි දේශීය කෘෂිකාර්මික අංශය ආශ්‍රිත ප්‍රධාන උපකල්පනය වන්නේ සහල්, බඩඉරිඟු එළවළු වැනි ආහාර ද්‍රව්‍යයන්හි මිල ගණන් අසාධාරණ ලෙස ඉහළ යෑම නතරකර පහත සඳහන් යෝජිත කාර්යයන් ක්‍රියාත්මක කිරීම මගින් උද්ධමනය පහල මට්ටමක තබා ගනු ඇති බවයි. අයවැය කථාව තුළ යෝජනා කරන ලද කාර්යයන්ගෙන් බොහෝමයක් සඳහා අයවැය ප්‍රතිපාදන වෙන් කරනු ලැබ ඇත. දේශගුණයට ඔරොත්තු දෙන ගොඩනැගිලි ඉදිකිරීම සහ දායකත්ව රක්ෂණ යෝජනා ක්‍රම සඳහා අයවැය ප්‍රතිපාදනයන් වෙන් කරනු ලැබ ඇති අතර ඒවා අයවැය කතාව තුළ සඳහන් කරනු ලැබ නොමැත. දේශීය කෘෂිකර්මය සඳහා වෙන් කරනු ලැබ ඇති මුළු ප්‍රතිපාදනය වන්නේ රුපියල් මිලියන 52,621 කි.

2.6.2 වගුව: අයවැය කතාව තුළ යෝජිත දේශීය කෘෂිකාර්මික කටයුතු සහ ප්‍රතිපාදන	
කාර්යයන්	**ප්‍රතිපාදන (රුපියල් මිලියන)**
ආහාර බෝගවල දේශීය නිෂ්පාදනය වැඩි කිරීම තුළින් ආනයනයන් අඩු කිරීම	6,950
වී වගාව සඳහා නොමිලයේ ද අනිකුත් භෝග සඳහා කිලෝ ග්‍රෑම් 50ක බෑගයක් රුපියල් 1,500 ක සහන මිලට ද පොහොර ලබාදීම	34,000
කාබනික පොහොර භාවිතය දිරි ගැන්වීම මගින් කාබනික වගා කලාප නිර්මාණය කිරීම	250
අතහැර දමන ලද කුඹුරු අක්කර 50,000ක් නැවත වගා කිරීම	800
වී ආරක්ෂණ තොගයක් පවත්වාගෙන යෑම සඳහා රජයෙහි වී මිලදී ගැනීමේ වැඩසටහන අඛණ්ඩව සිදු කරගෙන යෑම (වාර්ෂික වී නිෂ්පාදනයෙන් 8%-10% මිලට ගැනීමට ඉලක්ක කිරීම)	2,171
ප්‍රදානයන් සහ ණය ලබාදීම මගින් වාණිජ කෘෂිකර්මයෙහි නිරත වීමට ගොවියන් 26000කට ආධාර ලබාදීම (පලතුරු සහ එළවළු කල් තබා ගැනීම සඳහා ශීතාගාර පහසුකම් ලබා ගැනීම)	3,000
ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම (දළ වශයෙන් ගොවියන් 18,700කට විශ්‍රාම වැටුප් ලබා දීම)	4,000
ඉඟුරු සහ කහ ආනයනය නතර කිරීම සඳහා එකී බෝග වගා කිරීම දිරිගැන්වීම	-
ගොවියන් 16,000 අතර දේශගුණයට ඔරොත්තු දෙන කෘෂිකාර්මික ක්‍රම සහ තාක්ෂණයන් ප්‍රවර්ධනය කිරීම	250
තෝරා ගත් බෝග හයක් සඳහා දායකත්ව බෝග රක්ෂණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම	1,000
මුළු ප්‍රතිපාදන ප්‍රමාණය	52,621

වාරිමාර්ග සම්බන්ධයෙන් අයවැය කතාවෙහි ප්‍රධානතම අවධානය යොමු කරන ලද්දේ කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ වැව් ප්‍රතිසංස්කරණය කිරීම සහ කෘෂිකර්මය සහ අනිකුත් කටයුතු සඳහා වාරිමාර්ග පහසුකම් ඉහළ නැංවීම සඳහා ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමයි. අයවැය කතාව තුළ යෝජිත වාරිමාර්ග ආශ්‍රිත කටයුතු සඳහා අයවැය ප්‍රධාන යෝජනා තුළ නිරූපණය කරන ලද ආකාරයට ප්‍රතිපාදන වෙන් කරනු ලැබ ඇත. වාරිමාර්ග සඳහා වෙන් කරන ලද මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 41,463 කි. (2.6.3 වගුව)

2.6.3 වගුව: අයවැය කථාව සහ අයවැය ප්‍රධාන යෝජනා තුළ යෝජිත වාරිමාර්ග හා ආශ්‍රිත කටයුතු සහ ප්‍රතිපාදන	
කාර්යය	**ප්‍රතිපාදන (රු. මිලියන)**
කුඩා වැව් සහ ඇල මාර්ග නඩත්තු කිරීම (දිවයිනෙහි ක්ෂේත්‍ර ඇල මාර්ග ව්‍යාපෘති 4,000ක්, කුඩා වැව් 200ක්, කුඩා ඇනිකට් 200ක්, ඇල මාර්ග 250ක් සහ මහවැලි ප්‍රදේශවල කුඩා වැව් සහ ඇළ මාර්ග)	1,850
ප්‍රධාන සහ මධ්‍යම ප්‍රමාණයේ වාරි පද්ධති වල අත්‍යාවශ්‍ය හා හදිසි නඩත්තු කටයුතු	1,500
දිවයින පුරා ග්‍රාමීය වැව් 3,000ක් සහ ජල ධාරා පද්ධති 70ක් වැඩි දියුණු කිරීම මගින් අක්කර 15,0000කට වාරි ජලය ලබාදීම සහතික කිරීම	7,800
මධ්‍යම සහ ප්‍රධාන වාරි පද්ධති වල වැව් සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම	6,080
මහවැලි ප්‍රදේශවල වාරි පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම හා පොදු පහසුකම් ලබාදීම	1,850
වැසි ජලයෙන් 50% ගබඩා කිරීම සඳහා දැනට පවතින වැව් සහ ජලාශ වල ධාරිතාවය වැඩි දියුණු කිරීම සඳහා නව ජලාශ පද්ධතියක් ඉදි කිරීම	4,350
මොරගහකන්ද සහ කළු ගඟ පහළ නිම්න සංවර්ධන කටයුතු	8,455
යාන් ඔය ජලාශය යටතේ අනුරාධපුරය සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල අක්කර 1,000ක් මට්ටම් කිරීම සහ වාරි ක්ෂේත්‍රය සඳහා පහසුකම් සැලසීම	2,163
දැදුරු ඔය ජලාශයෙහි ප්‍රධාන ඇළ මාර්ග හා උප ජල මාර්ග කිලෝමීටර් 16.5 ක් ඉදිකිරීම	665
උමා ඔය හැරවීම සහ පහළ නිම්න සංවර්ධන කටයුතු	6,000
මන්නාරම, වවුනියාව, මොණරාගල, අම්පාර,හම්බන්තොට, අනුරාධපුරය, පොලොන්නරුව සහ මඩකලපුව යන දිස්ත්‍රික්කවල භූගත ජල මට්ටම් කැණීම සඳහා වන නියමු ව්‍යාපෘතිය	750
මුළු ප්‍රතිපාදන ප්‍රමාණය	41,463

වැවිලි අංශය ආශ්‍රිතව 2021 අයවැයෙහි ප්‍රධාන අවධානය යොමු කරන ලද්දේ තේ, පොල්, රබර් සහ කුරුඳු මත පදනම් වූ වැවිලි ආර්ථිකය නැවත පණ ගැන්වීම සහ කිතුල්, තල්, කජු. උක් යන කර්මාන්ත යොදා ගනිමින් වැවිලි කර්මාන්තය විවිධාංගීකරණය කිරීමයි. කාර්යයන් කීපයක් සඳහා වෙන් කරන ලද මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 7,255කි. (වගුව 2.6.4)

2.6.4 වගුව : අයවැය කතාව/ ප්‍රධාන අයවැය යෝජනා තුළ වැවිලි කර්මාන්තය ආශ්‍රිත යෝජිත කටයුතු සහ ප්‍රතිපාදන

අයවැය කතාව	**ප්‍රතිපාදන (රු. මිලියන)**
කුඩා තේ වතු හිමියන් හට නැවත වගා කිරීම සඳහා හෙක්ටයාරයකට රුපියල් 500,000ක්, නව වගාවන් සඳහා රුපියල් හෙක්ටයාරයකට රුපියල් 310,000ක් සහ තේ වලවල් පිරවීම සඳහා පැලයකට රුපියල් 100ක් සහ මධ්‍යම හා මහා පරිමාණ වගාවන් සඳහා නැවත වගා කිරීම සඳහා හෙක්ටයාරයකට රුපියල් 500,000ක් සහනාධාර ලෙස ලබා දීම	2,250
තේ මණ්ඩලයේ අරමුදල් සහ රජයේ අරමුදල් යොදා ගනිමින් තේ කර්මාන්ත ශාලා 150 ක් අලුත්වැඩියා කිරීම	60
ස්වයංක්‍රීය තේ දලු කැඩීමේ යන්ත්‍ර හඳුන්වා දීම	20
පොල් වගා කරුවන් හට සහනදායී මිලකට පොල් පැළ ලබාදීම	500
පොල් වගාකරුවන් සඳහා බැංකු හරහා ක්‍රියාත්මක කරන ලද කප්රුක ණය යෝජනා ක්‍රමය සඳහා පොලී සහනාධාර ලබාදීම	100
පොල් වගාවෙහි පලිබෝධ හා රෝග පාලනය කිරීම	205
ජාන තාක්ෂණය තුළින් වැඩිදියුණු කරන ලද රෝගවලට ඔරොත්තු දෙන පොල් පැළ නිෂ්පාදනය කිරීම	100
කුඩා රබර් වතු හිමියන් සඳහා සහනාධාර ලබා දීම (නැවත වගා කිරීම සඳහා රුපියල් 350,000ක් සහ අලුත් වගාවන් සඳහා රුපියල් 300,000)	1,500
තල් ආශ්‍රිත නිෂ්පාදන වැඩි දියුණු කිරීම හා ප්‍රවර්ධනය කිරීම (අත්කම්, ජෑම්, කෝඩියල් වැනි)	20
කුරුඳු, ගම්මිරිස් ඇතුළු සුළු අපනයන බෝග වගා කරුවන් සඳහා පැළ සහ මූල්‍ය සහනාධාර ලබා දීම	450
බුලත් සහ බඩ ඉරිහු යන බෝග වගාවන් සංවර්ධනය කිරීම	150
සුළු අපනයන බෝග ඇතුළු වෙනත් කෘෂිකාර්මික අගය දාමයන් සඳහා ගැලපුම් ප්‍රදානයන් ලබාදීම	1,400
සුළු අපනයන බෝග වගාවන් ආශ්‍රිත ප්‍රදේශ තුළ අපනයන ගම්මාන පිහිටුවීම	200
අගය එකතු කරන ලද කෘෂි අපනයන නිෂ්පාදන සඳහා කාර්මික වතු නිර්මාණය කිරීම (ඇල්පිටිය, කුරුණෑගල, මාතලේ)	300
මුළු ප්‍රතිපාදන ප්‍රමාණය	7,255

2.6.4 කෘෂිකාර්මික ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන්

දළ දේශීය නිෂ්පාදිතයෙන් 7%කට දායක වෙමින් සහ ජාතික අපනයන ඉපැයීම් වලින් 20.6%ක් උත්පාදනය කරමින් (ඇමරිකානු ඩොලර් බිලියන 2.5ක්) 2019 වර්ෂයේ දී (ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව) ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජීය සංවර්ධනයට කෘෂිකාර්මික අංශය විසින් සුවිශේෂී දායකත්වයක් ලබා දෙන ලදි. ජන සංගණන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ දත්ත අනුව රටේ ශ්‍රම බලකායෙන් හතරින් එකක් (පුද්ගලයන් මිලියන 2.072ක්) කෘෂිකාර්මික අංශයෙහි සේවා නියුක්තිය දරති.

සෞභාග්‍යයේ දැක්ම ජාතික ප්‍රතිපත්ති කාර්ය රාමුව තුළ ජනතා කේන්ද්‍රීය ආර්ථිකය යන තේමාව යටතේ රජයෙහි කෘෂිකාර්මික අංශය තුළ සමස්ත දැක්ම නිරූපණය වේ. දළ දේශිය නිෂ්පාදිතය වෙත කෘෂිකර්මය විසින් දක්වන දායකත්වය වැඩිදියුණු කිරීම සඳහා ඉහළ ගුණාත්මක භාවයකින් යුතු නිපැයුම් නිපදවීම සඳහා කුඩා නිෂ්පාදකයන්ගේ ඵලදායිත්වය ඉහළ නැංවීම සඳහා මෙන්ම ඔවුන්ගේ නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා නව තාක්ෂණය කාවැද්දීම සහ ව්‍යවසායකයන් දිරිමත් කිරීම මෙම කාර්යය රාමුවෙහි යෝජිත කෘෂිකාර්මික ප්‍රතිපත්ති යෝජනාවලියෙහි පාදක අදහස වේ. කෘෂිකාර්මික උප අංශයෙහි සුවිශේෂී ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන් සහ ඒ ආශ්‍රිත අයවැය අපේක්ෂණයන් 2.6.5 වගුවෙහි දැක්වේ.

2.6.5 වගුව: 2021 අයවැයට සාපේක්ෂව රජයේ කෘෂිකර්ම (දේශීය) ප්‍රතිපත්ති කාර්ය රාමුව

ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන්	අයවැය අපේක්ෂනයන්
ගොවියාගේ සුභසාධනය තහවුරු කිරීම	රජයෙහි ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම (දළ වශයෙන් ගොවියන් 187,000කට විශ්‍රාම වැටුප් ලබා දීම)
	තෝරාගත් භෝග 6ක් සඳහා දායකත්ව භෝග රක්ෂණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම
	ආහාර භෝග කීපයක් වගා කිරීම සඳහා ගොවියන්ට සහතික මිලක් ලබා දීම
කෘෂිකර්මය නවීකරණය කිරීම සහ ඉඩම්වල ඵලදායිතාවය ඉහළ නැංවීම	දේශීය ආහාර භෝග නිෂ්පාදනය ඉහළ නැංවීම මගින් ආනයන අඩු කිරීම
	ගොවියන් 16,000ක් අතර දේශගුණයට ඔරොත්තු දෙන කෘෂිකාර්මික ක්‍රම සහ තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම
	ආනයනය නතර කිරීම සඳහා ඉහුරු සහ කහ වගා කටයුතු දිරිමත් කිරීම
	ප්‍රදානයන් සහ ණය ලබාදීම මගින් වාණිජ කෘෂිකර්මයෙහි නිරතවීම සඳහා ගොවියන් 26,000 ක ට ආධාර ලබාදීම
	අත්හැර දමන ලද කුඹුරු ඉඩම් අක්කර 50,000ක් නැවත වගා කිරීම
තරුණ ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම	අදාළ නොවේ
පොහොර භාවිතයෙහි විප්ලවයක්	වී සඳහා නොමිලයේ ද සහ අනිකුත් භෝග සඳහා කිලෝ ග්‍රෑම් 50ක බෑගයක් රුපියල් 1,500ක සහන මිලකට ද පොහොර ලබාදීම
	කාබනික පොහොර භාවිතය දිරි ගැන්වීම මගින් කාබනික වගා කලාප නිර්මාණය කිරීම
බීජ සහ වගා ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම	අදාළ නොවේ
ඇසුරුම්කරණය සහ ගබඩාකරණය	පලතුරු සහ එළවළු කල්තබා ගැනීම සඳහා ශීතාගාර පහසුකම් ලබා ගැනීමට ණය පහසුකම් ලබාදීම සහ රේගු ගාස්තු වල සහන ලබා දීම
අලෙවිකරණය හා ප්‍රවාහනය	අදාළ නොවේ
වී ගොවියන්ට උපකාර කිරීම	ආරක්ෂණ වී තොගයන් පවත්වාගෙන යෑම සඳහා රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන ඉදිරියට කරගෙන යෑම (වාර්ෂික වී නිෂ්පාදනයෙන් 8%-10% මිලදී ගැනීමට ඉලක්ක කිරීම)
	වී වගා කිරීම සඳහා ගොවියන් හට සහතික මිලක් ලබා දීම

ශ්‍රී ලංකා රජයෙහි ප්‍රතිපත්ති කාර්ය රාමුව තුළ නිරූපණය කරන ලද පරිදි වාරිමාර්ග උප අංශය සඳහා සුවිශේෂී ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන් සහ ඒ ආශ්‍රිතව අයවැය වෙතින් සිදු කරනු ලබන අපේක්ෂණයන් 2.6.6 වගුවෙහි දැක්වේ

2.6.6 වගුව: 2021 අයවැයට සාපේක්ෂව රජයේ කෘෂිකර්ම (වාරිමාර්ග) ප්‍රතිපත්ති	
ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන්	**අයවැය අපේක්ෂකයන්**
කාර්යක්ෂම ලෙස ජලය භාවිතා කිරීම සඳහා කෘෂිකර්මය තුළ ජල බිංදු වාරිමාර්ග ක්‍රම සහ නවීන ශිල්පීය ක්‍රම භාවිතා කිරීම දිරිමත් කිරීම. මේ සඳහා අඩු පොලී ණය පහසුකම් සහ බදු සහන හඳුන්වාදීම	අදාළ නොවේ
වැව් / ජලාශ වල දැනට පවතින ධාරිතාවයන් පුළුල් කිරීම මගින් වතුර ගබඩා කිරීමේ ධාරිතාවය වැඩි දියුණු කිරීම සහ අලුත් වැව් ඉදිකිරීම	කුඩා වැව් සහ ඇළ මාර්ග නඩත්තු කිරීම (දිවයින තුළ ක්ෂේත්‍ර ඇල මාර්ග ව්‍යාපෘති 4,000ක්, කුඩා වැව් 200ක්, ඇනිකට් 200ක්, ඇලමාර්ග 250 ක් සහ මහවැලි ප්‍රදේශ තුළ කුඩා වැව් සහ ඇළ මාර්ග)
	මහා සහ මධ්‍යම පරිමාණයේ වාරිමාර්ග පද්ධති වල හදිසි සහ අත්‍යාවශ්‍ය නඩත්තු කටයුතු
	දිවයින පුරා ග්‍රාමීය වැව් තුන් දහසක් සහ ජල ධාරා පද්ධති හැත්තෑවක් වැඩි දියුණු කිරීම මගින් අක්කර 15,0000කට වාරි ජල සැපයුම සහතික කිරීම
	මධ්‍යම සහ මහා පරිමාණ වාරිමාර්ග පද්ධති වලට අයත් වැව් සහ ඇළ මාර්ග පුනරුත්ථාපනය කිරීම
	මහවැලි ප්‍රදේශවල වාරි පද්ධති පුනරුත්ථාපනය කිරීම සහ පොදු පහසුකම් සැපයීම
	වැසි ජලයෙන් 50%ක් ගබඩා කිරීම සඳහා දැනට පවතින වැව් සහ ජලාශ වල ධාරිතාවය වැඩි දියුණු කිරීමට නව ජලාශ පද්ධතියක් ඉදි කිරීම
	මොරගහකන්ද සහ කළු ගඟ පහළ නිම්න සංවර්ධන කටයුතු
	යාන් ඔය ජලාශය යටතේ අනුරාධපුරය සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක තුළ ඉඩම් අක්කර 1,000ක් මට්ටම් කිරීම සහ වාරි ක්ෂේත්‍රයට පහසුකම් සැපයීම
	දැදුරු ඔය ජලාශයෙහි ප්‍රධාන ඇළ මාර්ග සහ උප ජල මාර්ග කිලෝමීටර 16.5ක් ඉදිකිරීම
	උමා ඔය හැරවීම ඉහළ සහ පහළ නිම්න සංවර්ධන කටයුතු
	මන්නාරම, වවුනියාව, මොනරාගල, අම්පාර හම්බන්තොට, අනුරාධපුරය, පොළොන්නරුව සහ මඩකලපුව යන දිස්ත්‍රික්කවල භූගත ජල මට්ටම් කැනීම සඳහා නියමු ව්‍යාපෘතිය

වැවිලි උපඅංශය සඳහා සුවිශේෂී ප්‍රතිපත්තිමය ප්‍රමුඛතාවයන් සහ ඒ ආශ්‍රිත අයවැය ව අපේක්ෂාවන් 2.6.7 වගුවෙහි දැක්වේ.

2.6.7 වගුව: 2021 අයවැයට සාපේක්ෂව රජයේ කෘෂිකර්ම (වැවිලි) ප්‍රතිපත්ති	
ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන්	**අයවැය අපේක්ෂණයන්**
තේ රබර් සහ පොල් වගා කිරීම සඳහා සහනාධාර ලබා දීම	තේ වතු හිමියන් හට නැවත වගා කිරීම සඳහා හෙක්ටයාරයකට රුපියල් 500,000ක්, නව වගාවන් සඳහා හෙක්ටයාරයකට රුපියල් 310,000ක් සහ තේ වලවල් පිරවීම සඳහා පැලයකට රුපියල් 100ක් සහ මධ්‍යම හා මහා පරිමාණ වගාවන් සඳහා නැවත වගා කිරීම සඳහා හෙක්ටයාරයකට රුපියල් 500,000ක් සහනාධාර ලෙස ලබා දීම
	කුඩා රබර් වතු හිමියන් සඳහා සහනාධාර ලබා දීම (නැවත වගා කිරීම සඳහා රුපියල් 350,000ක් සහ අලුත් වගාවන් සඳහා රුපියල් 300,000)
	පොල් වගාකරුවන් හට සහන මිලකට පොල් පැළ ලබාදීම
	පොල් වගා කිරීම සඳහා බැංකු හරහා ක්‍රියාත්මක කරනු ලබන කප්රුක ණය යෝජනා ක්‍රමය සඳහා පොලී සහනාධාර ලබා දීම
සුළු අපනයන බෝග වගා කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා සහනාධාර/ ප්‍රදානයන් ලබා දීම	කුරුඳු ගම්මිරිස් ඇතුළු සුළු අපනයන බෝග වගාවන් සිදු කරන ගොවියන් හට පැළ සහ මූල්‍ය සහනාධාර ලබාදීම
	සුළු අපනයන බෝග ඇතුළු අනිකුත් කෘෂිකාර්මික අගය දාමයන් සඳහා ගැලපුම් ප්‍රදානයන් ලබාදීම

නවීන තාක්ෂණය යොදා ගනිමින් තේ අංශය නවීකරණය කිරීම	2021 වර්ෂයේ දී රජයේ අරමුදල් සහ තේ මණ්ඩලයේ අරමුදල් යොදා ගනිමින් තේ කර්මාන්ත ශාලා 150ක් අලුත්වැඩියා කිරීම
	ස්වයංක්‍රීය තේ දලු කැඩීමේ යන්ත්‍ර හඳුන්වා දීම
පොල් පොල් වගාවේ පලිබෝධ/ රෝග සඳහා තාක්ෂණික විසඳුම් නිර්මාණය කිරීම	පොල් වගාවේ පළිබෝධ සහ රෝග පාලනය කිරීම
	ජාන තාක්ෂණය තුළින් වැඩි දියුණු කරන ලද රෝග වලට ඔරොත්තු දෙන පොල් පැළ නිෂ්පාදනය කිරීම
සුළු අපනයන භෝග අගය එකතු කර අපනයනය ප්‍රවර්ධනය කිරීම	තල් ආශ්‍රිත නිෂ්පාදන වැඩි දියුණු කිරීම හා ප්‍රවර්ධනය කිරීම සහ බුලත් සහ බඩඉරිඟු බෝග වගාවන් සංවර්ධනය කිරීම
	සුළු අපනයන බෝග ආශ්‍රිත ප්‍රදේශ වල අපනයන ගම්මාන පිහිටුවීම
	අගය එකතු කරන ලද කෘෂි අපනයන නිෂ්පාදන සඳහා කර්මාන්ත ගම්මාන නිර්මාණය කිරීම

2.6.5 කෘෂිකාර්මික අංශය විශ්ලේෂණය කිරීම

2021 වර්ෂයේදී කෘෂිකාර්මික අංශය සඳහා යෝජිත ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් බිලියන 149 ක් වන අතර එය 2020 වර්ෂයේ ඇස්තමේන්තුවට සාපේක්ෂව 13% ක වර්ධනයකි. එම වියදම් වලින් එය වියදම් වලින් 4.1% ක් ද දළ දේශීය නිෂ්පාදිතයෙන් 0.85% ක් ද වන අගයක් ගනී. 2018 වර්ෂයේ සිට වර්ෂයකට 28%කට ආසන්න සාමාන්‍ය අනුපාතිකයකින් වියදම් වර්ධනය වී ඇත. පුනරාවර්තන වියදම් වල 11% ක වර්ධනයට සාපේක්ෂව ප්‍රාග්ධන වියදම් 35% කින් ඉහළ යෑම අවධානයට ගැනීම වැදගත්ය. රටෙහි කෘෂිකාර්මික අංශය නවීකරණය කිරීම සඳහා රජයෙහි ප්‍රතිපත්තිමය නැඹුරුතාවය මෙමගින් ප්‍රමාණවත් ලෙස නිරූපණය කරනු ලැබේ.

අයවැය කටයුතු වල සම්පූර්ණ වටිනාකම රුපියල් බිලියන 101කි. අයවැය කථාව තුළ ඉදිරිපත් කරන කරන ලද සමහර අය වැය යෝජනා සඳහා අයවැය ප්‍රතිපාදන වෙන් කරනු ලැබ නොමැත. උදාහරණයක් ලෙස ඉඟුරු සහ කහ වගාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා කිසිදු ප්‍රතිපාදනයක් වෙන් කරනු ලැබ නොමැත. එලෙසම කිතුල්, කජු සහ උක් විවිධාංගීකරණය කිරීම සඳහා කිසිදු විශේෂිත ප්‍රතිපාදනයක් වෙන්කර නොමැත. උදාහරණයක් ලෙස ලංකා සීනි සමාගමෙහි නිෂ්පාදන ධාරිතාවය මෙට්‍රික් ටොන් 70,000කින් වැඩි කිරීම, කර්මාන්ත ශාලා නවීකරණය කිරීම සහ යෝජනා කරන ලද පරිදි එතනෝල් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන ඉහළ නැංවීම සඳහා ස්කාගාර නවීකරණය කිරීමට ප්‍රතිපාදන දක්නට නොලැබේ. එලෙසම, කජු අක්කර 6,500ක් වගා කිරීම සඳහා කිසිදු අයවැය ප්‍රතිපාදනයක් වෙන් කරනු ලැබ නොමැත.

සමස්තයක් ලෙස, වෙන් කරනු ලැබ ඇති වියදම් ප්‍රතිපාදන ශ්‍රී ලංකා රජයෙහි ප්‍රතිපත්තිමය ප්‍රමුඛතාවයන් හා අනුගත වේ. කෙසේ වුවද, තරුණ ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම, අලෙවිකරණය හා ප්‍රවාහනය සහ බීජ නිෂ්පාදනය හා රෝපණ ද්‍රව්‍ය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමක් හෝ යෝජනා ඉදිරිපත් කිරීමක් දක්නට නොලැබේ. එලෙසම VPS හි යෝජනා කරන ලද කාර්යක්ෂම ජල භාවිතය සඳහා කෘෂිකර්මය තුළ ජල බින්දු වාරි තාක්ෂණය සහ නවීන ශිල්පීය ක්‍රම භාවිතය දිරිගැන්වීම සඳහා ද ප්‍රතිපාදන වෙන් කිරීමක් දක්නට නොලැබේ.

2.6.6 පශු සම්පත් වියදම් සාරාංශය

පූර්වයෙන් වෙනම අමාත්‍යාංශයක් විසින් මෙහෙයවන ලද පශු සම්පත් අංශය වර්තමානයේ දී කෘෂිකර්ම අමාත්‍යාංශයෙහි විෂය පථය යටතේ පවතින පශුසම්පත්, ගොවිපළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය විසින් මෙහෙයවනු ලැබේ. පසුගිය වසර තුනක අයවැය මගින් සහ නව අයවැය යෝජනා මගින් මෙම අංශය සඳහා වෙන් කර ඇති අයවැය වෙන්කිරීම්වල විස්තරාත්මක සාරාංශයක් 2.6.8 වගුවෙහි දක්වා තිබේ:

2.6.8 වගුව: 2018 සිට 2021 දක්වා වියදම් සාරාංශය

පශුසම්පත්, ගොවිපළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය	වියදම් සාරාංශය				
	2018 තථ්‍ය	2019 සංශෝධිත	2020 ඇස්තමේන්තුව	2021 අයවැය	පෙර වර්ෂයට සාපේක්ෂව වෙනස් වීමෙහි ප්‍රතිශතය (%) 2020-2021
සමස්ත වියදම (රු.මි.)	1,062	1,475	1,752	2,831	62
සමස්ත වියදම (අයවැයෙහි %)	0.04	0.04	0.05	0.08	0.03
සමස්ත අයවැය (දළ දේශීය නිෂ්පාදිතයෙහි %)	0.01	0.01	0.01	0.02	0.01

*මූලාශ්‍රය: **2020** අයවැය ඇස්තමේන්තු; 2020 සහ 2021 විසර්ජන පනත් කෙටුම්පත්*

2.6.7 පශුසම්පත් අයවැය උපකල්පන

කිරිපිටි ආනයනය කිරීම සඳහා වාර්ෂිකව වැය වන ඇමරිකානු ඩොලර් මිලියන 300 (රු. බිලියන 55) ට අධික වූ විදේශ විනිමය ක්‍රමයෙන් අඩු කිරීම සහ ගෘහස්ථ කිරි නිෂ්පාදනය තුළින් දියර කිරි සඳහා වැඩි වෙමින් පවතින ඉල්ලුම සපුරාලීම රජයේ ප්‍රධාන ම ප්‍රතිපත්ති ප්‍රමුඛතාවය වේ. අයවැය මගින් වෙන් කර ඇති අයවැය වෙන්කිරීම් වලින් අයවැය කථාවෙහි යෝජිත බොහෝ ක්‍රියාකාරකම් අවධාරණය කර ඇත (වගුව 2.6.9). අයවැය කථාවෙහි සඳහන් කර නොමැති, දේශගුණික තත්වයන්ට ඔරොත්තු දීම ගොඩනැගීම සහ දායක රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා ද යම් අයවැය වෙන්කිරීම් ප්‍රමාණයක් වෙන් කර ඇත. දේශීය කෘෂිකර්මාන්තය සඳහා වෙන් කර ඇති මුළු වෙන්කිරීම් ප්‍රමාණය රු. මි. 52,621 ක් වේ.

2.6.9 වගුව: අයවැය කථාවෙහි යෝජිත පශුසම්පත් ක්‍රියාකාරකම් සහ අයවැය වෙන් කිරීම්

ක්‍රියාකාරකම්	වෙන්කිරීම (රු. මි.)
වාර්ෂිකව වසු පැටවුන් 50,000 ක් බිහි කිරීම සඳහා අභිජනන වැඩසටහන ශක්තිමත් කිරීම	532
නැවුම් කිරි එකතු කර ගබඩා කිරීම සඳහා කුඩා කිරි සමුපකාර සමිති පිහිටුවීම	970
කුඩා හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපළ ඇති කිරීම	45
වාර්ෂිකව තණකොළ මෙට්රික් ටොන් 100,000 ක් නිෂ්පාදනය කිරීම සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සමඟ එක්ව තණකොළ හා බඩ ඉරිඟු වගා වැඩසටහන හඳුන්වා දීම.	250
ජාතික පශු සම්පත් මණ්ඩලයේ ගොවිපළ ගව අභිජනන ගොවිපළ ලෙස සංවර්ධනය කිරීම සඳහා කිරි ගවයින් ආනයනය කිරීම	අදාළ නැත
කිරි ගවයින් මිලදී ගැනීම, පරිසර හිතකාමී ගව මඩු ඉදිකිරීම සහ සුළු හා මධ්‍ය පරිමාණ කිරි ගොවිපළ සඳහා උපකරණ මිලදී ගැනීම පිණිස 7.5% ක වාර්ෂික පොළී අනුපාතයක් යටතේ රු. 500,000 ක විශේෂ ණය පහසුකමක් සපයා දීමේ ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.	අදාළ නැත
කිරිපිටි ආනයනය කරනවා වෙනුවට කිරිපිටි අපනයන සැකසුම් කිරීම සඳහා සමාගම්වලට පහසුකම් සැලසීමේ අරමුණ ඇතිව ඇමරිකානු ඩොලර් මිලියන 25 ට වැඩි ප්‍රාග්ධන ආයෝජන සඳහා වසර 5 ක උපායමාර්ගික ආයෝජන බදු සහන ලබා දීම.	
මුළු වෙන්කිරීම	1,797

2.6.8 පශු සම්පත් ප්‍රතිපත්ති ප්‍රමුඛතා

පශු සම්පත් අංශය සඳහා වන නිශ්චිත ප්‍රතිපත්ති ප්‍රමුඛතා සහ අයවැයෙහි ඒ ආශ්‍රිත අපේක්ෂාවන් 2.6.10 වගුවෙහි දක්වා ඇත.

2.6.10 වගුව: 2021 අයවැයට අනුව පශු සම්පත් අංශය සම්බන්ධ රජයේ ප්‍රතිපත්ති

ප්‍රතිපත්ති ප්‍රමුඛතා	අයවැය අපේක්ෂාවන්
දේශීය අවශ්‍යතාය සපුරාලීම සඳහා දේශීය දියර කිරි නිෂ්පාදනය වැඩි කිරීම	වාර්ෂිකව වසු පැටවුන් 50,000 ක් බිහි කිරීම සඳහා අභිජනන වැඩසටහන ශක්තිමත් කිරීම.
	නැවුම් කිරි එකතු කිරීම හා ගබඩා කිරීම සඳහා කුඩා කිරි සමුපකාර සමිති පිහිටුවීම
ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හරහා උසස් තත්ත්වයේ තණකොළ හඳුන්වා දීම	වාර්ෂිකව තණකොළ මෙට්රික් ටොන් 100,000 ක් නිෂ්පාදනය කිරීම සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සමඟ එක්ව තණකොළ හා බඩ ඉරිඟු වගා වැඩසටහන හඳුන්වා දීම.
කිරි ගොවීන්ට සහ සමුපකාරවලට සහනාධාර මිල ගණන් යටතේ සහ පහසු ගෙවීමේ කොන්දේසි යටතේ යාන්ත්‍රික කිරි දෙවීමේ උපකරණ සපයා දීම. 'සිරස් ගව මඩු පද්ධතියක්' හඳුන්වා දීම.	කිරි ගවයින් මිලදී ගැනීම, පරිසර හිතකාමී ගව මඩු ඉදිකිරීම සහ සුළු හා මධ්‍ය පරිමාණ කිරි ගොවිපළ සඳහා උපකරණ මිලදී ගැනීම පිණිස 7.5% ක වාර්ෂික පොළී අනුපාතයක් යටතේ රු. 500,000 ක විශේෂ ණය පහසුකමක් සපයා දීමේ ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.
මධ්‍යම හා මහා පරිමාණ ගව ගොවිපළ ඉදිකිරීම සඳහා අවශ්‍ය ඉඩම් හා ආයෝජන පහසුකම් සපයා දීම.	කිරිපිටි ආනයනය කරනවා වෙනුවට කිරිපිටි අපනයන සැකසුම් කිරීම සඳහා සමාගම්ව ලට පහසුකම් සැලසීමේ අරමුණ ඇතිව ඇමරිකානු ඩොලර් මිලියන 25 ට වැඩි ප්‍රාග්ධන ආයෝජන සඳහා වසර 5 ක උපායමාර්ගික ආයෝජන බදු සහන ලබා දීම.

කිරි ගබඩා කිරීමේ පහසුකම් වැඩි කිරීම සඳහා කුඩා පරිමාණයේ සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන ශීතකරණ පහසුකම් හඳුන්වා දීම.	වෙන් කිරීම් නැත
විවිධ භූගෝලීය කලාපයන්ට ගැළපෙන පරිදි ගව වර්ග තෝරා ගැනීම සහ හඳුන්වා දීම සඳහා පර්යේෂණ සිදු කිරීම.	වෙන් කිරීම් නැත
කිරිවල ගුණාත්මකභාවය මත පදනම්ව නව කිරි මිල ක්‍රමයක් ස්ථාපිත කිරීම.	වෙන් කිරීම් නැත
ගුණාත්මක ගව ආහාර සඳහා තීරුබදු අඩු කිරීම.	වෙන් කිරීම් නැත
කුකුළු මස් හා බිත්තර නිෂ්පාදනය පුළුල් කිරීම, සහ එම නිෂ්පාදන අපනයනය කිරීමට මහා පරිමාණ නිෂ්පාදකයින්ව දිරිමත් කිරීම	සුළු හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපළ ස්ථාපනය කිරීම

2.6.9 පශු සම්පත් විශ්ලේෂණය

2021 වර්ෂයේ දී පශු සම්පත් අංශයට වෙන් කළ මුදල රු. මිලියන 2,831 ක් වන අතර එය 2020 වර්ෂයේ ඇස්තමේන්තුවට සාපේක්ෂව 62% ක වර්ධනයකි. එය අයවැයෙන් 0.03% ක් ද, දළ දේශීය නිෂ්පාදිතයෙන් 0.01% ක් ද වේ. 2018 වර්ෂයේ සිට, වියදම වසරකට 40% කට ආසන්න සාමාන්‍ය අනුපාතයකින් වර්ධනය වී තිබේ. පුනරාවර්තන වියදම්වල 27% ක වර්ධනයට සාපේක්ෂව, ප්‍රාග්ධන වියදම් 67% කින් වර්ධනය වී ඇති බව සැලකිල්ලට ගැනීම වැදගත් වේ. මෙය රටේ පශු සම්පත් අංශය නවීකරණය කිරීම සඳහා වන රජයේ ප්‍රතිපත්ති දිශානතිය ප්‍රමාණවත් ලෙස පිළිබිඹු කරයි.

අයවැයගත ක්‍රියාකාරකම්වල මුළු වටිනාකම රු. මි. 1,797 ක් වේ. අයවැය කථාවෙහි ඉදිරිපත් කර ඇති සමහර ප්‍රධාන යෝජනා සඳහා වෙන්කිරීම් නොමැත. ඒවා නම්, (i) ජාතික පශු සම්පත් මණ්ඩලයේ රිදීගම සහ බෝපත්තලාව ගොවිපළ ගව අභිජනන ගොවිපළ ලෙස සංවර්ධනය කිරීම සඳහා කිරි ගවයින් ආනයනය කිරීම; (ii) කිරි ගවයින් මිලදී ගැනීම, පරිසර හිතකාමී ගව මඩු ඉදිකිරීම සහ සුළු හා මධ්‍ය පරිමාණ කිරි ගොවිපළ සඳහා උපකරණ මිලදී ගැනීම පිණිස 7.5% ක වාර්ෂික පොළී අනුපාතයක් යටතේ රු. 500,000 ක විශේෂ ණය පහසුකමක් සපයා දීමේ ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම; සහ කිරිපිටි ආනයනය කරනවා වෙනුවට කිරිපිටි අපනයන සැකසුම් කිරීම සඳහා සමාගම්වලට පහසුකම් සැලසීමේ අරමුණ ඇතිව ඇමරිකානු ඩොලර් මිලියන 25 ට වැඩි ප්‍රාග්ධන ආයෝජන සඳහා වසර 5 ක උපායමාර්ගික ආයෝජන බදු සහන ලබා දීම.

උසස් තත්ත්වයේ තෘණ, ආහාර සහ කළමනාකරණ පිළිවෙත් හඳුන්වා දීම මගින් දේශීය කිරි නිෂ්පාදනය වැඩි කිරීම පශු සම්පත් අංශයේ රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා අතරට ඇතුළත් වේ. සියළුම අයවැය යෝජනා ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන්ට අනුකූල නොවේ. කිරි ගබඩා කිරීමේ පහසුකම් වැඩි කිරීම සඳහා කුඩා පරිමාණයේ සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන ශීතකරණ පහසුකම් හඳුන්වාදීම, විවිධ භූගෝලීය කලාපයන්ට ගැළපෙන පරිදි ගව වර්ග තෝරා ගැනීම සහ හඳුන්වාදීම සඳහා පර්යේෂණ සිදු කිරීම, කිරිවල ගුණාත්මකභාවය මත පදනම්ව නව කිරි මිල ක්‍රමයක් ස්ථාපිත කිරීම, සහ ගුණාත්මක ගව ආහාර සඳහා තීරුබදු අඩු කිරීම සඳහා යෝජනා හෝ වෙන්කිරීම් නොමැත.

2.6.10 ධීවර අංශයේ වියදම් සාරාංශය

ධීවර අංශය පාලනය කරනු ලබන්නේ ධීවර අමාත්‍යාංශය සහ විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇතිකිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශය විසින් වේ. පසුගිය වසර තුනක අයවැය මගින් සහ නව අයවැය යෝජනා මගින් මෙම අංශය සඳහා වෙන් කර ඇති අයවැය වෙන්කිරීම්වල විස්තරාත්මක සාරාංශයක් 2.6.11 වගුවෙහි දක්වා තිබේ:

2.6.11 වගුව: 2018 සිට 2021 දක්වා ධීවර අංශයේ වියදම් සාරාංශය

	සමස්ත වියදම (රු.මි.)				
	2018 තථ්‍ය	2019 සංශෝධිත	2020 ඇස්තමේන්තුව	2021 අයවැය	පෙර වර්ෂයට සාපේක්ෂව වෙනස් වීමෙහි ප්‍රතිශතය (%)
ධීවර අමාත්‍යාංශය	5,621	1,136	1,360	4,584	237
විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇතිකිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශය	0	0	4,235	3,774	11

ධීවර අංශය සඳහා සමස්ත වියදම (රු.මී.)	5,621	1,136	5,595	8,358	49
සමස්ත වියදම (අයවැයෙහි %)	0.21	0.03	0.15	0.23	0.10
සමස්ත අයවැය (දළ දේශීය නිෂ්පාදිතයෙහි %)	0.04	0.01	0.04	0.05	0.01
මූලාශ්‍රය: ***2020*** *අයවැය ඇස්තමේන්තු; 2020 සහ 2021 විසර්ජන පනත් කෙටුම්පත්*					

2.6.11 ධීවර අංශයේ අයවැය උපකල්පන

ග්‍රාමීය ආදායම් මාර්ග වැඩි කිරීම සහ ධීවර කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම තුළින් පෝෂ්‍යදායී ආහාර සපයා දීම සහතික කිරීමයි රජයේ ප්‍රධාන ප්‍රතිපත්ති ප්‍රමුඛතාවය වේ. අයවැය මගින් සිදු කර ඇති අයවැය වෙන්කිරීම් වලින් අයවැය කථාවෙහි යෝජිත සමහර ක්‍රියාකාරකම් අවධාරණය කර ඇත (වගුව 2.6.12). මෙම අංශය සඳහා මුළු වෙන්කිරීම් ප්‍රමාණය රු. මී. 8,358 ක් වේ.

2.6.12 වගුව: ධීවර අංශය සඳහා අයවැය කථාවෙහි යෝජනා කර ඇති ක්‍රියාකාරකම් සහ අයවැය වෙන්කිරීම්	
ක්‍රියාකාරකම්	**වෙන් කිරීම් (රු. මී.)**
ධීවර වරාය සංවර්ධනය කිරීම	2,560
නවීන සන්නිවේදන පහසුකම්, ශීතකරණ, ඉන්ධන සැපයුම සහ සනීපාරක්ෂක පහසුකම් සහිතව සියළුම ධීවර වරායන් සහ නැංගුරම්පොළ වැඩිදියුණු කිරීම	558
මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම යටතේ මුහුදු කුඩැල්ලන් අභිජනනය කිරීමේ මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම	300
මිරිදිය මසුන් ප්‍රවර්ධනය කිරීම සඳහා වසර 2 ක් තුළ ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම	147
අපනයන ආදායම වාර්ෂිකව 10% කින් වර්ධනය කර ගැනීම සඳහා විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානවල සහ කරදිය විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානවල යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම	251
මිරිදිය මත්ස්‍ය බීජ නිෂ්පාදනය වැඩි දියුණු කිරීම	400
වෙරළබඩ ප්‍රදේශවල මත්ස්‍ය ගහණය වැඩි කිරීමට සහ පරිසර හිතකාමී නවීන උසස් තාක්ෂණික ක්‍රම භාවිතා කරමින් මත්ස්‍ය අස්වැන්න වැඩි කිරීමට විද්‍යාත්මක ක්‍රමවේදයක් හඳුන්වා දීම	70
ජාත්‍යන්තර මුහුදු තීරයේ මසුන් ඇල්ලීම පුළුල් කිරීම සඳහා බහු දින ධීවර යාත්‍රා 4,500 ක් සඳහා වන්දිකා තාක්ෂණික පහසුකම් සැපයීම	31
ලංකා ධීවර සංස්ථාවේ සම්පූර්ණයෙන් ම ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා රුපියල් මිලියන 500 ක් වෙන් කිරීමට යෝජනා කිරීම	අදාළ නැත
කරවල, උම්බලකඩ සහ ටින් කළ මාළු නිෂ්පාදනය සඳහා ශ්‍රී ලංකාවේ නොමැති මසුන් ආනයනය කිරීම සහ මසුන් අපනයනය කිරීම සඳහා ඇති පරිපාලන ක්‍රියාවලිය සරල කිරීම	අදාළ නැත
මුළු වෙන්කිරීම	4,317

2.6.12 ධීවර අංශයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා

ධීවර අංශය සඳහා වන විශේෂිත ප්‍රතිපත්ති ප්‍රමුඛතා සහ ඒ ආශ්‍රිත අයවැය අපේක්ෂා 2.6.13 වගුවෙහි දක්වා ඇත.

2.6.13 වගුව: 2021 අයවැය අනුව ධීවර අංශය සම්බන්ධ රජයේ ප්‍රතිපත්ති	
ප්‍රතිපත්ති ප්‍රමුඛතා	**අයවැය අපේක්ෂා**
අපේ වෙරළබඩ ප්‍රදේශවල මත්ස්‍ය ගහණය වැඩි කිරීම සඳහා සහ අපගේ කලපු වල පාරිසරික තත්ත්වයන් වැඩි දියුණු කිරීම සඳහා විද්‍යාත්මක ක්‍රම හඳුන්වා දීම.	වෙරළබඩ ප්‍රදේශවල මත්ස්‍ය ගහණය වැඩි කිරීමට සහ පරිසර හිතකාමී නවීන උසස් තාක්ෂණික ක්‍රම භාවිතා කරමින් මත්ස්‍ය අස්වැන්න වැඩි කිරීමට විද්‍යාත්මක ක්‍රමවේදයක් හඳුන්වා දීම
පවත්නා සියළුම ධීවර වරායන් නවීකරණය කිරීම සහ මහා පරිමාණ හා බහු දින ධීවර යාත්‍රා සඳහා ප්‍රවේශය ලබා දීම සඳහා අවශ්‍ය වන්නේ නම් නව ධීවර වරායන් ඉදිකිරීම.	ධීවර වරාය සංවර්ධනය කිරීම
	නවීන සන්නිවේදන පහසුකම්, ශීතකරණ, ඉන්ධන සැපයුම සහ සනීපාරක්ෂක පහසුකම් සහිතව සියළුම ධීවර වරායන් සහ නැංගුරම්පොළ වැඩිදියුණු කිරීම

නවීන තාක්ෂණික හා මෙහෙයුම් පහසුකම් වලින් සමන්විත දියුණු බහු දින ධීවර බෝට්ටු කිහිපයක් අත්පත් කර ගැනීම	ජාත්‍යන්තර මුහුදු තීරයේ මසුන් ඇල්ලීම පුළුල් කිරීම සඳහා බහු දින ධීවර යාත්‍රා 4,500 ක් සඳහා වන්දිකා තාක්ෂණික පහසුකම් සැපයීම
කරදිය හා මිරිදිය මත්ස්‍ය අභිජනනය පුළුල් කිරීම සඳහා ධීවර ප්‍රජා සංගම් සහ ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය සමඟ ඒකාබද්ධව වැඩසටහනක් ආරම්භ කිරීම.	මුහුදු කූඩැල්ලන් සහ මිරිදිය ඉස්සන් අභිජනනය කිරීමේ මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම, විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානවල සහ කරදිය විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානවල යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම
	මිරිදිය මත්ස්‍ය බීජ නිෂ්පාදනය වැඩි දියුණු කිරීම
ජලජීවී වගාව පුළුල් කිරීම හා සංවර්ධනය කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා අඩු පොළී ණය, බදු ප්‍රතිලාභ සහ රක්ෂණ ආවරණ පහසුකම් සහ උපදේශනය සපයා දීම හා වෙළඳපොළ සම්බන්ධීකරණ සහාය සපයා දීම	මිරිදිය මසුන් ප්‍රවර්ධනය කිරීම සඳහා වසර 2 ක් තුළ ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම
ටින් මාළු නිෂ්පාදනය පුළුල් කිරීම සඳහා පෞද්ගලික සමාගම්වලට සහ ව්‍යවසායකයින්ට ඉඩම්, ආයෝජන අරමුදල් සහ තාක්ෂණික සහාය ලබා දීම.	කරවල, උම්බලකඩ සහ ටින් කළ මාළු නිෂ්පාදනය සඳහා ශ්‍රී ලංකාවේ නොමැති මසුන් ආනයනය කිරීම සහ මසුන් අපනයනය කිරීම සඳහා ඇති පරිපාලන ක්‍රියාවලිය සරල කිරීම
බහු දින ධීවර යාත්‍රා සඳහා මුහුදු ජලය භාවිතා කරමින් ශීතකරණ පද්ධති සකස් කිරීම සහ එවැනි උපකරණවල සූර්ය බලශක්තිය භාවිතා කිරීම දිරිගැන්වීම.	වෙන් කිරීම් නැත
ධීවර කර්මාන්තයේ නියුතුවූවන්ට ඔවුන් අල්ලාගත් මත්ස්‍ය අස්වැන්න සුරක්ෂිතව වෙරළට ගෙන ඒම සඳහා සහ ගොඩබිමට ගෙන එන මසුන් සුරක්ෂිතව ගොඩබෑම, ප්‍රවාහනය සහ ශීතකිරීම සඳහා පොළී රහිත ණය ක්‍රමයක් ආරම්භ කිරීම.	වෙන් කිරීම් නැත
ධීවර ප්‍රජාව සඳහා ඵලදායී රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීම.	වෙන් කිරීම් නැත
නිෂ්පාදකයා සහ පාරිභෝගිකයා යන දෙපාර්ශ්වයටම සාධාරණ ගනුදෙනුවක් සිදු කර ගත හැකි පරිදි සඳහා මත්ස්‍ය නිෂ්පාදන මිල නියම කිරීමේ ක්‍රමවේද සකස් කිරීම.	ලංකා ධීවර සංස්ථාවේ සම්පූර්ණයෙන් ම ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා රුපියල් මිලියන 500 ක් වෙන් කිරීමට යෝජනා කිරීම

2.6.13 ධීවර අංශය පිළිබඳ විශ්ලේෂණය

2021 වර්ෂයේ දී ශ්‍රී ලංකා රජය ධීවර අංශයට වෙන් කළ මුදල රුපියල් මිලියන 8,358 ක් වන අතර, එය 2020 වර්ෂයේ ඇස්තමේන්තුවට සාපේක්ෂව 49% ක වර්ධනයකි. එය සමස්ත අයවැයෙන් 0.23% ක් ද දළ දේශීය නිෂ්පාදිතයෙන් 0.05% ක් ද වේ. 2018 වර්ෂයේ සිට, වියදම වර්ෂයකට 121% ක සාමාන්‍ය අනුපාතයකින් වර්ධනය වී තිබේ. පුනරාවර්තන වියදම්වල 78% ක වර්ධනයට සාපේක්ෂව ප්‍රාග්ධන වියදම් 160% කින් වර්ධනය වී ඇති බව සැලකිල්ලට ගැනීම වැදගත් වේ. රටේ ධීවර අංශය නවීකරණය කිරීම සඳහා වත්මන් රජයේ ප්‍රතිපත්ති දිශානතිය මෙමගින් ප්‍රමාණවත් ලෙස පිළිබිඹු කෙරෙයි.

අයවැයගත ක්‍රියාකාරකම් සඳහා වන අයවැය ඇස්තමේන්තුවල මුළු වටිනාකම රු.මි. 4,317 කි. අයවැය කථාවෙහි ඉදිරිපත් කර ඇති සමහර ප්‍රධාන යෝජනා සඳහා වෙන්කිරීම් සිදු කර නැත. එම යෝජනා වන්නේ (i) ලංකා ධීවර සංස්ථාවේ සම්පූර්ණයෙන් ම ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා රුපියල් මිලියන 500 ක් වෙන් කිරීමට යෝජනා කිරීම සහ (ii) කරවල, උම්බලකඩ සහ ටින් කළ මාළු නිෂ්පාදනය සඳහා ශ්‍රී ලංකාවේ නොමැති මසුන් ආනයනය කිරීම සහ මසුන් අපනයනය කිරීම සඳහා ඇති පරිපාලන ක්‍රියාවලිය සරල කිරීම.

විදේශ විනිමය ඉපැයීම්, රැකියා සහ ජීවනෝපාය අවස්ථා තුළින් ජාතික ආර්ථිකයට දායක වන අතර ම ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම සඳහා ධීවර නිෂ්පාදන වලින් ස්වයංපෝෂිත භාවය ළඟා කර ගැනීම ධීවර අංශය සම්බන්ධ රජයේ ප්‍රතිපත්තිය මගින් අවධානය යොමු කරනු ලැබේ. අයවැය යෝජනා මගින් පොදුවේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා පිළිබිඹු කරයි. එහෙත්, සෑම අයවැය යෝජනාවක් ම ප්‍රතිපත්තිමය ප්‍රමුඛතාවයන්ට අනුකූල නොවේ. බහු දින ධීවර යාත්‍රා සඳහා මුහුදු ජලය භාවිතා කරමින් ශීතකරණ පද්ධති සකස් කිරීම සහ එවැනි උපකරණවල සූර්ය බලශක්තිය භාවිතා කිරීම දිරිගැන්වීම, පොළී රහිත ණය ක්‍රමයක් සහ ධීවර ප්‍රජාව සඳහා ඵලදායී රක්ෂණ යෝජනා ක්‍රමයක් පිළිබඳ යෝජනා හෝ වෙන් කිරීම් නැත.

2.6.14 සංචාරක අංශයේ වියදම් සාරාංශය

රජයේ සංචාරක ක්ෂේත්‍රයේ වියදම් සංචාරක අමාත්‍යාංශය සහ ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ. 2018 වර්ෂයේ සිට සංචාරක අංශය සඳහා රජය විසින් දරන ලද වියදම් 2.6.14 වගුවෙහි ඉදිරිපත් කර ඇති අතර, සංචාරක අංශය සඳහා දළ දේශීය නිෂ්පාදිතයෙන් ඉතා සුළු කොටසක් (0.01% ට වඩා අඩු) ප්‍රමාණයක් පමණක් වෙන් කර ඇති බව එයින් පෙන්නුම් කරයි. කෙසේ වෙතත්, වෙන් කරන ලද මුදල් ප්‍රමාණයන් වසර ගණනාවක් මුළුල්ලෙහි වැඩි වී තිබේ.

2.6.14 වගුව: සංචාරක අංශයේ වියදම් සාරාංශය (රු. මී.)

අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	රජයේ වියදම් / වෙන් කිරීම්				පෙර වර්ෂයට සාපේක්ෂව වෙනස් වීමෙහි ප්‍රතිශතය (%)
	2018	2019	2020	2021	2020-2021
	තථ්‍ය	සංශෝධිත	ඇස්තමේන්තුව	අයවැය	
සංචාරක අමාත්‍යාංශය	458	1168	364	742	104
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව	750	918	683	1116	63
එකතුව	1208	2087	1047	1858	77
දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස	0.01	0.01	0.01	0.01	
මූලාශ්‍රය: 2020 අයවැය ඇස්තමේන්තු; 2021 විසර්ජන පනත් කෙටුම්පත					

2.6.15 ප්‍රතිපත්ති ප්‍රමුඛතා සමග අයවැය අනුකූලවීම

'සෞභාග්‍යයේ දැක්ම' ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුව සංචාරක අංශයේ සංවර්ධන ප්‍රතිපත්ති මුල ක්‍රියාමාර්ග ඉතාමත් පෘථුල සහ මහාපේක්ෂා සහිත වේ. නව සංචාරක ස්ථාන හඳුනා ගැනීම සහ සංවර්ධනය කිරීම; සමුළු, උත්සව, ප්‍රදර්ශන සහ සම්මන්ත්‍රණ පැවැත්වීම සඳහා පහසුකම් සංවර්ධනය කිරීම; සංචාරකයින්ට සපයා දෙන සේවා වැඩි දියුණු කිරීම; සංචාරක අංශයේ ව්‍යාපාරික පරිසරයට පහසුකම් සැලසීම; සංචාරක අංශයේ නිපුණතා සංවර්ධනය; සහ සංචාරක කර්මාන්තය ආශ්‍රිත ව්‍යවසායකයින්ට පහසුකම් සැලසීම සඳහා වන සැලසුම් මෙයට ඇතුළත් ය. කෙසේ වෙතත්, ප්‍රතිපත්ති අරමුණු වලින් බහුතරයක් සඳහා කිසිදු වියදමක් වෙන් කර නැත (2.6.15 වගුව). සංචාරක අංශය සඳහා අයවැය මගින් වෙන් කළ ප්‍රමාණයෙන් වැඩිම කොටස (60%) උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබේ. මෙය සංචාරක අමාත්‍යාංශයට ලබා දී ඇති වෙන්කිරීම් වලට වඩා වැඩිය.

2.6.15 වගුව: ප්‍රතිපත්ති ප්‍රමුඛතා සමග අයවැය අනුකූලවීම

රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතාවය	අයවැය වෙන් කිරීම් සහ අදහස්
නව සංචාරක ආකර්ෂණ ස්ථාන හඳුනාගෙන සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා පෞද්ගලික අංශයට ආයෝජන හා අනෙකුත් පහසුකම් සපයා දීම	උද්භිද උද්‍යාන හා ඓතිහාසික බලකොටු සංවර්ධනය කිරීම සඳහාත්, පෞරාණික වටිනාකම් සහිත දුම්රිය ස්ථාන සහ මාර්ග සංවර්ධනය කිරීම සඳහාත් මුදල් වෙන් කර තිබේ.
සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා සමුළු, උත්සව, ප්‍රදර්ශන සහ සම්මන්ත්‍රණ පැවැත්වීම සඳහා පහසුකම් සංවර්ධනය කිරීම	මේ සඳහා නිශ්චිත අයවැය වෙන් කිරීමක් නැත.
ආගමන හා විගමන ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම කිරීම	මේ සඳහා නිශ්චිත අයවැය වෙන් කිරීමක් නැත.
අභ්‍යන්තර ගුවන්තොටුපළ නවීකරණය කිරීම	මේ සඳහා නිශ්චිත අයවැය වෙන් කිරීමක් නැත.
ප්‍රධාන සංචාරක නගරවල සංචාරක සේවා මධ්‍යස්ථාන පිහිටුවීම	මේ සඳහා නිශ්චිත අයවැය වෙන් කිරීමක් නැත.
ප්‍රාදේශීය කාර්යාල පිහිටුවන අතර ම සංචාරක පහසුකම් අනුමත කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම.	මේ සඳහා නිශ්චිත අයවැය වෙන් කිරීමක් නැත.
ප්‍රධාන සංචාරක නගරවල සංචාරක පුහුණු පාසල් පිහිටුවීම සහ ආකර්ෂනීය නිපුණතා සංවර්ධන පාඨමාලා හඳුන්වා දීම.	නව ව්‍යවසායකත්ව වැඩසටහන් සංවර්ධනය කිරීම සඳහා වෙන් කිරීම්

හෝටල්, ප්‍රවාහන පහසුකම්, මාර්ගෝපදේශකයින්, දේශීය ගුවන් ටිකට්පත් සහ ප්‍රවේශපත්‍ර වෙන් කරවා ගැනීම සඳහා විද්‍යුත් පාදක පහසුකම් හඳුන්වා දීම	මේ සඳහා නිශ්චිත අයවැය වෙන් කිරීමක් නැත
දේශීය නර්තන ශිල්පීන්ට, නාට්‍යකරුවන්ට, චිත්‍ර ශිල්පීන්ට සහ මූර්ති ශිල්පීන්ට ඔවුන්ගේ දක්ෂතා හා නිර්මාණ සංචාරක ආකර්ෂණීය ස්ථාන අසල ප්‍රදර්ශනය කිරීමට හා අලෙවි කිරීමට හැකි වන පරිදි වැඩසටහනක් හඳුන්වා දීම	නව ව්‍යවසායකත්ව වැඩසටහන් සංවර්ධනය කිරීම සඳහා වන වෙන්කිරීම් මෙයට උපකාරී වනු ඇත
සංචාරක අංශයේ සේවකයින්ට අදාළ වන කම්කරු නීති සංශෝධනය කිරීම	මේ සඳහා නිශ්චිත අයවැය වෙන් කිරීමක් නැත
ගෘහාශ්‍රිත හා ප්‍රජා පාදක සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා විශේෂ වැඩසටහන	නව ව්‍යවසායකත්ව වැඩසටහන සංවර්ධනය කිරීම සඳහා වෙන්කිරීම් තිබේ
සියළුම සංචාරක මගපෙන්වන්නන් ලියාපදිංචි කිරීම හා පුහුණු කිරීම මගින් සංචාරකයින්ගේ සුරක්ෂිතභාවය සහ ආරක්ෂාව සහතික කිරීම.	මේ සඳහා නිශ්චිත අයවැය වෙන් කිරීමක් නැත
සංචාරක මධ්‍යස්ථාන අසල සංචාරක පොලිස් සේවාව පුළුල් කිරීම	මේ සඳහා නිශ්චිත අයවැය වෙන් කිරීමක් නැත

2.6.16 සංචාරක අංශය පිළිබඳ නිරීක්ෂණ සහ නිගමන

සෞභාග්‍යයේ දැක්ම ජාතික ප්‍රතිපත්ති රාමුව යටතේ හඳුනාගෙන ඇති ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග වලින් බහුතරයක් සඳහා 2021 වර්ෂයේ දී කිසිදු මුදල් වෙන් කිරීමක් සිදු කර නැත. මෙම අංශය සඳහා වෙන් කර ඇති අරමුදල්වලින් වැඩි ප්‍රමාණයක් ලබා දී ඇත්තේ නව සංචාරක ආකර්ෂණයන් සංවර්ධනය කිරීම සහ සංචාරක කර්මාන්තය ආශ්‍රිත ව්‍යවසායකයින් සංවර්ධනය කිරීම සඳහා වේ. දැනට පවතින කොවිඩ්-19 වසංගතය සහ සංචාරකයින්ගේ පැමිණීම අඩුවීම හේතුවෙන් රජය සංචාරක ක්ෂේත්‍රයේ සංවර්ධනය ප්‍රමාද කර තිබෙනවා විය හැක.

2.6.17 ඉදිකිරීම් අංශයේ වියදම් සාරාංශය

රජයේ ඉදිකිරීම් සම්බන්ධ වියදම් ග්‍රාමීය නිවාස, ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සහ රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ. ඉදිකිරීම් අංශය සඳහා රජයේ වියදම දළ දේශීය නිෂ්පාදිතයෙන් 0.01% ට වඩා අඩු බව 2.6.16 වගුව මගින් පෙන්වා දෙයි. කෙසේ වෙතත්, පසුගිය වසර ගණනාවක් මුළුල්ලෙහි මෙම කර්මාන්තය සඳහා සිදු කරන වියදම් වැඩි වී තිබේ.

2.6.16 වගුව: ඉදිකිරීම් අංශයේ වියදම් සාරාංශය (රු. මී.)

රාජ්‍ය අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	රජයේ වියදම් / වෙන්කිරීම්				පෙර වර්ෂයට සාපේක්ෂව වෙනස් වීමෙහි ප්‍රතිශතය (%)
	2018	2019	2020	2021	2020-2021
ග්‍රාමීය නිවාස, ඉදිකිරීම් සහ ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය	වෙන් කිරීම් නැත	වෙන් කිරීම් නැත	5721	17783	211
ගොඩනැගිලි දෙපාර්තමේන්තුව	430	490	447	588	32
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව	164	312	272	240	-12
එකතුව	594	802	6440	18611	189
දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස	0.004	0.005	0.042	0.11	

මූලාශ්‍රය: 2020 අයවැය ඇස්තමේන්තු; 2021 විසර්ජන පනත් කෙටුම්පත

2.6.18 ඉදිකිරීම් අංශය සඳහා වන අයවැය ප්‍රතිපත්ති ප්‍රමුඛතා වලට අනුකූලවීම

2021 වර්ෂයේ අයවැය මගින් ඉදිකිරීම් කර්මාන්ත අංශය සඳහා වන වෙන්කිරීම් වලින් වැඩිම කොටස ග්‍රාමීය නිවාස, ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයට ලබා දී ඇති අතර, එය එම අංශයට ලබා දී ඇති වෙන්කිරීම් වලින් 95% ට අධික වේ. ගොඩනැඟිලි ඉදිකිරීමට අදාළ අනුමතිය ලබා දීමේ ක්‍රියාවලීන් කඩිනම් කිරීම මගින් ක්ෂේත්‍රයේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා වන ක්‍රියාමාර්ග කිහිපයක් 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති රාමුව විසින් හඳුනාගෙන ඇත. කෙසේ වෙතත්, මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අයවැය මගින් සීමිත අරමුදල් ප්‍රමාණයක් වෙන් කර ඇත. ඉදිකිරීම් අංශයේ සේවකයින්ගේ නිපුණතා සංවර්ධනය සඳහා යම් අරමුදල් ප්‍රමාණයක් තිබේ.

2.6.17 වගුව: අයවැය ප්‍රතිපත්ති ප්‍රමුඛතා සමඟ අනුකූලවීම	
රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතාවය	**අයවැය වෙන්කිරීම් සහ නිරීක්ෂණ**
ඉදිකිරීම් සඳහා අනුමැතිය ලබා ගැනීම කඩිනම් කිරීම	නිශ්චිත අයවැය වෙන් කිරීමක් නැත
ඉදිකිරීම් සම්බන්ධ අනුමත කිරීම් සඳහා ගතවන කාලය සති 3 දක්වා අඩු කිරීම	නිශ්චිත අයවැය වෙන් කිරීමක් නැත
සියළුම නාගරික ඉදිකිරීම්වල රථගාල් තිබීම අනිවාර්ය වීම.	රථගාල් ඉදිකිරීම සඳහා වෙන්කිරීම් සිදු කර තිබේ.
අමුද්‍රව්‍ය ප්‍රසම්පාදනය සංශෝධනය කිරීම හා නියාමනය කිරීම	නිශ්චිත අයවැය වෙන් කිරීමක් නැත
තාක්ෂණ ශ්‍රේණිවල රැකියා ලබා ගැනීම සඳහා තරුණ තරුණියන් පුහුණු කිරීම කෙරෙහි රජය අවධානය යොමු කරනු ඇති අතර, අවශ්‍ය තාක්ෂණවේදීන් පුහුණු කිරීම ද සිදු කිරීම.	මෙම ප්‍රමුඛතාවය සපුරාලීම සඳහා අයවැය වෙන්කිරීම් ඇත.

2.6.19 සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සම්බන්ධ ව්‍යදම් සාරාංශය

රජයේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත (SMI) සම්බන්ධ ව්‍යදම් කර්මාන්ත අමාත්‍යාංශය සහ මෑතකදී පිහිටුවන ලද තවත් රාජ්‍ය අමාත්‍යාංශ තුනක් (එනම්, බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟලුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය, මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය, සහ වේවැල්, පිත්තල, මැටි, ලී බඩු හා ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය සහ පේෂකර්ම දෙපාර්තමේන්තුව) විසින් සිදු කරනු ලැබේ. 2018 වර්ෂයේ සිට මෙම අංශය සඳහා වන රජයේ ව්‍යදම් 2.6.18 වගුව මගින් පෙන්නුම් කරයි. දළ දේශීය නිෂ්පාදිතයෙන් 0.11% ට වඩා අඩු ප්‍රමාණයක් මෙම අංශය සඳහා වෙන් කර ඇත.

2.6.18 වගුව: **සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සම්බන්ධ ව්‍යදම් සාරාංශය**

අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	**රජයේ ව්‍යදම් / වෙන්කිරීම් (රු. මී.)**				**පෙර වර්ෂයට සාපේක්ෂව වෙනස් වීමෙහි ප්‍රතිශතය (%) 2020-2021**
	2018	2019	2020	2021	
කර්මාන්ත අමාත්‍යාංශය	5,657	15,499	4,515	3,565	21
බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟලුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය	වෙන් කිරීම් නැත	වෙන් කිරීම් නැත	247	1,116	351
මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය	වෙන් කිරීම් නැත	වෙන් කිරීම් නැත	130	294	127
වේවැල්, පිත්තල, මැටි, ලීබඩු හා ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	වෙන් කිරීම් නැත	වෙන් කිරීම් නැත	769	1,240	61
පේෂකර්ම දෙපාර්තමේන්තුව	105	138	206	173	-16
එකතුව	5,762	15,637	5,867	6,388	9
දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස	0.04	0.11	0.04	0.04	
මූලාශ්‍රය: 2020 අයවැය ඇස්තමේන්තු; 2021 විසර්ජන පනත් කෙටුම්පත					

2.6.20 අයවැය සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ප්‍රතිපත්ති ප්‍රමුඛතාවලට අනුකූලවීම

කර්මාන්ත අමාත්‍යාංශය සහ තවත් රාජ්‍ය අමාත්‍යාංශ තුනක් විසින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධනයට අදාළ කටයුතු සිදු කරනු ලැබේ. අත්යන්ත්‍ර රෙදි නිෂ්පාදන ගම්මාන පිහිටුවීම, රැකියා අවස්ථා නිර්මාණය කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් වැනි නව වැඩසටහන් සහ ව්‍යාපෘති කිහිපයක් අයවැය කථාවෙහි අවධාරණය කර ඇත. කෙසේ වෙතත්, මෙම මෙම ක්‍රියාමාර්ග සඳහා වෙන්කිරීම් සිදු කර නැත. 2021 වර්ෂයේ අයවැය වෙන්කිරීම් වලින් වැඩිම ප්‍රමාණයක් (70% ට අධික) කර්මාන්ත අමාත්‍යාංශයට සහ බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟලුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශයට ලබා දී ඇත. 'සෞභාග්‍යයේ දැක්ම' ජාතික ප්‍රතිපත්ති රාමුව මගින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවල අගය එකතු කළ ක්‍රියාකාරකම් දිරිගැන්වීමට; වඩු කර්මාන්තය, වේවැල් කර්මාන්තය සහ බට කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට; සහ දැව හා ගෘහ භාණ්ඩ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂා කර ඇත. කෙසේ වෙතත්, අයවැය තුළ මෙම කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා නිශ්චිත අයවැය වෙන්කිරීම් සිදු කර නොමැත.

2.7 තාක්ෂණය මත පදනම් වූ සමාජයක්

2.7.1 වියදම් සාරාංශය

'තාක්ෂණය මත පදනම් වූ සමාජයක් අත්පත් කර ගැනීම වෙනුවෙන් සකසන ලද ප්‍රතිපත්තිවලින් සැලකිය යුතු ප්‍රමාණයක් අයත් වනුයේ තාක්ෂණ අමාත්‍යාංශයේ විෂයපථය යටතටයි. කෙසේ වුවද, මෙම අමාත්‍යාංශය ස්ථාපිත කරන ලද්දේ 2021 අයවැය ඉදිරිපත් කිරීමෙන් පසුව වන අතර එම නිසා අමාත්‍යාංශයට සුවිශේෂී වූ ප්‍රතිපාදන වෙන් කිරීමක් ඇතුළත් නොවේ. මෙම කටයුතු සඳහා ඉඩකඩ සළසා දීම උදෙසා මීන් පෙර වෙනත් අමාත්‍යාංශ වෙත වෙන් කොට තිබූ සහ පසුව තාක්ෂණ අමාත්‍යාංශය යටතට නැවත වෙන්කරනු ලැබූ නියෝජිතායතන සහ අනෙකුත් ආයතන සඳහා ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන් ඔස්සේ සිදු කරන ලද අයවැය ප්‍රතිපාදන වෙන් කිරීම් පහත විශ්ලේෂණය මගින් ඉදිරිපත් කෙරේ.

විශේෂයෙන්ම ආරක්ෂක අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය සහ කුසලතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන පර්යේෂණ සහ නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය ඔස්සේ 'තාක්ෂණය මත පදනම්වූ සමාජයක්' අත්පත් කර ගැනීම ආශ්‍රිත සෑම අංශයක් කෙරෙහිම බලපාන මූලපිරීම් කිහිපයක් පවතී. මෙම යෝජනා පහත කොටසෙහි ඇතුළත් විශ්ලේෂණය තුළ දක්වා ඇත.

2.7.1 වගුව - තාක්ෂණ අමාත්‍යාංශය යටතේ සමස්ත ප්‍රතිපාදන වෙන් කිරීම් (ප්‍රාග්ධන හා පුනරාවර්තන) (රු. 000)

ආයතනය	2019	2020	2021
ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය	1,800,000	4,268,880	4,500,000
ශ්‍රී ලංකා පරිගණක හදිසි අවස්ථා සඳහා සූදානම් කණ්ඩායම	584,280	409,450	980,480
කාර්මික තාක්ෂණික ආයතනය	550,000	376,000	360,000
ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව	42,000	35,100	51,000
පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව	1,272,600	1,413,220	1,476,150
ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය	1,250,000	1,063,800	492,700
තොරතුරු තාක්ෂණ උද්‍යාන (යාපනය / මන්නාරම)	11,500	11,410	13,000
එකතුව	5,510,380	7,577,860	7,873,330

මූලාශ්‍රය - 2020 අයවැය ඇස්තමේන්තු තුළ 2018 සහ 2019 සඳහා වන දත්ත නොපවතී. එබැවින්, දත්ත ලබා ගෙන ඇත්තේ 2019 අයවැය ඇස්තමේන්තු වලින් ය.

සමස්තයක් වශයෙන්, හඳුනාගත් ආයතන සඳහා ඉහතින් වෙන් කරන ලද වියදම්, 2020 සහ 2021 වසරේ රජයේ වියදම් වල ප්‍රතිශතයක් වශයෙන් ගත් කළ ආසන්න වශයෙන් 0.3% සහ 0.2% වේ.

2.7.2 අයවැය උපකල්පන

අයවැය කතාව, අයවැය ප්‍රධාන අංග සහ අයවැය ඇස්තමේන්තු දෙස බැලූ කල ඇතැම් විෂමතාවයන් සහ ප්‍රමාණවත් දත්ත නොමැතිකමක් නිරීක්ෂණය කළ හැකිය. එයට අමතරව, තාක්ෂණ අමාත්‍යාංශ විෂයපථය යටතේ පවතින පහත ආයතන වලට අයවැය තුළ ඇතුළත් වන විශේෂිත වියදම් වෙන් කිරීමක් නොපවතින බව පෙනී යයි.

(අ) විදුලි සංදේශ නියාමන කොමිසම, (ආ) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (ඇ) ශ්‍රී ලංකා ටෙලිකොම් සහ එහි පරිපාලිත සමාගම් සහ අනුබද්ධ ආයතන

2.7.2 වගුව: විවිධ මූලාශ්‍ර වලට අනුව 2021 අයවැය ප්‍රතිපාදන වෙන් කිරීම්

අයිතමය	අයවැය කතාව	අයවැය ප්‍රධාන අංග	අයවැය ඇස්තමේන්තු
1	ගාල්ල, කුරුණෑගල, අනුරාධපුරය, මහනුවර සහ මඩකලපුව දිස්ත්‍රික්ක වල සියළු පහසුකම් සහිත පාරිභෝගික අවශ්‍යතා අනුව නිර්මාණය කරන ලද තාක්ෂණික උද්‍යාන පහක් ස්ථාපිත කිරීම සඳහා රු. මිලියන 10, 000ක්	සඳහන් කොට නොමැත	මන්නාරම සහ යාපනය දිස්ත්‍රික්ක වලන දැනට පවත්නා තොරතුරු තාක්ෂණ උද්‍යාන සඳහා රුපියල් මිලියන 13ක් වෙන් කිරීම. නව තාක්ෂණික උද්‍යාන ස්ථාපිත කිරීම සඳහා නව ප්‍රතිපාදන වෙන් කිරීම් නොමැත
2	තාක්ෂණික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා රුපියල් මිලියන 8,000 ක් (උදා : අන්තර්ජාතික විද්‍යුත් වාණිජ (ඊ -කොමර්ස්) සහ විද්‍යුත් ගෙවීම් (ඊ - පේමන්ට්) පද්ධති ස්ථාපිත කිරීම	සඳහන් කොට නොමැත	සමස්ත යටිතල පහසුකම් සංවර්ධන වියදම් වශයෙන් රු. මිලියන 431,647ක්. කෙසේ වුවද තාක්ෂණික යටිතල පහසුකම් වැය කිරීම් සම්බන්ධයෙන් විශේෂිත තොරතුරු නොමැත.
3.	රට තුළ 4G / බ්‍රෝඩ්බෑන්ඩ් ආවරණය සියයට සියයක් සහතික කරමින් ටෙලිකොම් සංවර්ධන අරමුදලෙන් රුපියල් මිලියන 15, 000ක් ‘ගම සඳහා සන්නිවේදනය‘ වැඩසටහන සඳහා ලබා දීම. ටෙලිකොම් බද්දෙන් 50%ක් මේ සඳහා වෙන් කිරීමට නියමිතය.	සඳහන් කොට නොමැත	ටෙලිකොම් බද්ද ඔස්සේ 2021 සඳහා රු. මිලියන 20,000ක ආදායම් ඇස්තමේන්තුවක් පවතින අතර එය ව්‍යාපෘතිය සඳහා වන 50%ක ප්‍රතිපාදන අවශ්‍යතාවයට නොගැලපේ. ටෙලිකොම් සංවර්ධන අරමුදල පිළිබඳ විශේෂිත තොරතුරු නොපවතී.
4.	සඳහන් කොට නොමැත	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිතාව වැඩි දියුණු කිරීම සඳහා ඊ-ග්‍රාම නිලධාරී ව්‍යාපෘතිය වෙනුවෙන් රුපියල් මිලියන 665 ක්	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිතාව වැඩි දියුණු කරීම සඳහා ඊ-ග්‍රාම නිලධාරී ව්‍යාපෘතිය වෙනුවෙන් රුපියල් මිලියන 665 ක්
5.	සඳහන් කොට නොමැත	ආරක්ෂක අමාත්‍යාංශ වෙන් කිරීම් යටතේ සඳහන් වන නව විද්‍යුත් ජාතික හැඳුනුම්පත සැපයීමේ වැඩසටහන සඳහා රුපියල් මිලියන 2,996 ක්	පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව හෝ ආරක්ෂක අමාත්‍යාංශ වෙන් කිරීම් ඔස්සේ හෝ වැඩසටහන සඳහා වශේෂ ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදු කොට නැත.
6.	සඳහන් කොට නොමැත	සඳහන් කොට නොමැත	නැනෝ තාක්ෂණ වැඩසටහන සඳහා රුපියල් මිලියන 492 ක්
7.	සඳහන් කොට නොමැත	කොළඹ, යාපනය, නැගෙනහිර, ගිණිකොණ, ඌව, වෙල්ලස්ස, වයඹ, කැළණිය, රජරට, සබරගමුව විශ්ව විද්‍යාලවල සහ යාපනය විශ්ව විද්‍යාලයේ වවුනියා මණ්ඩපය සඳහා විශ්ව විද්‍යාලවල තාක්ෂණ පහසුකම් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 11,345 ක්	අධ්‍යාපන අමාත්‍යාංශය ඔස්සේ කිසිදු විශේෂ ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදු කොට නොමැත

8.	සඳහන් කොට නොමැත	විද්‍යා හා තාක්ෂණ ප්‍රවලිත කිරීමේ වැඩසටහන සඳහා රුපියල් මිලියන 5 ක්	විද්‍යා හා තාක්ෂණ ප්‍රවලිත කිරීමේ වැඩසටහන සඳහා රුපියල් මිලියන 5 ක්
9.	සඳහන් කොට නොමැත	වාහන ලියාපදිංචි කිරීම පිළිබඳ විද්‍යුත් අධීක්ෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 125 ක්	වාහන ලියාපදිංචි කිරීම පිළිබඳ විද්‍යුත් අධීක්ෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 125 ක්
10.	සඳහන් කොට නොමැත	දුම්රිය ස්ථාන 340ක ප්‍රවේශ පත්‍ර සහ ආසන වෙන් කර ගැනීම සඳහා විද්‍යුත් ප්‍රවේශ පත්‍ර ක්‍රමයක් හඳුන්වා දීමට රුපියල් මිලියන 3,435 ක්.	සඳහන් කොට නොමැත
11.	සඳහන් කොට නොමැත	ICTA හරහා ශ්‍රී ලංකා රජයේ රෝහල්වලට විද්‍යුත් වෛද්‍ය වාර්තා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 100ක්	සඳහන් කොට නොමැත

2.7.3 ප්‍රතිපත්ති ප්‍රමුඛතා සහ යෝජිත ක්‍රියාකාරකම්

සෞභාග්‍යයේ දැක්ම යටතේ රජයේ ප්‍රතිපත්ති රාමුව තළ දක්වා ඇති තාක්ෂණ සහ නවෝත්පාදන පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන් මෙම කොටස මගින් අවධාරණය කරනු ලැබේ.

2.7.3 වගුව රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන්

ප්‍රතිපත්ති ප්‍රමුඛතා	ක්‍රියාකාරකම්
ශ්‍රී ලංකාව ගෝලීය නවෝත්පාදන මධ්‍යස්ථානයක් ලෙස ස්ථාපිත කරීම	කෘතිම බුද්ධිය, ෛජෙව තාක්ෂණය, රොබෝ විද්‍යාව, වෘද්ධික යථාර්ථය, ක්ලවුඩ් තාක්ෂණය, නැනෝ තාක්ෂණය සහ ත්‍රිමාණ මුද්‍රණය (IOT) යන අංශ තුළ නවෝත්පාදන ක්‍රියාමාර්ග භාවිතය උපරිම කිරීම
පුරවැසියන්ගේ පහසුව සඳහා පුරවැසි - කේන්ද්‍රීය ඩිජිටල් රාජ්‍ය පාලනයක් ස්ථාපිත කිරීම	• රාජ්‍ය සේවා සැපයීම වෙනුවෙන් නව තාක්ෂණයන් අනුගමනය කිරීම සඳහා පුරවැසි සේවා මධ්‍යස්ථාන නවයක් ස්ථාපිත කිරීම • රථවාහන දඩ ගෙවීම සඳහා ඩිජිටල් හා විද්‍යුත් ගෙවීමේ ක්‍රමයක් හඳුන්වා දීම • අල්ලස් හා දූෂණය පිටුදැකීම සඳහා විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රමයක් ස්ථාපිත කිරීම
ඩිජිටල් ආකාරයට අන්තර්කරණය වූ ශ්‍රී ලංකාවක් ස්ථාපිත කිරීම	• දීප ව්‍යාප්ත අධිවේගී දෘශ්‍ය දත්ත සම්ප්‍රේෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම සහ දත්ත සම්ප්‍රේෂණය පහසු කිරීම සඳහා අධිවේගී 5G ජංගම බ්‍රෝඩ්බෑන්ඩ් ක්‍රමයක් ස්ථාපිත කිරීම • ඩිජිටල් පරිපාලනයක් සහ අධීක්ෂණයක් සහිත ඩිජිටල් නගර ස්ථාපිත කිරීම • සියළු මූල්‍ය ගනුදෙනු හැසිරවීම සඳහා ජංගම හා ඩිජිටල් ගෙවීම් ක්‍රමයක් හඳුන්වා දීම • සියළුම රටවලට අදාල වන විද්‍යුත් - වාණිජ හා ජාත්‍යන්තර විද්‍යුත් ගෙවීම් ක්‍රමයක් ස්ථාපිත කිරීම • දත්ත ආරක්ෂණය, සයිබර් ආරක්ෂාව සහ බුද්ධිමය දේපල හිමිකම් සහතික කිරීම සඳහා නව නීති සම්පාදනයක් ඉදිරිපත් කිරීම
තොරතුරු තාක්ෂණ ව්‍යවසායකත්වය ප්‍රවර්ධන කිරීම	• ව්‍යාපාරික ක්‍රියාවලි බාහිරින් ලබා ගැනීම (BPO) සහ දැනුම් ක්‍රියාවලි බාහිරින් ලබා ගැනීම (KPO) වැඩිදියුනු කිරීම මගින් 2025 වසර වන විට ඇමෙරිකානු ඩොලර් මිලියන 3 ක වටිනාකමින් යුතු අපනයන කර්මාන්තයක් ඇති කිරීම • නගර සම්බන්ධ කරමින් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන සහ ව්‍යාපාරික ක්‍රියාවලි බාහිරින් ලබා ගැනීමේ මධ්‍යස්ථාන ආරම්භ කිරීම

	• 2025 වන විට මෘදුකාංග ඉංජිනේරු සහ වැඩසටහන් සම්පාදකයින් සංඛ්‍යාව 300000 දක්වා වැඩි කිරීම • මෘදුකාංග ආනයනය කිරීම වෙනුවට දේශීය වශයෙන් මෘදුකාංග වැඩි දියුණු කිරීම සඳහා දේශීය මෘදුකාංග ඉංජිනේරුවන් සහ තොරතුරු තාක්ෂණ සැකසුම්කරුවන් දිරිගැන්වීම • ජාත්‍යන්තර වෙළෙඳපොල සඳහා මෘදුකාංග වැඩිදියුණු කිරීමට දේශීය ව්‍යවසායකයන්ට සහාය සැලසීම

2.7.4 විශ්ලේෂණය

'තාක්ෂණය මත පදනම් වූ සමාජයක්' නිර්මාණය කිරීම උදෙසා වන ප්‍රතිපත්ති දැක්ම ආශ්‍රයෙන් පවත්නා තොරතුරු මත පදනම්ව, අයවැය ප්‍රතිපාදන වෙන් කිරීම් පහත කොටස මගින් විශ්ලේෂණය කෙරේ.

2.7.4 වගුව: අයවැය ප්‍රතිපාදන වෙන් කිරීම් වලට අනුව පෙළගස්වන ලද රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන්

රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතාවය	ප්‍රතිපාදන වෙන් කිරීම	නිරීක්ෂණ
ශ්‍රී ලංකාව ගෝලීය නවෝත්පාදන මධ්‍යස්ථානයක් වශයෙන් ස්ථාපිත කිරීම	නැනෝ තාක්ෂණ වැඩසටහන සඳහා රුපියල් බිලියන 492 ක්	අර්ධ වශයෙන් සාර්ථකය. අදාල ප්‍රතිපාදන වෙන් කිරීම සිදු කරනු ඇත. කෙසේ වුවද ප්‍රතිපාදන වෙන් කිරීමෙන් රු. මිලියන 400ක් ගොඩනැගිලි සහ ආකෘති සඳහා වන අතර පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා රුපියල් මිලියන 10ක් පමණි. එබැවින් මෙම ප්‍රතිපාදන ශ්‍රී ලංකාවේ නැනෝ තාක්ෂණ පර්යේෂණ වැඩිදියුණු කිරීම උදෙසා වන මූලික පියවරයක් වශයෙන් සැලකිය යුතුය. තවදුරටත්, 2021 වසරේ සිදු කරන ලද ප්‍රතිපාදන වෙන් කිරීම 2020 වසරේ ප්‍රමාණයෙන් අඩකි.
	විද්‍යා හා තාක්ෂණ ප්‍රවලිතකරණ වැඩසටහන සඳහා රුපියල් මිලියන 5 ක්	සතුටුදායකයි. 2021 වසරේ සිදු කරන ලද ප්‍රතිපාදන වෙන් කිරීම සිදු කොට ඇත. මෙම ප්‍රතිපාදන 2020 වසරේ ප්‍රමාණයෙන් දෙගුණයකි.
පුරවැසියන්ගේ පහසුව උදෙසා පුරවැසි කේන්ද්‍රීය ඩිජිටල් රාජ්‍ය පාලනයක් ඇති කිරීම	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිතය වැඩිදියුණු කිරීම සඳහා විද්‍යුත් ග්‍රාම නිලධාරී ව්‍යාපෘතියට රු. මිලියන 665 ක්	සතුටුදායකයි. අදාල ප්‍රතිපාදන වෙන් කිරීම සිදු කොට ඇත.
	ආරක්ෂක අමාත්‍යාංශ ප්‍රතිපාදන වෙන් කිරීම් යටතේ සඳහන් කොට ඇති නව විද්‍යුත් ජාතික හැඳුනුම්පතක් සැපයීමේ වැඩසටහන සඳහා රු. මිලියන 2,996 ක්	සතුටුදායක නැත. ලේඛන තුළ ප්‍රතිපාදන වෙන් කිරීමට අදාළ විෂමතාවයන් පවතී.
	වාහන ලියාපදිංචි කිරීම පිළිබඳ විද්‍යුත් අධීක්ෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 125 ක්	සතුටුදායකයි. අදාල ප්‍රතිපාදන වෙන් කිරීම සිදු ට ඇත.
ඩිජිටල් වශයෙන් අන්තර්කරණය වූ ශ්‍රී ලංකාවක්	තාක්ෂණික යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා රුපියල් මිලියන 8,000 ක් (උදා : අන්තර්ජාතික විද්‍යුත් වාණිජ (ඊ-කොමර්ස්) සහ විද්‍යුත් ගෙවීම් (ඊ -පේමන්ට්) පද්ධති ස්ථාපිත කිරීම	සතුටුදායක නැත. ලේඛන තුළ ප්‍රතිපාදන වෙන් කිරීමට අදාළ විෂමතාවයන් පවතී

ස්ථාපිත කිරීම	රට තුළ 4G / බ්‍රෝඩ්බෑන්ඩ් ආවරණය සියයට සියයක් සහතික කරමින් ටෙලිකොම් සංවර්ධන අරමුදලෙන් රුපියල් මිලියන 15,000ක් 'ගම සඳහා සන්නිවේදනය' වැඩසටහන සඳහා ලබා දීම. ටෙලිකොම් බද්දෙන් 50%ක් මේ සඳහා වෙන් කිරීමට නියමිතය.	අර්ධ වශයෙන් සාර්ථකය. මෙම යෝජනාව අනුව ටෙලිකොම් බදු ආදායමෙන් 50% ක් මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කරනු ලැබේ. කෙසේ වුවද, බදු ආදායම රු. මිලියන 20,000 ක් වන අතර එබැවින් 50% ක් මගින් ව්‍යාපෘතියේ අපේක්ෂිත පිරිවැය අර්ධ වශයෙන් පමණක් ආවරණය කරනු ඇත.
	දුම්රිය ස්ථාන 340ක ප්‍රවේශ පත්‍ර සහ ආසන වෙන් කර ගැනීම සඳහා විද්‍යුත් ප්‍රවේශ පත්‍ර ක්‍රමයක් හඳුන්වා දීමට රුපියල් මිලියන 3,435 ක්.	. සතුටුදායක නැත. ලේඛන තුළ ප්‍රතිපාදන වෙන් කිරීමට අදාළ විෂමතාවයන් පවතී.
	ICTA හරහා ශ්‍රී ලංකා රජයේ රෝහල්වලව විද්‍යුත් වෛද්‍ය වාර්තා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 100ක්	සතුටුදායක නැත. ලේඛන තුළ ප්‍රතිපාදන වෙන් කිරීමට අදාළ විෂමතාවයන් පවතී.
තොරතුරු තාක්ෂණ ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම	ගාල්ල, කුරුණෑගල, අනුරාධපුරය, මහනුවර සහ මඩකලපුව දිස්ත්‍රික්ක වල සියළු පහසුකම් සහිත පාරිභෝගික අවශ්‍යතා අනුව නිර්මාණය කරන ලද තාක්ෂණික උද්‍යාන පහක් ස්ථාපිත කිරීම සඳහා රු. මිලියන 10, 000ක්	සතුටුදායක නැත. ලේඛන තුළ ප්‍රතිපාදන වෙන් කිරීමට අදාළ විෂමතාවයන් පවතී.
	කොළඹ, යාපනය, නැගෙනහිර, ගිණිකොණ, ඌව, වෙල්ලස්ස, වයඹ, කැළණිය, රජරට, සබරගමුව විශ්ව විද්‍යාලවල සහ යාපනය විශ්ව විද්‍යාලයේ වවුනියා මණ්ඩපය සඳහා විශ්ව විද්‍යාලවල තාක්ෂණ පහසුකම් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 11,345 ක්	සතුටුදායක නැත. ලේඛන තුළ ප්‍රතිපාදන වෙන් කිරීමට අදාළ විෂමතාවයන් පවතී.

2.7.5 නිරීක්ෂණ සහ නිගමන

ඉහතින් සිදු කොට ඇති ප්‍රතිපාදන වෙන් කිරීම්, ප්‍රධාන වශයෙන්ම, සමාජය තුළ තාක්ෂණ භාවිතාව වැඩිදියුණු කිරීම කෙරෙහි යොමු වූ ප්‍රතිපත්ති, ප්‍රමුඛතාවය හා සමගාමී වේ. සෞභාග්‍යයේ දැක්ම තුළ යෝජනා කොට ඇති වැඩසටහන් කිහිපයක් අයවැය තුළ යෝජනා කොට නොමැත. එපරිද්දෙන් මෙම තේමාව යටතේ ආයතන සහ ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන් කෙරෙහි වෙන් කරන ලද ප්‍රාග්ධන වියදම් වෙන් කිරීම පසුගිය වසර තුළ ඉහළ ගොස් ඇති අතර එසේම 2021 අයවැය යෝජනා තුළද ඒ හා සමාන වැඩිවීමක් නිරීක්ෂණය කරනු ලැබේ. කෙසේ වුවද, විවිධ අයවැය ලේඛන අතර පවතින අසමානතාවයන් සහ නිශ්චිත දත්ත නොමැති වීම මගින් අර්ථාන්විත තක්සේරුවක් සැපයීම අසීරු කරවයි. තවදුරටත්, ඉහතින් සාකච්ඡා කරන ලද පරිදි, 2021 අයවැය ඉදිරිපත් කිරීමෙන් පසුව තාක්ෂණ අමාත්‍යාංශය නිර්මාණය කිරීම සහ ඉන් අනතුරුව විවිධ අයවැය අයිතම නැවත වර්ගීකරනයට ලක් කිරීම තුළින් සමස්ත විෂය පථය සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වැඩිදුර අවිනිශ්චිත තත්ත්වයක් නිර්මාණය කොට ඇත.

2.8 භෞතික සම්පත් සංවර්ධනය

භෞතික සම්පත් සංවර්ධනය කිරීමේ ක්ෂේත්‍රය තුළ සෞභාග්‍යයේ දැක්ම යටතේ වන මධ්‍යම රජයේ ක්‍රියාකාරකම් මගින් (i) C හැඩැති ආර්ථික තීර නවයක් වැඩි දියුණු කිරීම (ii) කුඩා නගර නැවත සැලසුම්කරණය (iii) නගර සංවර්ධනය (iv) සුවපහසු ගමනාගමනය - සොබාදම් මිතුරු ප්‍රවාහන ජාලය (v) වරාය සහ ගුවන් සේවා (vi) පුනර්ජනනීය බලශක්ති කෙරෙහි පරිණාමනය (vii) ජලසම්පත් කළමනාකරණය සහ (viii) ආපදා කළමනාකරණය වැනි ක්‍රියාකාරකම් සමූහයක් කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

මේ ආශ්‍රිත ක්‍රියාකාරකම් පහත අමාත්‍යාංශ සහ රාජ්‍ය අමාත්‍යාංශ 15 මගින් සිදු කළ යුතු බවට හඳුනාගනු ලැබේ.

1. ප්‍රවාහන අමාත්‍යාංශය
2. මහාමාර්ග අමාත්‍යාංශය
3. ග්‍රාමීය මාර්ග රාජ්‍ය අමාත්‍යාංශය
4. සූර්ය බලශක්ති රාජ්‍ය අමාත්‍යාංශය

5. ඉඩම් අමාත්‍යාංශය
6. ඉඩම් කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය
7. නාගරික සංවර්ධන අමාත්‍යාංශය
8. නාගරික සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
9. ග්‍රාමීය නිවාස රාජ්‍ය අමාත්‍යාංශය
10. වතු නිවාස රාජ්‍ය අමාත්‍යාංශය
11. ජල සම්පාදන අමාත්‍යාංශය
12. ග්‍රාමීය සහ කොට්ඨාශ පානීය ජල රාජ්‍ය අමාත්‍යාංශය
13. වාරිමාර්ග අමාත්‍යාංශය
14. ඇලමාර්ග රාජ්‍ය අමාත්‍යාංශය
15. වැව් රාජ්‍ය අමාත්‍යාංශය

2.8.1 2018 සිට 2021 දක්වා වියදම් සාරාංශය (ප්‍රතිපාදන වෙන් කිරීම් සහ වසරින් වසර වෙනස)

2021 වසර සඳහා මෙම අංශය වෙනුවෙන් ප්‍රක්ෂේපණ / ප්‍රතිපාදන වෙන් කිරීම් මිලියන 620.392 ක් වන අතර (මින් රුපියල් මිලියන 61,1085 ප්‍රාග්ධන වියදමය.) 2020 වසරේදී ඇස්තමේන්තුගත වියදම් වලට වඩා 18% ක වැඩිවීමක් මින් පෙන්නුම් කෙරේ. (2.8.1 වගුව) කෙසේ වුවද, 2019 වසරේ 49% ක වර්ධනය හා සාපේක්ෂව බැලූ කල ප්‍රක්ෂේපන / ප්‍රතිපාදන වෙන් කිරීම් වල මෙම වර්ධනය අඩු මට්ටමක පවතී. රජයේ සමස්ත වියදම් සහ 2021 වසරේ දළ දේශීය නිෂ්පාදනයේ කොටසක් වශයෙන් සැලකූ කල මෙම ක්ෂේත්‍රය පිලිවෙලින් 23% සහ 3.5% ප්‍රතිශතයක් දක්වයි. 2018 සහ 2019 වසරවල දළ දේශීය නිෂ්පාදිතයේ කොටසක් වශයෙන් සැලකූ කල, කාලයත් සමග ප්‍රතිපාදන වෙන් කිරීම් ඉහළ යාමක් පවතී.

2021 අයවැය තුළ අදාළ අමාත්‍යාංශ අතර ප්‍රතිපාදන වෙන් කිරීම්/ වියදම් පිළිබඳ ඉහළම වසරින් වසර වර්ධනය (Y-O-Y) ග්‍රාමීය මාර්ග සහ වෙනත් යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශ සඳහා වන අතර ප්‍රතිපාදන වෙන් කිරීම් වල සැලකිය යුතු අඩුවීමක් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය සඳහා පවතින බව පෙනී යයි.

2.8.1 වගුව - අමාත්‍යාංශ සඳහා සමස්ත වැය කිරීම (Rs. '000)

අමාත්‍යාංශය	2019	2020	2021	Y-O-Y Change (%)		
	Revised Budget	Estimate	Projections	2018-2019	2019-2020	2020-2021
ප්‍රවාහන අමාත්‍යාංශය	68,875,488	64,452,090	41,409,000	41	-6	-36
මහාමාර්ග අමාත්‍යාංශය	256,584,000	255,017,424	330,185,005	44	-1	29
ග්‍රාමීය මාර්ග සහ අනෙකුත් යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය	-	6,199,676	25,065,540			304
ඉඩම් අමාත්‍යාංශය	9,656,279	8,031,500	8,328,001	29	-17	4
ඉඩම් කළමනාකරණ, රාජ්‍ය ව්‍යවසාය, ඉඩම් සහ දේපොල සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	872,581	999,900	1,720,144	11	15	72
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය	15,219,400	21,754,502	23,521,199	54	43	8
නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය කළමනාකරණ සහ ප්‍රජා පවිත්‍රතා රාජ්‍ය අමාත්‍යාංශය	1,009,382	28,544,711	13,764,445	50	2728	-52

ග්‍රාමීය නිවාස, ඉදිකිරීම් සහ ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය	801,710	6,440,027	18,611,407	35	703	189
වතු නිවාස සහ ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය	-	1,792,159	2,787,369			56
සුර්ය, සුළං සහ ජල විදුලි උත්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	-	738,815	731,700			-1
ජල සම්පාදන අමාත්‍යාංශය	73,880,815	75,974,900	96,288,550	127	3	27
වාරිමාර්ග අමාත්‍යාංශය	16,594,364	50,213,640	46,377,700	-12	203	-8
මහවැලි කලාප ආශ්‍රිත ජනාවාස වල ඇළ මාර්ග හා පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	-	3,542,930	7,254,300			105
ග්‍රාමීය සහ කොට්ඨාශ පානීය ජල සැපයුම් ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	1,866,810	2,781,000	4,347,610	873	49	56
සමස්ත වියදම්	445,360,829	526,483,274	620,391,970	49	18	18
දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස	2.97	3.30	3.52			
මූලාශ්‍රය : අයවැය ඇස්තමේන්තු 2020 සහ 2021 විසර්ජන පනත් කෙටුම්පත						

2021 අයවැය ප්‍රතිපාදන වෙන් කිරීමේ ප්‍රතිශතයක් වශයෙන් ඉහත අමාත්‍යාංශ සඳහා වැය කිරීම් සමස්ත වියදම් වලින් 23.2% ක් වේ. දළ දේශීය නිෂ්පාදිතයේ කොටසක් වශයෙන් සැලකූ විට කාලයත් සමග වැඩි වීමක් දක්නට ලැබෙන අතර එය ආසන්න වශයෙන් 2019 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් 3% සිට 2020 වසරේ 3.3% ක් දක්වා සහ 2021 වසරේදී 3.5% ක් වශයෙන්ය. අපේක්ෂා කළ පරිදි, භෞතික සම්පත් සංවර්ධනය පිලිබඳ වියදම් සමූහය ප්‍රාග්ධන වියදම් සඳහා වන අතර එය 2021 වසරේදී සමස්ත වියදම් වලින් 95% ක් දක්වා වේ (2.8.1 සටහන)

2.8.1 රූපසටහන - සමස්ත වියදම් සංයුතිය (2018- 2021)



මූලාශ්‍රය : අයවැය ඇස්තමේන්තු 2020 සහ 2021 විසර්ජන පනත් කෙටුම්පත

2.8.2 අයවැය උපකල්පන

අනාගතය ආශ්‍රිතව පවත්නා ඇතැම් අවිනිශ්චිතතාවයක් හේතු කොට ගෙන 2021 අයවැය සංඛ්‍යා ඇතැම් උපකල්පන සහ අපේක්ෂිත පසුතලයන් මත පදනම් වී ඇති අතර එහිදී එක් ප්‍රධාන අවිනිශ්චිතතාවයක් වනුයේ කොවිඩ් 19 තුළින් ආර්ථිකය නැවත ගොඩනැගීමේ ක්‍රියාවලියයි. මේ සම්බන්ධයෙන් සැලකූ කල, ආර්ථික ක්‍රියාකාරකම් සහ සේවා නියුක්තිය යළි පණ ගැන්වීම සඳහා රජයේ ආයෝජන විසින් ප්‍රේරක භූමිකාවක් දැරීමේ අවශ්‍යතාවය රජය විසින් ප්‍රමුඛත්වයේ ලා සලකයි. මෙම කාලවකවානුව තුළ රජයේ ආයෝජන සඳහා හඳුනාගනු ලැබූ ක්ෂේත්‍ර අතර ජලය, ප්‍රවාහනය සහ තොරතුරු තාක්ෂණ අංශ ඇතුළත් වේ. ජාත්‍යන්තර පසුතලය තුළදී ශ්‍රී ලංකා ආර්ථිකය පිළිබඳ ගෝලීය වශයෙන් විශ්වාසයක් නිර්මාණය වීම තුළින් කොළඹ වරාය නගරය වෙත සෘජු විදේශ ආයෝජන ගලා ඒම් දිරිගන්වනු ඇතැයි අපේක්ෂිතය. ඒ හා සමානවම 2021 වසරේ සිට හම්බන්තොට කාර්මික කලාපය සහ එරාවුර් පේෂකර්ම උද්‍යානය මෙන්ම ඒ ආශ්‍රිත අනෙකුත් මහා පරිමාණ ව්‍යාපෘති වෙතද සෘජු විදේශ ආයෝජන ගලා එතැයි අපේක්ෂා කෙරේ. මධ්‍ය කාලීන වශයෙන් සැලකූ කල රජයේ ආයෝජන දළ දේශීය නිෂ්පාදිතයෙන් 4-6% අතර නවතිනු ඇතැයි උපකල්පනය කරනු ලැබේ.

අයවැය ඇස්තමේන්තුවල අවධානය යොමු වී ඇති තත්ත්වයන් තුනක් 2020-21 FMR මගින් හඳුනාගනු ලබන අතර, මෙම ක්ෂේත්‍රය යටතේ සැලසුම්ගත වැඩසටහන් අත්පත් කර ගැනීමට ශ්‍රී ලංකාව සතු ශක්‍යතාවය කෙරෙහි බලපෑමක් එම තත්ත්වයන් තුළින් සිදු වනු ඇත.

- අහිතකර දේශගුණික තත්ත්වයන් හේතුවෙන් කෘෂිකර්මාන්තය, ජල විදුලි උත්පාදනය සහ රජයේ අයවැය කෙරෙහි තදබල බලපෑම් ඇති කළ හැකිය.
- මධ්‍යකාලීන විපර්යාස පිළිබඳ ශක්‍යතා සීමාවන් තුළින් විදේශීය අරමුදල් සපයන විශාල ව්‍යාපෘති සම්බන්ධව අරමුදල් භාවිතාව කෙරෙහි බලපෑම් ඇති විය හැකි අතර එමගින් රටෙහි ආයෝජන මට්ටම සහ ආර්ථික වර්ධනය කෙරෙහිද බලපෑම් සිදු වේ.
- ජාත්‍යන්තර වෙළෙඳපොලෙහි ඛනිජතෙල් සහ වෙළෙඳභාණ්ඩ මිල උච්චාවචනයන් මගින් ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික ස්ථාවරත්වය සහ වර්ධන ඉලක්ක කෙරෙහි බලපෑමක් ඇති කළ හැකි අතර එමගින් රජයේ වියදම් සහ ආදායම කෙරෙහි බලපෑමක් ඇති වේ.

2.8.3 ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන්

සෞභාග්‍යයේ දැක්ම ජාතික ප්‍රතිපත්ති රාමුව අනුව භෞතික සම්පත් සංවර්ධනය ආශ්‍රිත වූ ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන්ට පහත කාරණා ඇතුළත් වේ.

- *<u>'C' හැඩැති ආර්ථික තීර 9 ක්</u>* - වරාය හා ගුවන් තොටුපොළ ඒකාබද්ධ කරමින් ආර්ථික තීර වැඩි දියුණු කිරීම (කොළඹ වරාය සහ කටුනායක ගුවන් තොටුපොල, හම්බන්තොට වරාය සහ මත්තල ගුවන්තොටුපල, කන්කසන්තුරේ වරාය සහ ගුවන් තොටුපොල)
- *<u>කුඩා නගර නැවත සැලසුම්කරණය</u>* - එකම පළාත තුළ දිස්ත්‍රික්ක අතර සහ පළාත් අතර අසම වූ නාගරීකරණය සහ ප්‍රාදේශීය විෂමතාවයන් ආමන්ත්‍රණය කිරීම
- *<u>සිව් ආකාරයේ නගර සංවර්ධනය</u>* - (අ) බහු ආංශික වාණිජ නගර (ආ) ජාතික නගර (ඇ) පොකුරු නගර (ඈ) නව කොළඹ වාණිජ මූල්‍ය මූලස්ථානය
- *<u>සුවපහසු ගමනාගමනය</u>* - සොබාදම් - මිතුරු ප්‍රවාහන ජාලය: (අ) ඒකාබද්ධ මාර්ග ජාලය (ආ) ප්‍රවාහන සේවා සහ (ඇ) දුම්රිය ප්‍රවාහන සේවා යන ශීර්ෂ යටතේ මාර්ග ජාලය සහ ප්‍රවාහන සේවා වැඩි දියුණු කිරීම මෙම ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයට අයත් වේ.
- *<u>වරාය සහ ගුවන් සේවා</u>* - වාණිජ සහ මගී සේවා වශයෙන් කොළඹ - කටුනායක සහ හම්බන්තොට මත්තල ගුවන් තොටුපල හා මුහුදු වරාය සංවර්ධනය කිරීම කෙරෙහිත් අවශ්‍ය සේවාවන් සහ සම්බන්ධතාවයන් සැපයීම කෙරෙහිත් මෙම ප්‍රතිපත්ති ප්‍රමුඛතාවය මගින් අවධානය යොමු කරනු ලැබේ.
- *<u>පුනර්ජනනීය බලශක්තිය කෙරෙහි පරිවර්තනය වීම</u>* - මෙම ප්‍රතිපත්ති ප්‍රමුඛතාවය මගින් අරමුණු කරනුයේ කඩිනම් ආර්ථික වේගවත් කිරීම සඳහා අවශ්‍ය වන අඩු පිරිවැය බලශක්තිය වෙත ප්‍රවේශය රට සතුව පවතින බවට සහතික කිරීමයි. ඒ ආකාරයට, රටෙහි පුනර්ජනනීය බලශක්තිය සමස්ත බලශක්තියෙන් 40% ක් වනු ඇති බවත් ජල සහ පුනර්ජනනීය බලශක්තිය සමස්ත බලශක්ති එකතුවෙන් 80%ක් වනු ඇති බවත් අපේක්ෂිතය.
- *<u>ජල සම්පත් කළමනාකරණය</u>* - දැනට නල ජල සැපයුම වෙත ප්‍රවේශය පවතින්නේ ජනගහනයෙන් 45% කට පමණක් වන අතර බොහෝ ජල මාර්ග දූෂණය වී පවතී. එබැවින් මෙම ප්‍රතිපත්ති ප්‍රමුඛතාවය මගින් අරමුණු කරනුයේ ජනගහනයෙන් 100% කට පවිත්‍ර සහ ආරක්ෂිත පානීය හා නල ජලය සපයන බව සනාථ කිරීමයි.

- *ආපදා කළමනාකරණය* - මෙම ප්‍රතිපත්ති ප්‍රමුඛතාවය මගින් අපේක්ෂා කරනුයේ ස්වාභාවික ආපදා හේතු කොට ගෙන ඇති වන ජීවිත අහිමිවීම, දේපොල අහිමිවීම සහ ආර්ථික හානිය අවම කිරීම සඳහා නිවාරණ පිළිවෙත්, සහායක සහ පූර්ව අනතුරු හැඟවීමේ පද්ධති වැඩි දියුණු කිරීමයි.

2.8.4 විශ්ලේෂණ සහ නිරීක්ෂණ

වෙන් කරන ලද සමස්ත මුදල් ප්‍රමාණය වන රුපියල් මිලියන 620,392 න් රුපියල් මිලියන 390,086 ක් අදාළ අමාත්‍යාංශ සඳහා වෙන් කරනු ලැබේ. මෙම වැඩසටහන් වල භෞතික සම්පත් සංවර්ධන තේමාවෙන් බැහැර වැඩසටහන්ද ඇතුළත් වන අතර තේමාව යටතේ වන ඇතැම් වැඩසටහන් අනෙකුත් අමාත්‍යාංශ යටතේ සලකා බලනු ලැබේ.

සුවපහසු ගමනාගමනය - සොබාදම් මිතුරු ප්‍රවාහන ජාලය සහ සී හැඩැති ආර්ථික තීර 9 යන ඒකාබද්ධ ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන් සලකා බැලීමේදී, ප්‍රවාහන අමාත්‍යාංශය විසින් ආශ්‍රිත වැඩසටහන් සඳහා රුපියල් මිලියන 16,655 ක මුදලක් වෙන් කොට ඇති අතර, මහා මාර්ග අමාත්‍යාංශය විසින් රුපියල් මිලියන 209,927 ක් වෙන් කොට ඇත. කෙසේ වුවද, 2.8.2 වගුව තුළ අවධාරණය කොට ඇති පරිදි වැඩසටහන් සඳහා සිදු කරන ලද ප්‍රතිපාදන වෙන් කිරීම් අතර විෂමතා පවතී.

2.8.2 වගුව ප්‍රතිපාදන වෙන්කිරීම් වල විෂමතාවයන්

	අයවැය කථාව / සාරාංශය	අයවැය ප්‍රධාන අංග
ප්‍රධාන මාර්ග සහ අධිවේගී මාර්ග වෙත ප්‍රවේශ වීම සඳහා කිලෝමීටර් 100,000 ක විකල්ප මාර්ග ජාලයක් වැඩි දියුණු කිරීම	ප්‍රතිපාදන වෙන් කිරීම රු. මිලියන 20,000 ක් පමණි.	ප්‍රතිපාදන වෙන් කිරීම රුපියල් මිලියන 92,981 ක්.
කැළණි වැලි දුම්රිය මාර්ගය අවිස්සාවේල්ල දක්වා පුළුල් කිරීම	හඳුනාගත් ප්‍රතිපාදන වෙන්කිරීම් නොමැත	හඳුනාගත් ප්‍රතිපාදන වෙන්කිරීම් නොමැත
නල ජලය සැපයීම	නිවාස 450,000 ක් සඳහා නල ජල සඳහා සැපයීම සඳහා රුපියල් මිලියන 5,000 ක අතිරේක ප්‍රතිපාදන වෙන් කිරීමක්	රුපියල් මිලියන 50,000 ක වෙන්කිරීම් භාවිතයෙන් ජල සබැඳුම් මිලියන 3 ක්
කුඩා හා මධ්‍ය පරිමාණ වාණිජ කෘෂි ව්‍යවසාය සඳහා රු. 150,000 සිට 1,000,000 දක්වා ප්‍රාග්ධන ප්‍රදාන සැපයෙනු ලැබේ.	හඳුනාගත් ප්‍රතිපාදන වෙන්කිරීම් නොමැත	හඳුනාගත් ප්‍රතිපාදන වෙන්කිරීම් නොමැත

සමස්තයක් වශයෙන්, භෞතික සම්පත් සංවර්ධනය සඳහා සිදු කරන ලද ප්‍රතිපාදන වෙන් කිරීම් රජයේ ප්‍රතිපත්ති රාමු විෂය පථය තුළ නිසි පරිදි ඉදිරිපත් කොට ඇත. 2020 වසර හා සාපේක්ෂව, ආශ්‍රිත අමාත්‍යාංශ 15 සඳහා සිදු කරන ලද සමස්ත ප්‍රතිපාදන වෙන් කිරීම 2021 වසරේදී වඩා ඉහළ අගයක් ගනී. නව සහ පවත්නා වැඩසටහන් සඳහා සිදු කරන ලද ප්‍රතිපාදන වෙන් කිරීම් සම්බන්ධයෙන් බැලූ විට, සාධාරණ ප්‍රතිපාදන වෙන් කිරීම් තුළින් පිලිබිඹු වනුයේ මෙම ක්ෂේත්‍රය තුළ හඳුනාගත් ප්‍රතිපත්ති ප්‍රමුඛතාවයන් 2021 වසර තුළදී අත්පත් කර ගත හැකි බවයි.

2.9 තිරසාර පරිසර කළමනාකරණය

තිරසාර පරිසර කළමනාකරණය යනු **"** සෞභාග්‍යයේ දැක්ම**"** ජාතික ප්‍රතිපත්ති රාමුවෙහි හඳුනාගෙන ඇති ප්‍රධානතම ප්‍රතිපත්ති දහයෙන් එකකි. මෙය පරිසරය**,** ස්වභාවික සම්පත් හා අපද්‍රව්‍ය කලමනාකරණය සම්බන්ධයෙන් කටයුතු කරන බොහෝ රජයේ ආයතන වෙත හරස්කඩක් සේ විහිදී ගිය ක්‍රියාකාරකම් වලට අදාළ වෙයි. පරිසර ක්ෂේත්‍රය හා බැඳුන රජයේ ආයතන ප්‍රධාන වශයෙන් මෙම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ වගකීම් දරයි. මෙම අංශය විසින් පරිසර ක්ෂේත්‍රය හා කටයුතු කරන රජයේ ආයතන වෙනුවෙන් වන අයවැය ප්‍රතිපාදන මෙන්ම**,** තිරසාර පරිසර කළමනාකරණය සම්බන්ධ පුළුල් පරාසය ආවරණය වන වැඩසටහන් හා ව්‍යාපෘති සම්බන්ධ මුදල් වෙන්කිරීම් ද සමාලෝචනය කරනු ලබයි .

2.9.1 පරිසර ක්ෂේත්‍රය

පරිසර විෂය කැබිනට් අමාත්‍යාංශ දෙකක් ද එක් රාජ්‍ය අමාත්‍යාංශයක්ද, ඒ යටතේ එන රේඛීය ආයතනවලින්ද හැසිරවෙන පුළුල් විෂයකි. අදාල අමාත්‍යාංශ හා රේඛීය ආයතන පහත පරිදි වේ.

- පරිසර අමාත්‍යාංශය
  - මධ්‍යම පරිසර අධිකාරිය
  - භූ විද්‍යා සමීක්ෂන හා පතල් කාර්‍යාංශය
- වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය
  - රාජ්‍ය දැව සංස්ථාව
- වනජීවී රැකවරණය, අලි වැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩපිළිවෙළ හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
  - වන සංරක්ෂන දෙපාර්තමේන්තුව
  - වන සත්ත්ව සංරක්ෂණ දෙපාර්තමේන්තුව
  - සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

මේ අතුරින් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්‍යාංශය හා රාජ්‍ය දැව සංස්ථාව අයවැයෙන් මුදල් වෙන් නොකෙරෙන රාජ්‍ය ව්‍යාපාර වේ. 2021 වසර සඳහා අදාල අමාත්‍යාංශ, රාජ්‍ය අමාත්‍යාංශ හා රේඛීය ආයතනයන්ට වෙන්වූ ප්‍රතිපාදන මත මෙම සමලෝචනය පදනම්ව ඇත. මෙම සමලෝචනයේදී ප්‍රධාන දත්ත මූලාශ්‍ර ලෙස 2020 අයවැය ඇස්තමේන්තුව, 2021 අයවැයෙහි සාරාංශය හා සහ 2019 -2021 විසර්ජන පනත් කෙටුම්පත් යොදාගෙන ඇත .

2.9.2 2018 සිට 2021 දක්වා වියදම් සාරාංශය (ප්‍රතිපාදන හා වාර්ෂික වෙනස)

2019 - 2021 වසර සඳහා අදාල අමාත්‍යාංශ, රාජ්‍ය අමාත්‍යාංශ හා රේඛීය ආයතනයන්ට වෙන්වූ අයවැය ප්‍රතිපාදන මත මෙම වියදම් සාරාංශය පදනම්ව ඇත . 2020 අයවැය ඇස්තමේන්තු මගින් 2019 වසර සඳහා සංශෝධිත ඇස්තමේන්තු, 2020 වසර සඳහා ඇස්තමේන්තු හා 2021 වසර සඳහා වන ප්‍රතිපාදන (පුරෝකථන) වෙන්කිරීම් වාර්තා කොට ඇති අතර, ඒවා 2021 විසර්ජන පනත් කෙටුම්පතෙහි වාර්තා කොට ඇති ඉලක්කම් හා සමාන වේ.වාර්ෂික අයවැයෙන් ආවරණය වන ආයතන සම්බන්ධ වියදම් සාරාංශයක් 2.9.1 වගුවෙන් දක්වේ.

2.9.1 වගුව : පරිසර අංශය - වියදම් සාරාංශය

අමාත්‍යාංශය / රාජ්‍ය අමාත්‍යාංශය	වියදම් / ප්‍රතිපාදන (රු. '000)			වාර්ෂික වෙනස (2020-2021) (Rs '000)
	2019 (සංශෝධිත)	2020 (ඇස්තමේන්තු)	2021 (වෙන්කිරීම්)	
පරිසර අමාත්‍යාංශය	41,676,388	1,991,970	2,802,100	810,130
වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය	1,168,360	1,456,265	1,235,950	-220,315
වනජීවී රැකවරණය, අලි වැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩපිළිවෙළ හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	5,425,125	4,799,707	6,114,350	1,314,643
මුළු වියදම	48,269,873	8,247,942	10,152,400	1,904,458
මුළු අයවැය වියදම %	1.03	0.17	0.21	
% දළ දේශීය නිෂ්පාදිතය	0.32	0.06	0.06	
මූලාශ්‍රය - 2020 අයවැය ඇස්තමේන්තු හා 2021 විසර්ජන පනත් කෙටුම්පත				

පරිසර අංශයේ අයතන සඳහා 2021 වසර සඳහා මුලු වියදම් වෙන්කිරීම රු. මිලියන 10,152.4 කි. මෙමගින් 2020 සිට 2021 දක්වා වාර්ශිකව 23% ක වර්ධනයක් පෙන්නුම් කරයි. විශේෂයෙන්ම පරිසර ක්ෂේත්‍රය සම්බන්ධ හරස්කඩ බලපෑම සළකා බලන විට, මෙම වෙන්කිරීම් මුළු ඇස්තමේන්තුගත වියදමෙන් 0.21 % හා දල දේශීය නිෂ්පාදිතයෙන් 0.06 % වන වන ඉතා කුඩා කොටසක් වන බව සැළකිය හකිය. 2019 වසරේදී සාපේක්ෂව ඉහළ කොටසක් වාර්තා විය. (අයවැයෙන් 1.03% ක් හා දල දේශීය නිෂ්පාදිතයෙන් 0.32%). අයවැය ඇස්තමේන්තු සමාලෝචනය කිරීමෙන් පෙනීයන්නේ 2018 වසරේ සිට ප්‍රාග්ධන වියදම් යටතේ ක්‍රියාත්මක වූ යටිතල පහසුකම් සංවර්ධන ක්‍රියාකාරකම් නිසා මෙසේ සිදුවූ බවයි. 2.9.1 රූපසටහන බලන්න)

2.9.1 රූපසටහන: පුනරාවර්තන හා ප්‍රාග්ධන අයවැය ප්‍රතිපාදන ව්‍යාප්තිය (2019-2021)



මූලාශ්‍රය - 2020 අයවැය ඇස්තමේන්තු හා 2021 විසර්ජන පනත් කෙටුම්පත

2.9.3 අයවැය උපකල්පන

පරිසර ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වන වියදම් ඇස්තමේන්තු පිළිබඳව පැහැදිළිව විශේෂයෙන් අදාල වන උපකල්පනයන් දක්නට නැත. කෙසේ වෙතත්, රජයේ සියළු ආයතනයන්ට, අයවැය සම්බන්ධ ආදායම් හා වියදම් ඇස්තමේන්තුව හා අදාල වන ලෙස, පොදු තාක්ෂණික උපකල්පනයන් "2020-2021 මූල්‍ය කළමනාකරණ" වාර්තාවෙහි හා "2021 තක්සේරු : කාණ්ඩ හා අරමුණු කේත යටතේ සාරාංශය හා වියදම්" යන වාර්තාවෙහි දක්වා ඇත.

2.9.4 ප්‍රතිපත්ති ප්‍රමුඛතා

ආංශික ප්‍රතිපත්ති සහ ප්‍රතිපත්ති සංරචක හා ක්‍රමෝපාය ද ඇතුලත් උප ක්ෂේත්‍ර හතක් යටතේ වන ක්‍රියාකාරකම් කිහිපයක් සෞභාග්‍යයේ දැක්ම ජාතික ප්‍රතිපත්ති රාමුව යටතේ හඳුනාගෙන ඇත. ඒ, පරිසර හා ජෛව විවිධත්වය, වායුගෝලය, පාරිසරික අධ්‍යාපනය, ඉඩම්, සාගර සම්පත්, ජනාවාස හා නගර සහ අපද්‍රව්‍ය කළමනාකරණය යන උප අංශ හත වේ.

ප්‍රතිපත්ති උප අංශ සහ අදාළ වැඩසටහන්/ ව්‍යාපෘති පිළිබඳ විස්තර වලින් පෙන්නුම් කරන්නේ, තිරසාර පරිසර කළමනාකරණයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා පරිසරය පිළිබඳ විෂය සමඟ කටයුතු කරන ප්‍රධාන අමාත්‍යාංශවල සීමාවන් ඉක්මවා යන බවයි. අයවැය සාරාංශ මඟින් ප්‍රතිපාදන ලබා දෙන්නේ කැබිනට් අමාත්‍යාංශ මට්ටමින් පමණි. ඒ අනුව, පරිසර අංශයේ ප්‍රධාන අමාත්‍යාංශ වන පරිසර අමාත්‍යාංශයේ සහ වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශයේ වැඩසටහන / ව්‍යාපෘතිවලට අමතරව, තිරසාර පරිසර කළමනාකරණයේ ප්‍රතිපත්තිමය ප්‍රමුඛතා ආවරණය කිරීම සඳහා ප්‍රතිපාදන ද නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය (MUDH), කර්මාන්ත අමාත්‍යාංශය (MOI) සහ සංචාරක අමාත්‍යාංශය (MOT) යටතේ ඇති වැඩසටහන්/ ව්‍යාපෘති සඳහා ද ලබා දී තිබේ.

එපමණක් නොව, ජාතික ප්‍රතිපත්ති රාමුව තුල 'ජාතික අවකාශීය පද්ධතියේ නව ප්‍රවේශය' යටතේ ඇති එක් ක්‍රියාකාරකමක් වන මිනිස් අලි ගැටුම අවම කිරීම යන වැඩසටහන, වන සත්ත්ව හා වන සංරක්ෂන අමාත්‍යාංශය යටතේ, විෂය අදාළත්වය හේතුවෙන්, ලැයිස්තුගත කර ඇත. එබැවින් එය විශ්ලේෂණයේ දී ද සලකා බලන ලදී.

2.9.5 විශ්ලේෂණය

තිරසාර පරිසර කළමනාකරණයට අදාළ ක්ෂේත්‍ර ගණනාවක් ආවරණය කිරීම සඳහා අරමුදල් වෙන් කර ඇත. පහත සඳහන් ක්‍රියාකාරකම් සඳහා රු. මිලියන 500 ක් ඉක්මවන විශාල ප්‍රතිපාදනයක් ලබා දී ඇත.

- ප්ලාස්ටික් අපද්‍රව්‍ය බැහැර කිරීම හේතුවෙන් මුහුදු වෙරළට හා මුහුදු පතුලට සිදුවන හානිය වැළැක්වීම සඳහා සමුද්‍ර පිරිසිදු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (රු. මිලියන 3,185)
- රට පුරා කිලෝමීටර 4,550 ක විදුලි වැටක් නඩත්තු කිරීම, මිනිස්-අලි සහජීවනය (රු. මිලියන 2,768) සහතික කිරීම සඳහා මුර කුළුණු 429 ක් සහිත කිලෝමීටර් 1,301 ක නව විදුලි වැටක් ඉදි කිරීම.
- අරුවක්කාලු ප්‍රදේශයේ ගොඩකල සනීපාරක්ෂක අංගනයක් ඉදිකිරීම සහ දුම්රිය යටිතල පහසුකම් පහසුකම් (රු. මිලියන 1,000) භාවිතා කරමින් සංයුක්ත අපද්‍රව්‍ය කැලණිය සිට අරුවක්කාලු දක්වා ප්‍රවාහනය කිරීම.

- ලුනුගම්වෙහෙර ප්‍රදේශයේ හෙක්ටයාර 3000 ක භූමි ප්‍රමාණයක් ආවරණය වන පරිදි කි.මී. 30 ක විදුලි වැටක් සහිතව ඇත් පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් ඉදිකිරීම .
- වන විද්‍යා අධ්‍යාපන හා පුහුණුව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ගිරිතලේ ප්‍රදේශයේ ජාතික වනජීවී පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයක් සංවර්ධනය කිරීම (රු. මිලියන 690)
- වෙරළ බාදනය හේතුවෙන් බලපෑමට ලක්විය හැකි තෝරාගත් වෙරළ කලාප සංරක්ෂණය හා වැඩිදියුණු කිරීම (රු. මිලියන 518)

මෙම ක්‍රියාකාරකම් සඳහා රු. මිලියන 9,047 වැය වන අතර එය කැබිනට් අමාත්‍යාංශ පහක් යටතේ වන මුළු ප්‍රතිපාදන වලින් 74% කි (වගුව 2.9.2). ප්‍රධාන ප්‍රතිපත්ති ප්‍රමුඛතා ලෙස සැලකිය හැකි සාගර හා වෙරළ දූෂණය, අලි මිනිස් ගැටුම, නාගරික අපද්‍රව්‍ය කළමනාකරණය සහ වෙරළ බාදනය වැනි, ශ්‍රී ලංකාව මුහුණ දෙන ප්‍රධාන පාරිසරික අභියෝගයන් ඊට අයත්වේ. එබැවින් මෙම ප්‍රතිපාදන තිරසාර පරිසර කළමනාකරණයේ ප්‍රමුඛතා සඳහා යෙදවෙන්නක් ලෙස හඳුනාගත හැකිය.

2.9.2 වගුව: ප්‍රධාන අදාළ වැඩසටහන් සඳහා වෙන් කිරීම

අමාත්‍යාංශ	වැඩසටහන්	අයවැය (රු. මිලියන)
පරිසර අමාත්‍යාංශය	• පාරිසරික සංවේදී ප්‍රදේශවල ජෛව විවිධත්වය සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම සහ පාරිසරික පද්ධති සේවා ව්‍යාපෘතිය නඩත්තු කිරීම	17
	• ශ්‍රී ලංකාවේ ගෘහස්ථ වාතයෙහි ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම	12
	• නවීන තාක්ෂණයන් වෙළඳපොළට හඳුන්වා දීමේ වැඩසටහන යටතේ 2030 වන විට ඕසෝන් ක්ෂය වන ද්‍රව්‍ය වලින් සහ 2028 වන විට පොලික්ලෝරිනීකෘත බයිෆිනයිල් අපද්‍රව්‍ය ද්‍රව්‍ය වලින් හා උපකරණ වලින් නිදහස් වීමේ අදියර සම්පූර්ණ කිරීම.	80
	• දේශගුණික විපර්යාසයන්ගේ අහිතකර බලපෑම් වලට එරෙහිව ක්‍රියාමාර්ග පුළුල් කිරීම සඳහා කාබන් පාලනය (carbon trading) සඳහා රට සකස් කිරීම	116
	• පාසල් අධ්‍යාපනය තුලින් ප්‍රජාව තුළ තිරසාර පාරිසරික සංකල්ප පිලිබඳ ආකල්ප ප්‍රතිෂ්ඨාපනය කිරීම (පාසල් පාරිසරික වැඩසටහන)	100
වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය	• හෙක්ටයාර 1000 ක් නැවත වන වගා කිරීම, වාර්ෂිකව හෙක්ටයාර් 1000 ක වාණිජ වනාන්තර පිහිටුවීම, හෙක්ටයාර් 1600 ක භූමි ප්‍රදේශයක වනාන්තර කළමනාකරණය -	549
	• තත්වයෙන් පහල වනාන්තර ප්‍රතිෂ්ඨාපනය හා නඩත්තු කිරීම සහ කඩොලාන පරිසර පද්ධතිය සංරක්ෂණය කිරීම	122
	• හෙක්ටයාර් 1300 ක භූමි ප්‍රදේශයක ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම	80
	• පරිසර සංචාරක ව්‍යාපාරය දිරිගැන්වීම සහ වැඩිදියුණු කිරීම	50
	• ජාතික උද්‍යානවල අභ්‍යන්තර මාර්ග අළුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම පිළිබඳ ව්‍යාපෘතිය යටතේ ජාතික උද්‍යාන 9 ක මාර්ග කිලෝමීටර 1510 ක් අළුත්වැඩියා කිරීම	30
	• පින්නවල අලි අනාථාගාරය සංවර්ධනය කිරීම	130
	• පින්නවල සත්වෝද්‍යානය 150 සංවර්ධනය කිරීම	150
	• රිදියගම, හම්බන්තොට සෆාරි උද්‍යානය සංවර්ධනය කිරීම	112
	• දෙහිවල සත්වෝද්‍යානය සංවර්ධනය කිරීම	240
	• රට පුරා කිලෝමීටර 4550 ක විදුලි වැටක් නඩත්තු කිරීම, මිනිස් අලි-සහජීවනය සහතික කිරීම සඳහා මුර කුළුණු 429 ක් සහිත කිලෝමීටර් 1301 ක නව විදුලි වැටක් ඉදි කිරීම.	2,768
	• ලුනුගම්වෙහෙර ප්‍රදේශයේ හෙක්ටයාර් 3000 ක භූමි ප්‍රදේශයක් ආවරණය වන පරිදි කිලෝමීටර් 30ක විදුලි වැටක් සහිත අලි පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් ඉදිකිරීම	862

	• වන විද්‍යා අධ්‍යාපනය වැඩිදියුණු කිරීම සහ පුහුණු කිරීම පිළිබඳ ව්‍යාපෘතිය යටතේ ගිරිතලේ ප්‍රදේශයේ ජාතික වනජීවී පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයක් සංවර්ධනය කිරීම .	690
	• සත්ව ආහාර බෝග වගාව පුළුල් කිරීම සහ වාර්ෂිකව නව තෘණ බිම් හෙක්ටයාර් 250 ක් ස්ථාපිත කිරීම සහ පාංශු සංරක්ෂණ කටයුතු ක්‍රියාත්මක කිරීම	250
සංචාරක අමාත්‍යාංශය	• උද්භිද උද්‍යාන 14 ක් අළුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම සහ වැඩිදියුණු කිරීම සහ සංචාරකයින් සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම	470
	• පේරාදෙනිය රාජකීය උද්භිද උද්‍යානය වැඩි දියුණු කිරීම.	188
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය	• පොදු උද්‍යාන හා පොදු පහසුකම්, ඇවිදීමේ මංතීරු , නාගරික උද්‍යාන සහ ජල උද්‍යාන, වාහන නැවතුම්පල සහ බස් පර්යන්ත, සාප්පු සංකීර්ණ සහ ගොඩනැගිලි සංවර්ධනය කිරීම	428
	• බේරේ වැව හා ඒ අවට පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම	150
	• වෙරළ බාදනය හේතුවෙන් බලපෑමට ලක්විය හැකි තෝරාගත් වෙරළ කලාප සංරක්ෂණය හා වැඩිදියුණු කිරීම.	518
	• වෙරළ සංරක්ෂණය සහ වෙරළ ස්ථායිකරණය	394
	• ප්ලාස්ටික් අපද්‍රව්‍ය බැහැර කිරීම හේතුවෙන් මුහුදු වෙරළට හා මුහුදු පතුලට සිදුවන හානිය වැළැක්වීම සඳහා සමුද්‍ර පිරිසිදු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	3,185
	• ප්‍රදේශයේ සනීපාරක්ෂක ගොඩකිරීමේ අංගනයක් ඉදිකිරීම සහ දුම්රිය යටිතල පහසුකම් භාවිතා කරමින් සංයුක්ත අපද්‍රව්‍ය කැලනිය සිට අරුවක්කාලු දක්වා ප්‍රවාහනය කිරීම	1,000
කර්මාන්ත අමාත්‍යාංශය	• පරිසර හිතකාමී විසඳුම් (ඊ ෆ්‍රෙන්ඩ්) සඳහා චක්‍රීය ණය අරමුදල II යටතේ පරිසර හිතකාමී කර්මාන්ත සඳහා සමාගම් 100 කට මූල්‍ය ආධාර ලබා දීම.	400
මුළු එකතුව		**12,229**

අනෙක් සියළුම ක්‍රියාකාරකම් සඳහා ප්‍රතිපාදන වලින් 26% ක් ලැබෙන අතර ඒවායින් බහුතරයක් රු. මිලියන 200 ට අඩුය. පරිසරය හා ජෛව විවිධත්වය, වායුගෝලය සහ පාරිසරික අධ්‍යාපනය යන උප අංශ යටතේ උපාය මාර්ග හා ක්‍රියාකාරකම් සාමාන්‍යයෙන් 2021 අයවැයෙන් ආවරණය වන නමුත් සමහර වැඩසටහන් සඳහා අරමුදල් ලබා ගැනීමේ හැකියාව ඉතා අඩු බව පෙනේ. සාගර සම්පත් හා අපද්‍රව්‍ය කළමනාකරණ උප අංශවල ක්‍රියාකාරකම් හා උපාය මාර්ග ද අර්ධ වශයෙන් ආවරණය වන අතර ඒවාට සැලකිය යුතු ප්‍රතිපාදන ලැබී තිබේ. එක් ක්‍රියාකාරකමක් ආවරණය කිරීම සඳහා ඉඩම් උප අංශයට සීමිත ප්‍රතිපාදනයක් ලැබී ඇති අතර ජනාවාස හා නගර උප අංශ යටතේ වන ක්‍රියාකාරකම් අයවැය යටතේ ආවරණය කර නොමැත.

කෙසේ වෙතත්, ඇතැම් ක්‍රියාකාරකම් සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත්ද යන්න සැක සහිත බව පෙනේ. උදාහරණ කිහිපයක්:
1. ශ්‍රී ලංකාවේ ගෘහස්ථ වායු ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම (රු. මිලියන 12)
2. පාරිසරික සංවේදී ප්‍රදේශවල ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම සහ පාරිසරික පද්ධති සේවා නඩත්තු කිරීම (රු. මිලියන 17)
3. ජාතික වනෝද්‍යානවල අභ්‍යන්තර මාර්ග අළුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම පිළිබඳ ව්‍යාපෘතිය යටතේ ජාතික උද්‍යාන 9 ක මාර්ග කිලෝමීටර 1510 ක් අළුත්වැඩියා කිරීම (රු. මිලියන 30)
4. පරිසර සංචාරක ව්‍යාපාරය දිරිගැන්වීම සහ වැඩිදියුණු කිරීම (රු. මිලියන 50)
5. හෙක්ටයාර් 1300 ක ප්‍රදේශයක ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම. (රු. මිලියන 80)

මෙයින් 1, 2 සහ 4 රට පුරා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාකාරකම් වලට සම්බන්ධ වන අතර ප්‍රතිපාදන තරමක් කුඩාය. 3 සහ 5 යන වඩාත් දේශීයකරණය වූ ක්‍රියාකාරකම් වලදී, සාමාන්‍ය ප්‍රතිපාදන මාර්ගය කිලෝමීටරයක් සඳහා සහ හෙක්ටයාරයකට පිළිවෙලින් රු. 19,867 හා රු. 61,567 කි. අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී , වෙන් කළ මුදල් හා භාවිතා කරන ලද උපකල්පන භාවිතා කර අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගත හැකිද යන්න මෙම අවස්ථා වලදී පැහැදිලි නැත.

2.9.6 නිරීක්ෂණ

කැබිනට් අමාත්‍යාංශ විසින් ප්‍රමුඛතා ක්ෂේත්‍ර සඳහා වෙන්කල නිශ්චිත ප්‍රතිපාදන වගුව මගින් වාර්තා කරයි. කැබිනට් අමාත්‍යාංශ පහක් යටතේ තිරසාර පරිසර කළමනාකරණයට අදාළ වැඩසටහන් / ව්‍යාපෘති සඳහා රු මිලියන 12,229 ක් වෙන් කර ඇති බව එමගින් පෙන්වා දෙයි . අදාළ අමාත්‍යාංශ සඳහා වෙන් කර ඇති උප එකතුව පහත පරිදි වේ:

පරිසර අමාත්‍යාංශය (රු. මිලියන 325), වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය (රු. මිලියන 5,171), නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය (රු. මිලියන 5,675), සංචාරක අමාත්‍යාංශය (රු. මිලියන 658) සහ කර්මාන්ත අමාත්‍යාංශය (රු. මිලියන 400).

පරිසරය පිළිබඳ මූලික අමාත්‍යාංශය වන පරිසර අමාත්‍යාංශයට අඩුම ප්‍රතිපාදන ලැබෙන අතර නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය විසින් ඉහළම ප්‍රතිපාදන ලබා ගන්නා අතර වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය, සංචාරක අමාත්‍යාංශය සහ කර්මාන්ත අමාත්‍යාංශය යන සියල්ලම පරිසර අමාත්‍යාංශයට වඩා වැඩි ප්‍රතිපාදන ලබා ඇත . මෙම තත්ත්වය ප්‍රධාන වශයෙන් සිදුවී ඇත්තේ පරිසර විෂය සම්බන්ධයෙන් වගකිව යුතු අමාත්‍යාංශය යටතේ පැවතිය යුතු අමාත්‍යාංශ කිහිපයක් අතර අදාළ රේඛීය ආයතන බෙදා හැරීම හේතුවෙනි. වර්තමාන විධිවිධානය යටතේ, පරිසර අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රධාන ආයතන වන්නේ මධ්‍යම පරිසර අධිකාරිය (CEA) සහ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය (GSMB) පමණි. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, රාජ්‍ය දැව සංස්ථාව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ජාතික සත්ව උද්‍යාන දෙපාර්තමේන්තුව, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය සහ වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව අමාත්‍යාංශ කිහිපයක් යටතේ විසිරී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස තිරසාර පරිසර කළමනාකරණය සඳහා ප්‍රතිපාදන අමාත්‍යාංශ කිහිපයක් අතර බෙදා හැර තිබේ. මෙම සමහර අමාත්‍යාංශවල ප්‍රධාන වගකීම් පරිසරයට සම්බන්ධ නොවේ (උදා:නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය, සංචාරක අමාත්‍යාංශය) මෙය වැඩසටහන් / ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී සැලකිය යුතු සම්බන්ධීකරණ හිඩැස් ඇති කිරීමට හේතු වේ.

2.9.7 නිගමන

සමස්තයක් වශයෙන්, 2021 අයවැයෙන් ඉතා අඩු කොටසක් (0.21%) පරිසරය විෂය සම්බන්ධයෙන් කටයුතු කරන ප්‍රධාන අමාත්‍යාංශ සඳහා වෙන් කර ඇත. ඒවායින්, පරිසර අමාත්‍යාංශය සඳහා වෙන් කිරීම ඉතා සීමිතය. මිනිස් අලි ගැටුමට විසඳුම් සෙවීම සඳහා විශේෂයෙන් ඉලක්ක කර ඇති වන සංරක්ෂණ අමත්‍යාංශයට සහ රාජ්‍ය අමාත්‍යාංශයට සාපේක්ෂව විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කෙරේ. කෙසේ වෙතත්, තිරසාර පරිසර කළමනාකරණය සඳහා ප්‍රතිපත්තිමය ප්‍රමුඛතා ආවරණය වන ලෙසින් අනෙකුත් අමාත්‍යාංශවලට ද ප්‍රතිපාදන ලබා දී ඇත. සමුද්‍ර හා වෙරළ දූෂණය, වෙරළ බාදනය හා අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධ ගැටළු විසඳීම සඳහා නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය වෙත සැලකිය යුතු අරමුදල් ප්‍රමාණයක් වෙන් කර ඇත. සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම සඳහා සංචාරක අමාත්‍යාංශය වෙත මුදල් ලැබේ. පරිසර හිතකාමී ව්‍යවසායන් ප්‍රවර්ධනය කිරීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශයට අරමුදල් ලබා දී ඇත. එබැවින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී අදාළ අමාත්‍යාංශ අතර ප්‍රවේශමෙන් සම්බන්ධීකරණය කිරීම අවශ්‍ය වේ.

2.10 විනයගරුක, නීතිගරුක සහ ගුණගරුක සමාජයක්

රටකට සැබෑ ප්‍රගතියක් සාක්ෂාත් කරගත හැකි වන්නේ ආර්ථික සංවර්ධනයට සමගාමීව අධ්‍යාත්මික සංවර්ධනයක් සිදු වුවහොත් පමණක් බව රජයේ ප්‍රතිපත්ති රාමුව වන ‘‘සෞභාග්‍යයේ දැක්මෙහි’’ සඳහන් වෙයි. ‘ගුණගරුක, විනයගරුක සහ නීතිගරුක සමාජයක්’ පිළිබඳ විශේෂිත පරිච්ඡේදයක් වෙන් කරමින් ප්‍රධාන ක්ෂේත්‍ර හයක් කෙරෙහි එමඟින් අවධානය යොමු කර ඇත. ඒවා නම්, ආගම දහමට ප්‍රමුඛස්ථානය ලබා දීම; නීතිගරුක හා සාධාරණ සමාජයක් ගොඩනැගීම; පැහැදිලි ජනමාධ්‍ය ප්‍රතිපත්තියක් හඳුන්වා දීම; ඉතිහාසය, පුරාවිද්‍යාව සහ ජාතික උරුමයන්; සංස්කෘතිය, සාහිත්‍ය හා කලාව; සමාජ ආරක්ෂණය සහ සුභසාධනය සහතික කිරීමයි.

මෙම කොටසට අදාලව රජයේ වියදම් විශ්ලේෂණය කිරීමේදී මතු කියැවෙන අමාත්‍යාංශවල සහ රාජ්‍ය අමාත්‍යාංශවල වියදම් සැලකිල්ලට භාජනය කෙරිණ : බුද්ධශාසන අමාත්‍යාංශය, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, ජාතික උරුමයන්, ප්‍රාසාංගික කලා සහ ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය, ජනමාධ්‍ය අමාත්‍යාංශය, අධිකරණ අමාත්‍යාංශය, බන්ධනාගාර ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය.[8]

8 සමාජ ආරක්ෂණය සහ සුබසාධනයට අදාල අමාත්‍යාංශ, රාජ්‍ය අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු මෙම අංශය මඟින් ආවරණය නොකෙරේ.

2.10.1 වැය කිරීම් පිළිබඳ සාරාංශය

අමාත්‍යාංශ, රාජ්‍ය අමාත්‍යාංශ සහ ඒවා යටතේ වන අදාල දෙපාර්තමේන්තු අතර වැය කිරීම් සඳහා මුදල් වෙන් කර ඇති ආකාරය පිළිබඳ විස්තරාත්මක සංඛ්‍යාලේඛනයක් 2.10.1 වගුවෙහි දක්වා ඇත. 2020 හා 2021 වසර සඳහා බැලීමේදී බුද්ධශාසන අමාත්‍යාංශය, අධිකරණ අමාත්‍යාංශය සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය උදෙසා වැය කිරීම් සඳහා මුදල් වෙන් කිරීමේදී 26% ක කැපී පෙනෙන වර්ධනයක් දක්නට ලැබේ. ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතට ගැනෙන තැපැල් දෙපාර්තමේන්තුවේ වියදම් සලකා නොබැලීම හේතුවෙන් 2021 වර්ෂය සඳහා එම අමාත්‍යාංශයට මුදල් වෙන් කිරීමේදී විශාල අඩුවක් දැකිය හැකිය.[9] 2020 හා සසඳන කල 2021 වසර සඳහා මෙම අංශයේ වියදම් උදෙසා මුදල් වෙන් කිරීම සමස්තයක් ලෙස සුළු වශයෙන් පහත වැටී ඇත.

2.10.1 වගුව: වැය කිරීම් පිළිබඳ සාරාංශය, 2018-2021

අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	රජයේ වියදම්/වෙන් කිරීම් (රු.මිලි.)				වසරින් වසරට වෙනස් වීම (%)
	2018	2019	2020	2021	2020-2021
බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	4,192	7,023	5,493	6,946	26.4
ජාතික උරුමයන්, ප්‍රාසාංගික කලා සහ ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන	අදාල නොවේ.	අදාල නොවේ.	607	604	-0.5
ජනමාධ්‍ය අමාත්‍යාංශය	16,298	17,551	20,237	5,192	74.3
අධිකරණ අමාත්‍යාංශය	11150	12892	15726	19754	26
බන්ධනාගාර ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය	-	6224	8228	10389	26
'ගුණගරුක , සහ විනයගරුක නීතිගරුක සමාජයක්' සඳහා වන සමස්ත ආංශික වියදම	31,640	43,690	50,291	42,885	
රජයේ අයවැයේ කොටස (%)	0.79	1.49	1.80	1.60	-0.19
දළ දේශීය නිෂ්පාදිතයේ කොටස (%)	0.22	0.29	0.31	0.24	-0.08

සටහන : 2018 වසරේදී බන්ධනාගාර ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය වෙනමම අමාත්‍යාංශයක් ලෙස ක්‍රියාත්මක නොවීය.

මූලාශ්‍ර : මුදල් අමාත්‍යාංශ වාර්ෂික වාර්තා (2018, 2019); අයවැය ඇස්තමේන්තු (2020); විසර්ජන පනත් කෙටුම්පත (2021).

2.10.2 ප්‍රතිපත්ති ප්‍රමුඛතා

'ගුණගරුක, විනයගරුක සහ නීතිගරුක සමාජයක්' නිර්මාණය කිරීමේ ඉලක්කයට අදාලව සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් ප්‍රතිපත්ති ප්‍රමුඛතා පහත පරිදි වේ.

විනයගරුක සමාජයක් ගොඩනැගීමට ද අදාල වන ඇතැම් ප්‍රමුඛතා 'සමාජ ආරක්ෂණය සහ සුභසාධනය' යටතේ සඳහන් කර ඇත.

9 මෙම දෙපාර්තමේන්තුව යටතේ දැරීමට සිදු වූ වියදම් පිළිබඳ මෙම වාර්තාවේ වෙනම කොටසකින් ආවරණය කර ඇත. ('දූෂණයෙන් තොර පරිපාලනයක්' පිළිබඳ 3 වන පරිච්ඡේදය) (10-1 වගුව).

<u>ආගම දහමට ප්‍රමුඛස්ථානය:</u> බුදු දහමට ප්‍රමුඛස්ථානය ලබා දීම මෙන්ම බුද්ධ ශාසනය ආරක්ෂා කිරීමට සමගාමීව අන් සෑම ආගමකම අයිතිය සුරක්ෂිත කිරීම මින් අදහස් කෙරේ. තව ද ආගමික අන්තවාදයට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමත් සෑම පුරවැසියෙකුටම තම ආගම ඇදහීමේ අයිතිය තහවුරු කිරීමත් ඉන් අපේක්ෂිතයි. රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා නිශ්චිතව මතු කියැවෙන අරමුණු හඳුනා ගනී : අ) දුෂ්කර ප්‍රදේශවල පිහිටා ඇති විහාරස්ථානවල යටිතල පහසුකම් නංවාලීම සඳහා 'සසුන් උදාව' වැඩසටහන ක්‍රියාත්මක කිරීම; භික්ෂුණී වහන්සේ සඳහා වන යටිතල පහසුකම් සංවර්ධනය; ගමේ පන්සල හරහා සමාජ, ආර්ථික හා සාරධර්ම ප්‍රවර්ධනය; භික්ෂූන් වහන්සේගේ කුසලතා වර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම; සෑම ආගමකටම අයත් ලියාපදිංචි ආගමික පාඨශාලාවල අඩුපාඩු විධිමත්ව සපුරාලීම උදෙසා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

<u>පැහැදිලි ජනමාධ්‍ය ප්‍රතිපත්තියක්:</u> ජනමාධ්‍යවේදීන්ට සිය රාජකාරි බාධාවකින් තොරව ඉටු කිරීමට හැකි පරිසරයක් නිර්මාණය කිරීම. එය ක්‍රියාමාර්ග කිහිපයක් මඟින් සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂිතයි. ඒ අතර, මාධ්‍ය වෘත්තිකයන් නිර්මාණය කිරීම සඳහා ජනමාධ්‍ය සම්බන්ධයෙන් උසස් අධ්‍යාපන ආයතනයක් ස්ථාපනය කිරීම, කුසලතා වර්ධනය සහ සුබසාධන සේවා සැපයීම (උදා:- නිවාස පහසුකම් සහ සහනදායී වාහන ණය). මාධ්‍යයේ ප්‍රමිතීන් ඉහළ නැංවීම, ජනමාධ්‍ය ආයතනවල ආයෝජන නියාමනය සහ මාධ්‍ය කටයුතු සම්බන්ධයෙන් වන පරිපාලනයන් හා මෙහෙයුම් ප්‍රතිව්‍යූහගත කිරීමට ද ශ්‍රී ලංකා රජය අපේක්ෂා කරයි.

<u>ඉතිහාසය, පුරා විද්‍යාව සහ ජාතික උරුමයන්:</u> ඓතිහාසික උරුමයන් පිහිටි සහ පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුත් ස්ථාන සංරක්ෂණය හා ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කිරීම, 'ඩිජිටල් පුරාවිද්‍යාත්මක විශ්වකෝෂයක්' නිර්මාණය කිරීම මඟින් පුරාවිද්‍යාත්මක සහ ඓතිහාසික වටිනාකමින් යුත් ස්ථාන පිළිබඳ තොරතුරු සඳහා වන ප්‍රවේශය වර්ධනය කිරීම, පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුත් ස්ථානවල පහසුකම් පුළුල් කිරීම සහ සංචාරක මහපෙන්වන්නන්ගේ ශක්‍යතාවන් වර්ධනය කිරීම.

<u>සංස්කෘතිය, සාහිත්‍ය හා කලාව:</u> මෙම අංශවල ප්‍රවර්ධනය හා නවීනත්වය ඉලක්ක කර ගත් විවිධ වූ ක්‍රියාමාර්ග මඟින් එම අංශවල ප්‍රගතියක් ඇති කිරීම මින් අදහස් කෙරේ. යටිතල පහසුකම් වර්ධනය, කුසලතා සංවර්ධනය උදෙසා පහසුකම් සැලසීම සහ කලාකරුවන් සඳහා සුබසාධන සේවා සැපයීම කෙරෙහි ද අවධානය යොමු කෙරේ.

<u>නීතිගරුක හා සාධාරණ සමාජයක්:</u> මෙම ක්ෂේත්‍රයට මතු කියැවෙන ප්‍රතිපත්ති ඇතුලත් වේ: සමස්ත රටටම අදාල වන එක් නීති මාලාවක් ස්ථාපනය කිරීම, යල් පැන ගිය නෛතික ක්‍රියාමාර්ග හා අණපනත් සංශෝධනය කිරීම සහ නව නෛතික පද්ධතියක් හඳුන්වා දීම, යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියේ ප්‍රමාදයන් මඟ හරවාලීම, නීතිය බලාත්මක කිරීමේ ආයතන ප්‍රතිව්‍යූහගත කිරීම, අධිකරණ පද්ධතිය සහ ඒ හා සබැඳි ආයතනවල සම්බන්ධීකරණ කටයුතු වර්ධනය කිරීම උදෙසා ඩිජිටල් තාක්ෂණය භාවිත කිරීම ප්‍රවර්ධනය, විනිසුරුවරුන් පත් කිරීම සම්බන්ධයෙන් පාරදෘශ්‍ය යාන්ත්‍රණයක් හඳුන්වා දීම සහ නීතිඥයින්ගේ වෘත්තියභාවය අඛණ්ඩව වර්ධනය කිරීම සඳහා කටයුතු කිරීම;

<u>අපරාධ පාලනය:</u> මෙම ක්ෂේත්‍රයට මතු කියැවෙන ප්‍රතිපත්ති ඇතුලත් වේ: පොලිසිය ශක්තිමත් කිරීම, අධිකරණය හමුවේ පවතින අපරාධ නඩු විභාග කර ප්‍රමාදයකින් තොරව අවසන් කිරීම සඳහා අධිකරණ පද්ධතිය ප්‍රතිව්‍යූහගත කිරීම, අපරාධකරුවන්ට දේශපාලන සහාය හිමි වීම වළක්වාලීම පිණිස විශේෂ නියාමන යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම, බන්ධනාගාරගත අපරාධකරුවන් අධීක්ෂණය කිරීම සඳහා වන පහසුකම් වර්ධනය කිරීම, පළමු වරට බන්ධනාගාරගතවන්නන් හා සුළු වැරදි සම්බන්ධයෙන් බන්ධනාගාරගතවන්නන් සඳහා සියළු පහසුකම්වලින් සමන්විත පුනරුත්ථාපන මධ්‍යස්ථාන දෙකක් ස්ථාපනය සහ යළි යළිත් ආඥාලාභීන් වන සිරකරුවන් පුනරුත්ථාපනය සඳහා ක්‍රියාකාරී වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

<u>මාර්ග අනතුරු පාලනය:</u> මෙම ක්ෂේත්‍රයට මතු කියැවෙන ප්‍රතිපත්ති ඇතුලත් වේ: සෑම මාර්ගයකම පදික මං තීරු ඉදි කිරීම මෙන්ම නියම කරන ලද ස්ථානවලින් පමණක් පදිකයන්ට මාර්ග හරහා මාරු වීමට යාන්ත්‍රණයක් සැකසීම; නොසැලකිලිමත් රියැදුරන් නිරන්තරයෙන් හඳුනා ගැනීම සඳහා සෑම ප්‍රධාන මාර්ගයකම සමීප රූප ආවේක්ෂණ කැමරා පද්ධති ස්ථාපනය කර අධීක්ෂණය කිරීම; මාර්ග අනතුරු හේතුවෙන් සිදු විය හැකි මරණ හා යළි යථා තත්ත්වයට පත් කළ නොහැකි ආබාධිත තත්ත්වයන් සඳහා සැලකිය යුතු වන්දි මුදලක් ලබා දීමට දැනට පවතින නීති වෙනස් කළ යුතුදැයි අවධානය යොමු කිරීම.

2.10.3 අයවැය වෙන් කිරීම් ප්‍රතිපත්ති ප්‍රමුඛතා සමඟ ගැලපීම

ගුණගරුක සමාජයක් බිහි කිරීම හා සබැඳි රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා, ප්‍රතිපත්ති මඟින් සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂිත ඉලක්ක වෙතින් පිළිබිඹු වන ඒ හා සබැඳි බලාපොරොත්තු සමඟ සසඳා 2021 අයවැයෙන් වියදම් සඳහා කර තිබෙන වෙන් කිරීම් සමඟ සසැඳීම 2.10.2 වගුවෙන් සිදු කර ඇත. ප්‍රතිපත්ති ප්‍රමුඛතා මඟින් හඳුනාගත් බහුතරයක් වැඩසටහන් සඳහා එනම්, 'ආගම දහමට ප්‍රමුඛස්ථානය', 'පැහැදිලි ජනමාධ්‍ය ප්‍රතිපත්තියක්', 'ඉතිහාසය, පුරාවිද්‍යාව හා ජාතික

උරුමයන්' සහ 'සංස්කෘතිය, සාහිත්‍යය හා කලාව' යන වැඩසටහන් උදෙසා අයවැය කථාවෙන් හෝ අයවැය විශේෂතා ලේඛනයෙන් මුදල් වෙන් කිරීමක් සිදු කර නොමැති බව එමඟින් පැහැදිලිව ගම්‍ය වෙයි. බහුතරයක් නිශ්චිත ප්‍රමුඛතා ක්ෂේත්‍රයන්, විශේෂයෙන් 'සංස්කෘතිය, සාහිත්‍ය හා කලාව' යන ශීර්ෂය යටතේ වන ක්ෂේත්‍රයන් අවධානයට ලක්ව නොමැත.

නීතිගරුක සමාජයක් බිහි කිරීම යන ප්‍රතිපත්ති ප්‍රමුඛතාව යටතේ නෛතික පද්ධතිය නවීකරණයට ලක් කිරීමට සහ එහි කාර්යක්ෂමතාව හා පාරදෘශ්‍ය බව වර්ධනය කිරීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් පරිදි ක්‍රියා කර ඇති අතර, මෙම අංශ සඳහා ප්‍රාග්ධන ව්‍යයම්වලින් මුදල් වෙන් කර තිබෙන අතර අධිකරණ අමාත්‍යාංශය සඳහා ප්‍රාග්ධන ව්‍යයම්වලින් වෙන් කර ඇති මුදල 2020 වසරට සාපේක්ෂව සමස්තයක් ලෙස ඉහළ නංවා ඇත. කෙසේ වෙතත් මෙම ක්ෂේත්‍රයට අදාලව මානව ප්‍රාග්ධනයේ ශක්‍යතාවන් වර්ධනය කිරීමේ ඉලක්කය පිළිබඳ අවධානය යොමු කර නොමැති අතර ඒ සඳහා නිශ්චිත මුදල් වෙන් කිරීමක් ද සිදු කර නොමැත.

අපරාධ පාලනය, පොලිසියේ තාක්ෂණික ශක්‍යතාවන් සහ සිරකරුවන් සඳහා පුනරුත්ථාපන පහසුකම් වර්ධනය කිරීම සම්බන්ධයෙන් අයවැයෙන් අවධානය යොමු කර තිබුණ ද, දේශපාලන අතපෙවීම් වළක්වාලීම, අධීක්ෂණය සහ සිරකරුවන් යන්න පිළිබඳ නිශ්චිත අර්ථ දැක්වීමක් සිදු කර නොමැති අතර පෙර වසරට සාපේක්ෂව බන්ධනාගාර ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශයට ප්‍රාග්ධන ව්‍යයම්වලින් වෙන් කර ඇති මුදල ඉහළ නංවා තිබේ. මාර්ග විනය වර්ධනය කිරීම සම්බන්ධයෙන් වන ප්‍රතිපත්ති ප්‍රමුඛතා පිළිබඳ සෑහීමකට පත් විය ආකාරයෙන් අවධානය යොමු කර නොමැති අතර පෙර සඳහන් කළ පරිදි විවිධ අයවැය ලේඛනවල සඳහන් නිශ්චිත වෙන් කිරීම් අතර ද පරස්පරතා දැකිය හැකිය.

2.10.2 වගුව: රජයේ ප්‍රතිපත්ති සහ 2021 අයවැය	
රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතාව	**වෙන් කිරීම් සහ නිරීක්ෂණ**
ආගම, දහමට මුල් තැන	
සෑම ආගමකම අයිතීන් ආරක්ෂා කිරීම. ආගමික අන්තවාදයට එරෙහිව පියවර ගැනීම සහ සෑම පුරවැසියෙකුටම සිය ආගම ඇදහීමේ අයිතිය තහවුරු කිරීම.	සෑම ආගමකටම අයත් දහම් පාසල් පෙළපොත් ලබා දීම - වෙන් කළ මුදල රු. මිලියන 217 යි. දහම් පාසල් ගුරුවරුන් සඳහා නිල ඇඳුම් සහ *දැහැමි දිරිය* දීමනාව ලබාදීම - සෑම ආගමකටම රු. මිලියන 781 යි.
දුෂ්කර ප්‍රදේශවල පිහිටි සහ නිසියාකාරයෙන් පවත්වා ගෙන යාමට අපහසු විහාරස්ථානවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම උදෙසා 'සසුන් උදාව' වැඩසටහන ක්‍රියාත්මක කිරීම. 'බුද්ධ - ශාසන' අරමුදල හා මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් ආගමික කටයුතු නිරන්තරයෙන් ඉටු කෙරෙන විහාරස්ථාන මෙන්ම මෙහෙණි ආරාම සංවර්ධනය හා ඒවායේ නඩත්තු සිදු කිරීම.	සමස්ත රටම ආවරණය වන පරිදි පූජා ස්ථාන 20 ක පහසුකම් වර්ධනය කිරීම උදෙසා රු.මිලියන 75 ක් වෙන් කර ඇත. පුරාවිද්‍යාත්මක සහ සංස්කෘතික මධ්‍යස්ථාන පුනරුත්ථාපනය උදෙසා, දුෂ්කර ප්‍රදේශවල විහාරස්ථානවල මූලික යටිතල පහසුකම් සපුරාලීම සඳහා රු.මිලියන 50 ක අතිරේක මුදලක් අයවැය කථාවෙන් වෙන් කර ඇත.
භික්ෂූන් වහන්සේගේ කුසලතා වර්ධනයට මෙන්ම බුදු සසුනට සිය දරුවන් පරිත්‍යාග කළ දෙමාපියන්ට ගරු කරමින් ගමේ පන්සල කේන්ද්‍ර කරගත් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම	මුදල් වෙන් කිරීමක් සිදු කර නොමැත.
පැහැදිලි ජනමාධ්‍ය ප්‍රතිපත්තියක්	
ජනමාධ්‍ය වෘත්තිකයන්ට සිය රාජකාරි නිදහසේ හා බාධාවකින් තොරව ඉටු කිරීමට අවශ්‍ය පරිසරය නිර්මාණය කිරීම.	ජනමාධ්‍යවේදීන්ට පහසුකම් සලසමින් පළාත් මට්ටමින් මාධ්‍ය කටයුතු පුළුල් කිරීම උදෙසා මුදල් වෙන් කර ඇත. - රු.මිලියන 493 වසන්තම් නාලිකාව සහ යාල් එෆ්. එම්. නාලිකාවේ කටයුතු පුළුල් කිරීම - රු. මිලියන 270. ජනමාධ්‍ය වෘත්තිකයන් වෙනුවෙන් සමාජ ආරක්ෂණ සැලැස්මක් සැකසීම. - රු. මිලියන 100
ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සහ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව පාර්ලිමේන්තුවට වග කියන කොමිෂන් සභාවක් යටතට ගෙන ඒම.	මුදල් වෙන් කිරීමක් සිදු කර නොමැත.
ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ අධීක්ෂණ පරාසය ඉලෙක්ට්‍රොනික, මුද්‍රිත සහ වෙනත් නව මාධ්‍ය ආවරණය වන පරිදි සංශෝධනය කිරීම.	මුදල් වෙන් කිරීමක් සිදු කර නොමැත.

2.10.2 වගුව: රජයේ ප්‍රතිපත්ති සහ 2021 අයවැය	
රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතාව	**වෙන් කිරීම් සහ නිරීක්ෂණ**
ජනමාධ්‍ය වෘත්තිකයන් උදෙසා නිවාස සංකීර්ණයක් ඉදි කිරීම සහ ඔවුන් වෙනුවෙන් සහනදායී වාහන ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම.	ජනමාධ්‍ය වෘත්තිකයන් උදෙසා නිවාස සංකීර්ණයක් ඉදි කිරීමට සහ ඔවුන් වෙනුවෙන් සහනදායී වාහන ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දීමට නිශ්චිතව මුදල් වෙන් කර නොමැති වුවද ජනමාධ්‍ය වෘත්තිකයන් සඳහා සමාජ ආරක්ෂණ ක්‍රමවේදයක් සැකසීමට රු. මිලියන 100 ක් වෙන් කර ඇත.
පුවත්පත් සමාජ පළාත් මට්ටමින් ස්ථාපනය.	මුදල් වෙන් කිරීමක් සිදු කර නොමැත.
ඉතිහාසය, පුරාවිද්‍යාව සහ ජාතික උරුමයන්	
ඓතිහාසික උරුමයන් සහ පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුත් ස්ථාන සංරක්ෂණය හා ආරක්ෂා කිරීම.	සමස්ත රටම ආවරණය වන පරිදි පූජා ස්ථාන 20 ක පහසුකම් නංවාලීමට රු. මිලියන 75 ක් වෙන් කර ඇත. තව ද දුෂ්කර ප්‍රදේශවල විහාරස්ථානවල මූලික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම පිණිස පුරාවිද්‍යාත්මක සහ සංස්කෘතික මධ්‍යස්ථාන පුනරුත්ථාපනයට රු. මිලියන 50 ක අතිරේක මුදලක් වෙන් කර ඇත.
"ඩිජිටල් පුරාවිද්‍යාත්මක විශ්වකෝෂයක්" නිර්මාණය කිරීම.	මුදල් වෙන් කිරීමක් සිදු කර නොමැත.
ජාතික වැදගත්කමකින් යුත් ස්ථානවල පුරාවිද්‍යාත්මක අගයට හානියක් නොවන අයුරින් අදාල ස්ථානවල පොදු පහසුකම් සැලසීම.	සමස්ත රටම ආවරණය වන පරිදි පූජා ස්ථාන 20 ක පහසුකම් නංවාලීමට රු. මිලියන 75 ක් වෙන් කර ඇත. තව ද දුෂ්කර ප්‍රදේශවල විහාරස්ථානවල මූලික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම පිණිස පුරාවිද්‍යාත්මක සහ සංස්කෘතික මධ්‍යස්ථාන පුනරුත්ථාපනයට රු. මිලියන 50 ක අතිරේක මුදලක් වෙන් කර ඇති බව අයවැය කථාවේ සඳහන් වෙයි.
නිරවද්‍ය දැනුමින් හා තොරතුරුවලින් සන්නද්ධ සංචාරක මාර්ගෝපදේශකයන් සැපයීම සඳහා වැඩසටහනක් සැකසීම.	මුදල් වෙන් කිරීමක් සිදු කර නොමැත.
සංස්කෘතිය, සාහිත්‍ය හා කලාව	
වේදිකා නාට්‍ය රචනය/ අධ්‍යක්ෂණය සහ නිෂ්පාදනය පිළිබඳ කුසලතා වර්ධනයට පහසුකම් සැලසීම සඳහා නූතන තාක්ෂණයෙන් යුත් වේදිකාවක් ස්ථාපනය කිරීම. වේදිකා නාට්‍ය නිෂ්පාදකයන්ට බදු සහන සැලසීම. නාට්‍ය පුහුණු වීම් සඳහා පහසුකම් සැලසීම.	ජෝන් ද සිල්වා සමරු රඟහල, ජාතික කලා භවන, රන්මිනිතැන්න ටෙලි සිනමා ගම්මානය සහ ටවර් හෝල් රඟහල පුනරුත්ථාපනයට සහ ඒවායේ නඩත්තු කටයුතු වෙනුවෙන් රු. මිලියන 1,223 ක් වෙන් කර ඇත. එහෙත් දිස්ත්‍රික් මට්ටමින් පහසුකම් නංවාලීමට මුදල් වෙන් කර නොමැත.
ජාතික චිත්‍රපට සංස්ථාව නවීකරණය	ජාතික චිත්‍රපට සංස්ථාව නවීකරණය සඳහා රු. මිලියන 75 ක් - අයවැය විශේෂතා හි සඳහන් කර ඇත.
ඉහළ ප්‍රමිතියෙන් යුත් නිර්මාණශීලී චිත්‍රපට රජයේ අනුග්‍රහයෙන් සහාය දැක්වීම. පුද්ගලික අංශයේ ද සහයෝගය ඇතිව නවීන තාක්ෂණයෙන් යුත් චිත්‍රපට රසායනාගාරයක් ස්ථාපනය කිරීම. රටේ සිනමා ශාලා නවීකරණය.	මුදල් වෙන් කිරීමක් සිදු කර නොමැත.
පද රචකයන් සහ සංගීතඥයන් සඳහා කර්තෘභාග ගෙවීමේ ක්‍රමවේදය විධිමත් කිරීම.	මුදල් වෙන් කිරීමක් සිදු කර නොමැත.
සංගීත නිර්මාණකරුවන් හා ඔපෙරා නිර්මාණකරුවන්ගේ වෘත්තීයේ මූලික අවධිය සාර්ථක කර ගැනීම සඳහා රජයේ සහාය ලබා දීම. පරිපූර්ණ ශ්‍රව්‍ය දෘශ්‍ය රසායනාගාර ඉදි කිරීම සඳහා පුද්ගලික අංශයට බදු සහන ලබා දීම.	මුදල් වෙන් කිරීමක් සිදු කර නොමැත.
සාම්ප්‍රදායික නර්තන අංග නිර්මාණයට, ආරක්ෂා කිරීමට හා ප්‍රචාරණයට උපකාර කිරීම.	මුදල් වෙන් කිරීමක් සිදු කර නොමැත.
අගනගරයේ සහ දිස්ත්‍රික් මට්ටමින් සියළු පහසුකම්වලින්	මුදල් වෙන් කිරීමක් සිදු කර නොමැත.

2.10.2 වගුව: රජයේ ප්‍රතිපත්ති සහ 2021 අයවැය	
රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතාව	**වෙන් කිරීම් සහ නිරීක්ෂණ**
සමන්විත චිත්‍ර හා මූර්ති ප්‍රදර්ශන කලාගාරයක් ස්ථාපනය කිරීම. චිත්‍ර හා මූර්ති නිර්මාණ සංරක්ෂණයට සහ ප්‍රදර්ශනයට විශේෂ කෞතුකාගාරයක් පිහිටුවීම. සංචාරක ක්ෂේත්‍රය මඟින් කලා කටයුතු ප්‍රවර්දනය.	
"බලි තොවිල් සහ ශාන්ති කර්ම" ක්ෂේත්‍රයේ පවතින ගැටළු නිරාකරණය කර ඒවා විසඳාලීමට විශේෂ නියාමන ආයතනයක් ස්ථාපිත කිරීම සහ මෙම සාම්ප්‍රදායික කර්මාන්තය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සැපයීම සඳහා විධිමත් ක්‍රියාවලියක් හඳුන්වා දීම.	මුදල් වෙන් කිරීමක් සිදු කර නොමැත.
නීතිගරුක සහ සාධාරණ සමාජයක්	
යල් පැන ගිය නීති සංශෝධනය කිරීම සහ නව නෛතික පද්ධතියක් හඳුන්වා දීම. යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියේ ප්‍රමාදයන් මඟ හරවාලීම. විනිසුරුවරුන් හා උසස් නිලතල දරන්නන් පත් කිරීම සම්බන්ධයෙන් පරාදෘශ්‍ය යාන්ත්‍රණයක් හඳුන්වා දීම. අධිකරණ පද්ධතිය සහ ඒ හා සබැඳි ආයතනවල සම්බන්ධීකරණ කටයුතු වර්ධනය කිරීම උදෙසා ඩිජිටල් තාක්ෂණය භාවිත කිරීම. නීතිය බලාත්මක කිරීමේ ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම.	2020 වසරට සාපේක්ෂව අධිකරණ අමාත්‍යාංශය සඳහා වන ප්‍රාග්ධන වියදම් වෙන් කිරීම ඉහළ ගොස් තිබේ. ඒ නිරපේක්ෂ අගයක් හා සමස්ත වියදමේ කොටසක් ලෙසිනි. නීති ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් නංවාලීමට රු. මිලියන 6,000 ක මුදලක් ද නෛතික පද්ධතියේ කාර්ය මණ්ඩලය ඉහළ නංවා යටිතල පහසුකම් නංවාලීමට රු. මිලියන 20,000 ක මුදලක් ද වෙන් කර ඇත.
අපරාධ පාලනය	
පොලිසිය සඳහා නවීන ආම්පන්න ලබා දීම. අපරාධකරුවන්ට දේශපාලන සහාය හිමිවීම වළක්වාලීම සඳහා නියාමන යාන්ත්‍රණයක් ඇති කිරීම. බන්ධනාගාරවල සිටින අපරාධකරුවන් අධීක්ෂණය කිරීම සඳහා නවීන හා උසස් තත්ත්වයේ ආම්පන්න නිර්මාණය කිරීම. සුළු වැරදි සඳහා වැරදිකරුවන් වූ සිරකරුවන්ට පුනරුත්ථාපන මධ්‍යස්ථාන දෙකක් ස්ථාපිත කිරීම. විටින් විට බන්ධනාගාරගත කෙරෙන්නන් පුනරුත්ථාපනයට විශේෂ වැඩසටහනක් සැකසීම.	මහජන ආරක්ෂාව තහවුරු කිරීම සඳහා රු.මිලියන 2,500 ක් වෙන් කෙරේ. සංචාරක පොලිසිය හා අපරාධ මැඩලීමට විශේෂ පුහුණු කිරීම් ද ඊට ඇතුලත් වෙයි. නව බන්ධනාගාර ඉදි කිරීමට රු.මිලියන 225ක්, මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූ සිරකරුවන් සඳහා පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් ඉදි කිරීම සඳහා රු.මිලියන 50 ක් වෙන් කෙරේ.
රිය අනතුරු පාලනය	
පදික මං තීරු ඉදි කිරීම. සමීප රූප ආවේක්ෂණ කැමරා මඟින් සියළුම ප්‍රධාන මාර්ග අධීක්ෂණය. මාර්ග අනතුරු හේතුවෙන් සිදු විය හැකි මරණ හා ආබාධිත තත්ත්වයන් සඳහා සැලකිය යුතු වන්දි මුදලක් ලබා දීමට දැනට පවතින නීති වෙනස් කිරීම.	ඇවිදින මංතීරු හා පොදු පහසුකම් සඳහා රු.මිලියන 2,000 (රු.428)* ක් වෙන් කර ඇත. වාහන සහ මාර්ග නීති පිළිපැදීම නියාමනය කිරීම ඇතුළු මහජන ආරක්ෂාව තහවුරු කිරීම සඳහා රු. මිලියන 2,500 ක් වෙන් කර ඇත.

2.10.4 නිරීක්ෂණ හා නිගමන

වියදම් වෙන් කිරීම්වල වෙනස්කම් - කාලානුරූපීව හා ප්‍රමුඛතා අනුව රජයේ ඉලක්ක හා සැසඳෙන්නේදැයි තවදුරටත් ඇගයුමට ලක් කිරීමක් මෙම කොටසින් සිදු කෙරේ. අධිකරණ අමාත්‍යාංශය සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශයට අදාල ඉහත විශ්ලේෂණයට අනුව වැඩි කළ වියදම් හා මුදල් වෙන් කිරීම් මඟින් අදාල පිරිස්වල ශක්‍යතාවන් වර්ධනය ප්‍රතිපත්ති ප්‍රමුඛතාවල ප්‍රධාන අපේක්ෂාව වේ. අමාත්‍යාංශ දෙකේ අදාල පුද්ගලයන්ගේ හැකියාවන් වර්ධනය කිරීමට වෙන් කරන ලද මුදල් ඉහළ නැංවීමේ අපේක්ෂාව විශ්ලේෂණය කිරීම දුෂ්කර වන්නේ මෙම ඉලක්කය සපුරා ගැනීම සඳහා නිශ්චිතව එක් වෙන් කිරීමක් පමණක් සඳහන් කර කිබෙන බැවිනි. මහජන ආරක්ෂාව ශක්තිමත් කිරීමට අදාලව රුපියල් මිලියන 2,500 ක ප්‍රතිපාදනයක් වෙන් කර ඇති අතර කාර්ය මණ්ඩලයේ ශක්‍යතාවන් වර්ධනය කිරීමේ අංගයක් ද ඊට ඇතුලත් වෙයි. තව ද මහජන ආරක්ෂාව වෙනුවෙන් වන වියදම්වලින් හැකියාවන් වර්ධනය කිරීමට අදාල කොටස දක්නට නොලැබේ.

'විනයගරුක, නීතිගරුක සහ ගුණගරුක සමාජයක් සඳහා වන ප්‍රතිපාදන' යටතට අයත් වන අමාත්‍යාංශ සඳහා රජයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම්වලින් සිදු කළ වෙන් කිරීම් 2020 වසරේ සිට 2021 වසර දක්වා වූ කාලෙයේදී නාමික අගයන්වලින් වර්ධනයක් පෙන්නුම් කරන අතර අපේක්ෂා කිහිපයක් ද සඳහන් කරයි. රජයේ අයවැයේ සහ දළ දේශීය නිෂ්පාදිතයේ වියදම්වල කොටසක් ලෙස ද එවන් වූ ප්‍රවණතාවක් පෙන්නුම් කරයි. කෙසේ වෙතත්, ආංශිකව ගත් කල

2020 වසරට සාපේක්ෂව 2021 වසරේදී මෙම කොටස් සුළු වශයෙන් පහත වැටීමක් පෙන්නුම් කරයි. එනම්, පිළිවෙලින් 0.2% සහ 0.08% ක් ලෙසිනි.

ගුණගරුක සමාජයක් නිර්මාණය කිරීම උදෙසා විවිධ වූ ප්‍රතිපත්ති ප්‍රමුඛතා හඳුනාගැනීම සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති මාලාවේ අපේක්ෂාවයි. අධිකරණ අමාත්‍යාංශය, බුද්ධශාසන අමාත්‍යාංශය වැනි අමාත්‍යාංශ සඳහා ප්‍රාග්ධන වියදම් වෙන් කිරීම මැනවින් සිදු කර ඇති අතර එය රජයේ හඳුනාගත් ප්‍රතිපත්ති ප්‍රමුඛතා හා සමගාමී වෙයි. කෙසේ වෙතත්, පෙර වසරවලදී සත්‍ය වශයෙන්ම වෙන් කළ මුදල් අයවැය ඇස්තමේන්තුවට වඩා අඩු වීම හේතුවෙන් 2021 වසරේදී කළ වියදම් අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට ප්‍රමාණවත් නොවනු ඇත. තව ද බොහෝ අවස්ථාවලදී ප්‍රතිපත්තිමය යෝජනා සඳහා අවශ්‍ය වන වියදම් වෙන් කිරීමක් හෝ පැහැදිලිව සඳහන් කිරීමක් සිදු වී නොමැති අතර අයවැය ලේඛනවල පවත්නා අසමානතා රජයේ ප්‍රතිපත්ති සාක්ෂාත් කර ගැනීමට අදාල අයවැය 2021 විභවයන් පිළිබඳ අවිනිශ්චිත තත්ත්වයක් මතු කරයි.